# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.06.18

වර්ෂ 2019 ක් වූ ජුනි මස 18 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජුනි මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.05.21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.05.21 දින පැවති මහා සභා වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න නැත්නම් 2019.05.21 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය, මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019.05.21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.05.21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද මේ කාරණාව ගැන සඳහන් කරන්න ඕන. අපි ඉතාමත්ම කණගාටු වෙනවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සහ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් අද මේ කරපු දේ ගැන කණගාටු වෙනවා. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ආදාහනාගාරයක් අවශ්‍ය නෑ කියලා තමයි ඒ අයගේ අදහස. ඒක ගැන සභාපතිවරයා විදියට මම කණගාටු වෙනවා.

අනිත් කාරණාව අපේ සභාව සතු භූමියේ තාප්පයක් හදන එකට මේ අය විරුද්ධයි. ඒ වගේ මට්ටමක තියෙන ප්‍රාදේශීය සභාවක් මේ. ඒ ගැන සභාපතිවරයා විදියට මම කණගාටු වෙනවා. අයවැයෙන් රුපියල් ලක්ෂ 20 ක් මේ කාර්ය සඳහා වෙන්කරලා තියෙනවා. ඒකත් මේ වෙලාවේ සඳහන් කරන්න අවශ්‍යයයි. සභාව සතු දේපල ආරක්ෂා කර ගන්න අකමැති මන්ත්‍රීවරු මේ ඉන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ භූමිය පරීක්ෂා කරන්න සභාපතිතුමාත්, උපසභාපතිතුමාත් ගියා. ආදාහනාගාරයක් කියන්නේ අපිට අත්‍යාවශ්‍ය දෙයක්. එතන ඒක ඉදිකරන කොට යම් යම් විරෝධතා පැන නගින්න පුළුවන්. ඒක කොතෙක් දුරට සාධාරණද කියලා මම දන්නේ නෑ. ආදාහනාගාරය අවශ්‍යයි කියන මතයේ මම ඉන්නවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්තුතිවන්ත වෙනවා මම ඔබතුමාට.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අනෙකුත් මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි ඇත්තටම අද දවස ජීවිතයේ අමතක නොවන දවසක්. එක්සත් ජාතික පක්ෂයේ ඒ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු නවක මන්ත්‍රීවරු එකතු කරගෙන ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ කවදත් ඕනම වැඩකට අකුල් හෙලන ඒ මන්ත්‍රීවරු දෙපළක් එකතු වෙලා ජනතාව සුළු පිරිසක් කුපිත කරලා එකතු කරගෙන මේ සභා භූමියට ඇතුළු වෙලා ඒ කරපු නාඩගමට, රංගනයට ගරු සභාවේ බලය පිහිටි අපේ පක්ෂයේ පිළිකුල් සහගත හෙලා දැකීම මේ මොහොතේ මම කරනවා.

මොකද අපි මහජන නියෝජිතයෝ විදියට ජනතාව ඉදිරියට ගිහිල්ලා අපි යෝජනා දුන්නේ, ජනතාවගේ අදහස් ලබා ගත්තේ මේ බල ප්‍රදේශයේ සංවර්ධනය, සහජීවනය සහ සාමය වෙනුවෙන් කැපවෙනවා කියලා.

අද එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු නවක මන්ත්‍රීවරුන් එකතු කරගෙන, ජනතා විමුක්ති පෙරමුණේ හැමදේටම අකුල් හෙලන ඒ මන්ත්‍රීවරුත් එකතු කරගෙන ඒ නින්දිත දේශපාලනය පෙන්වා දුන්නා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව තුළ. හැබැයි අපි කණගාටුවෙනවා මේ වැඩපිළිවෙල තුළ හානිදායක ලෙස හැසිරීම ගැන. හැබැයි මම එක්සත් ජාතික පක්ෂයට කියනවා, ජනතා විමුක්ති පෙරමුණට කියනවා ඔය තුට්ටු දෙකේ වැඩ කරලා ගම්මානවල ඉන්න අහිංසක ජනතාව කුලප්පු කරලා මේ සභාවට ගෙනල්ලා අපේ වැඩපිළිවෙල පුංචිම විදියකටවත් නවත්තන්න බෑ කියලා. ගරු සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනා අපි ඒකමතිකව එකතැන ඉන්නවා අපේ වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා සමග. ඒ වගේ වැඩ මින් ඉදිරියටවත් නොකර ඉන්න. මම ඉතාමත්ම කණගාටු වෙනවා. යම් යම් අවස්ථාවන් වලදී මේ පක්ෂ දේශපාලනයේ ගුරුවරු වගේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු, වයසින් මුහුකුරා ගියපු මන්ත්‍රීවරු මේ තත්ත්වයට වැටීම ගැන. අපි ජනතාවට පොරොන්දු වුනේ මොකක්ද?. බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් අනිවාර්යයෙන් අවශ්‍යයි. මම දෙතුන් ගමනක් ඒ ස්ථානයට ගියා. ඒක සභාව සතු දේපලක්. සියලු මායිම් නිරවුල් කර ගත යුතුයි. සමහර ඉඩම් කොටස් පෞද්ගලිකරණය වෙලා. ගෙවල් දොරවල් ඉදිකරලා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ඒක නෑ කියනවා. මම එතනට ගියා. මිනින්දෝරුවෙක් ගෙන්නලා ඒ ඉඩම මැනලා මායිම් කණු දාලා ඒ ඉඩමේ අයිතිය සභාව සතු කර ගන්න හදන කොට තුට්ටු දෙකේ වැඩ කරනවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා. ඔබතුමා ගැන

කණගාටුයි. ඔබතුමා ඒ වගේ වැඩ කරන්න එපා. ඔබතුමා ඡන්දයෙන් පත්වුනේ නැනේ එක අතකින්. ඡන්දයෙන් පත්වෙලා ආවනම් ඔබතුමා ඔහොම කතා කරන්නේ නෑ මන්ත්‍රීතුමා. හැබැයි මහත්තයෙක් හැටියට ඉදලා අපිට මේක විසඳගන්න දෙන්න. අපිට බලය දීලා තියෙන්නේ ජනතාව. බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ කොට්ඨාශ 11 ක් අපි දිනුවේ ජනතාවට වැඩ කරන්න. මේ කරපු වැඩේට ආවේ නවක මන්ත්‍රීවරු එකතුකරගෙන ඒක හෙලා දකිනවා. මන්ත්‍රීවරුන්ගේ හෘද සාක්ෂිය මම දන්නවා. මේවා කළ යුතු දේවල් නෙමෙයි. බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් අවශ්‍යයි. බෝපෙ පෝද්දල මරණ අරගෙන ගිහිල්ලා අක්මීමන පුච්චන කොට අක්මීමන මිනිස්සු කොහොමද ඉවසන්නේ. බද්දේගමට ගිහින් මරණ පුච්චනකොට බද්දේගම මිනිස්සු කොහොමද ඉවසන්නේ. හැමදාම ඔය ප්‍රශ්නේ ආදාහනාගාරයක් හදද්දි තිබුණා. අක්මීමන ආදාහනාගාරය හදද්දි ප්‍රදේශයේ මිනිස්සු කුලප්පු කරපු බලු දේශපාලනයක් ක්‍රියාත්මක වුනා. ඒකට මුල්ගල් තියන කොට රිචඩ් පතිරණ මැතිතුමා කරපු ප්‍රකාශය මට අද වුනත් කියන්න පුළුවන්. ඒ නිසා මම ඕවා පිළිගන්නේ නෑ. බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් ඕන. ඒක අපි ස්ථිර ලෙසම ඉදිකරනවා. හැබැයි ඒක අපි ඉතාම නිවැරදි විදියට කරන්නේ. සභාපතිතුමා එක්ක අපි සියලු දෙනාම ඉන්නවා. සභාවේ මුදල් නැත්නම් බැංකු ණය මුදලක් අරගෙන හරි ජනතාවට පිළිගන්න පුළුවන් ආකාරයට බෝපෙ පෝද්දල ආදාහනාගාරයක් ඉදිකරන්න කියලා මම කියනවා. වැට මායිම් ගහන්නේ අපි සභාවේ දේපල ආරක්ෂා කර ගන්න. ඒ දේ කරන්න ගියාම මේ කරපු පහත් වැඩේ ගැන නැවත පිළිකුල් සහගතව හෙලා දකිනවා. මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සිදුවීම සම්බන්ධව ගරු උපසභාපතිතුමා දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කරා. ඒ පැහැදිලි කිරීමේදී අපේ පැත්තට විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ දිහාවට ඇඟිල්ල දික්කරලා සෘජුව විරෝධතාවය දැක්වූවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලනේ ඒක සංවිධානය කරේ. ඇඟිල්ල දික් කරන්න දෙයක් නෑ. ඒ දේ සංවිධානය කරේ ඔබතුමා. ඔබතුමා මට උගන්වන්න එන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමාට ඉවසීමක් නෑ. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මෙතන සභාපතිතුමා විදියට මූලාසනය මෙහෙයවන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා කෑ ගහනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බංකොලොත් දේශපාලනය ඔබතුමාලගේ. මාතෘකාවට අදාළව කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බංකොලොත් බව පේනවා. ඔහොම පොඩ්ඩක් ඉවසීමෙන් ඉන්න මම කියන්නම්. ගරු සභාපතිතුමනි, බොහොම පැහැදිලිව මේ ගරු සභාවේ පළමු සැසිවාරයේදීම පෝද්දල කොට්ඨාශය නියෝජනය කරන චමින්ද මන්ත්‍රීතුමා මේ සභාවට යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව ගෙනාවේ පෝද්දල ආදාහනාගාරයක් ඉදිකිරීම සම්බන්ධවයි. හරිම පැහැදිලිව ඒ මොහොතේ සභාවේ ගොඩක් මන්ත්‍රීවරු මේ ගැන කතා කරා. ඒ යෝජනාව සංශෝධනයක් සහිතව තමයි සම්මත වුනේ. සිට්‍රස් වත්තෙන් ගන්න යෝජනා කරපු ඉඩම අත්පත් කර ගෙන ආදාහනාගාරයක් හදන්න තමයි සම්මත වුනේ. එහෙම නැතුව මෙතන ආදාහනාගාරයක් හදන්න සම්මත වුනේ නෑ. ඒක බොහොම පැහැදිලියි. සභා වාර්තා අරගෙන බලන්න පුළුවන්. මේ පෝද්දල රජයේ ඉඩමට ආදාහනාගාරයක් ගෙනියන්න ඒ මොහොතේ සභාව එකඟ වුනේ නෑ. බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් හදන්න මේ මන්ත්‍රීවරු විසි දෙදෙනාම විරුද්ධ නෑ. ඒකමතිකව ඒකට එකඟයි. ඒ ගැන තර්කයක් නෑ කාටවත්. ප්‍රශ්නය තියෙන්නේ මේ පෝද්දල කන්ද ඉඩමේ සුසාන භූමියක් හෝ ආදාහනාගාරයක් හදන්න කතා කරන කොට එකම පදනම වුනේ මේ පෝද්දල කන්දේ මිහිදන් කරපු මරණ කීපයක් තියෙනවා කියපු එක. ඒ භූමිය මැනලා ඉවර වෙන කොට ඒ මරණ වලලපු ස්ථාන තියෙන්නේ සභාවට අයිති භූමියෙන් පරිබාහිරව. ඒවා එළියේ. මේක තාම සභාවට පවරා ගෙන නෑ. රජයේ භූමිය. එක සොහොනක්වත් නෑ මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ ඉඩම වටකරලා තාප්ප ගහනවට විරුද්ධ ඇයි. අබේසේකර මන්ත්‍රීතුමා විරුද්ධ වුනා, යසරත්න මන්ත්‍රීතුමා විරුද්ධ වුනා. මම අහන්නේ

ඇයි ඒ ඉඩමේ තාප්පය හදනවාට විරුද්ධ. මේ වෙනකන් මම කියලා නෑ මෙතන ආදාහනාගාරයක් හදනවා කියලා. ඇයි ඔච්චර දඟලන්නේ ඔබතුමාලා. තාප්පයක් හැදුවහම මොකද වෙන්නේ. ඒකට උත්තර දෙන්නකෝ අනවශ්‍ය දේවල් කියන්නේ නැතුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සභාවට අයිති වත්කම් ආරක්ෂා කරගන්න වැඩ කරනවාට මේ කිසිම සභිකයෙක් විරුද්ධ වෙලා නෑ.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් දැන් විරුද්ධ ඇයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැනුත් විරුද්ධ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් පහලදි කිවුවේ ඇයි තාප්පය හදන්න දෙන්නේ නෑ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතන තාප්පයක් හදන්න කලින් කරන්න තව වැඩ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කතාව වැඩක් නෑ නේ. අර මිනිස්සුන්ට සභාවේ ඉඩම් අල්ල ගන්න දීලා බලන් ඉන්නද මට කියන්නේ. මම සභාපතිවරයා විදියට එක ඉඩම් කෑල්ලක් බලෙන් අල්ල ගන්න දෙන්නේ නෑ කිසි කෙනෙකුට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා බලන්නකෝ ඒ ඉඩමෙන් රජයට කොයිතරම් ප්‍රමාණයක් අයිතිද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලන්නකෝ තව ටික දවසක් යනකොට කම්බි කණු ටිකවත් ඉතුරු වෙනවද කියලා. ඔබතුමා ලෑස්ති වෙන්නේ ඒකට. ඒකට සභාපතිවරයා විදියට මම ඉඩ දෙන්නේ නෑ. ඔබතුමා ලෑස්ති වෙන්නේ ඒ ඉඩම මංකොල්ල කන්න. සභාවේ දේපල විනාශ කරන්න මම ඉඩ දෙන්නේ නෑ. ඔබතුමාලා හැමදාම කරේ දේශපාලනය බංකොලොත් වෙන කොට කාගේ හරි ඇඟේ එල්ලිලා දේශපාලනය කරන එක. අද එක්සත් ජාතික පක්ෂයත් එක්ක ජනතා විමුක්ති පෙරමුණ එකට දේශපාලනය කරනවා බෝපෙ පෝද්දලදී දැක්කා. ඔබතුමාලා හැමදාම කරේ බංකොලොත් දේශපාලනය. සභාපතිවරයා විදියට මම කියනවා මේ සභාවේ දේපල මංකොල්ල කන්න මම ඉඩ දෙන්නේ නෑ. හැබැයි කොයිවෙලාවකවත් කියලා නෑ ඔය ඉඩමේ ආදාහනාගාරයක් හදනවා කියලා. ඇයි ඔය ඉඩම වටකරලා තාප්පයක් හදනවාට විරුද්ධ. ඔබතුමා සභාවේ දේපල ආරක්ෂා කරනවාට විරුද්ධ ඇයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ලබා දීපු කාලය ඉවරයි. න්‍යාය පත්‍රයට යනවා. ඔබතුමාට විනාඩියක කාලයක් ලබා දෙන්නම්. එක පක්ෂයකින් එක්කෙනෙකුට විනාඩිය ගානේ කාලය ලබා දෙන්නම්. මම තීරණය කරන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාලය ගැන සභාවේ බහුතරයෙන් අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලට ඕන සභාව කල් තියන්නද? එහෙමනම් සභාව කල් තියමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව කල් තියන්න එපා. මොකටද කල් තියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට විනාඩියක් ලබා දෙන්නම් අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** උප සභාපතිතුමාට කාලය අර තරම් ලබා දුන්නේ කොහොමද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ උප සභාපතිතුමා. ඔබතුමා මන්ත්‍රී කෙනෙක්. විනාඩියක් ලබා දෙන්නම් ඔබතුමාට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විරුද්ධ පක්ෂ වලටත් අවස්ථාව ලබා දිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්න. මට බලයක් තියෙනවා කාලය ලබා දීම පිළිබඳව. ඔබතුමා දැන් කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අහන් ඉන්න ඉස්සෙල්ලා කියන දේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අහගෙන ඉන්න කියන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මොනවද කියන්නේ. ඉන්න පොඩ්ඩක්. සංයමයක් නෑ. ඉවසීමක් නෑ. විනයක් නෑ. ගරු සභාපතිතුමා මූලාසනයේ ඉන්න කොට ඉවසීමෙන් කටයුතු කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න. මට ඉගෙන ගන්න ඔබතුමා කියන්න ඕන නෑ. ඔබතුමා කවුද මට කියන්න. කියන්න දැන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට බාධා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට හරියටම විනාඩියක් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක ඔව්, නෑ, බෑ තරඟයක් නෙමෙයි විනාඩියෙන් උත්තර දෙන්න. මොකක්ද මේ විකාරය. විනෝද සමය වගේ. පොඩ්ඩක් ඉඩ දෙන්න. අපිටත් කතා කරන්න අවශ්‍යයි. මට සෘජුවම චෝදනා එල්ල කරා අපි එකතු වෙලා මේක කඩාකප්පල් කරනවා කියලා. ඒ නිසා මට උත්තර දෙන්න අවස්ථාව තිබිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං කියන්න ඔබතුමා දැන් විනාඩි දෙකක් විතර මොනවද කිවුවේ. කියපු දේ මට කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමුන්නාන්සේ පස්සේ අහගන්න මම කියපු දේ මොකක්ද කියලා. ඒ නිසා කරුණාකරලා ඉවසන්න. මේ රජයේ ඉඩම කවුරුවත් බලහත්කාරයෙන් අත්පත්කරගෙන නෑ. රජයේ මිනින්දෝරුවා හරහා මිනුමක් ඇඳලා පැහැදිලිව වෙන් කරලා තියෙනවා. ඒකේ භූමි ප්‍රමාණය අඩු වෙලා තියෙනවා කියලා කොහේවත් සඳහන් වෙලා තියෙනවාද?. එහෙම නෑ. මිනිස්සු ඒක බලෙන් අත්පත් කරගෙන නෑ. ඒ ඉඩම මැන්නම අවට ඉඩම්වල අයට වැඩිපුර ඉඩම් ප්‍රමාණයක් ලැබුණා රජයේ ඉඩමෙන්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා ඒ ගැන අදහස් දක්වන්න ඔබතුමාට කාලය ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ අභූත චෝදනා ප්‍රදේශයේ ජනතාවට නගන්නේ තමන්ගේ ගැලවීමට. එහෙම කවුරුවත් බලහත්කාරයෙන් අත්පත් කරගෙන නෑ. ඒ මිනිස්සුන්ගේ යෝජනාව මේ ඉඩම සංවර්ධනය කරලා ගමට ප්‍රජාව සංවර්ධනය වෙන විදියේ වැඩපිළිවෙලක් සකස් කරන්න. ආදාහනාගාරයක් හරි සුසාන භූමියක් හරි හදන්න නම් ඒකට පදනමක් තියෙන්න ඕන. ඒ භූමියේ තාම එක මරණයක්වත් වලදාලා නැත්නම් ඒ භූමිය සුසාන භූමියක් විදියට නම්වෙලා තිබුණා හෝ නැතත් ඒක සුසාන භූමියක් විදියට පාවිච්චි කරලා නෑ. අවට සුසාන භූමි තියෙනවා. දැන් සුසාන භූමිවල මරණ මිහිදන් කරන්නේ අධිකරණ තීන්දුවකින් හෝ වෙනත් ප්‍රශ්නයක් නිසා අවස්ථාවක් ආවොත් විතරයි. නැත්නම් අනිත් ඔක්කොම ආදාහනාගාර වලට ගෙනියනවා. ආදාහනාගාරයක ගැටළුවක් මේ සභාවට තිබුනේ නෑ. ඒ යෝජනාව කවුරුත් ඒකමතිකව සභා සම්මත කරා. ඒකේ ගෞරවය ඒ මන්ත්‍රීතුමාට යාවි ඒක හදන වෙලාවට. ඒක හදන්නේ පෝද්දලද, හපුගලද, කියන එක අපිට අදාළ නෑ. සුදුසු ඉඩමක් අරගෙන ඒ භූමියේ ඒ කටයුත්ත කරන්න. ඒකට විරෝධතාවයක් කාගෙන්වත් නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි මෙතන අනවශ්‍ය ගැටුම් හදන එක නතර කරන්න. පෞද්ගලික කෝන්තර පිරිමහන එක නතර කරලා ඒ භූමිය සභාවට පවරා ගෙන වැඩ කරන්න. ඒ යුතුකම ඔබතුමාට තියෙනවා. ඒ වගකීම පෝද්දල කන්දේ ඉඩමට විතරක් නෙමෙයි මේ බලප්‍රදේශයේ සභාවට අයිති අනෙක් ඉඩම් වලටත් අදාලයි.

( ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මම අහපු දේට උත්තර දෙන්නකෝ. ඇයි ඒ ඉඩම වටකරලා තාප්ප ගහනවාට විරුද්ධ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ඉඩමේ බොහොම හදිසියෙන් මායිම් කණු ඉන්දලා වැටක් ගහලා වෙන් කර ගත්තට කිසි ප්‍රශ්නයක් නෑ. ඒ ඉඩම ආරක්ෂා කර ගැනීම ඔබතුමාගේ වගකීම. ඔබතුමා තාප්පයක් ගහන්න කලබල වෙන්නේ ඇයි. ඊට වැඩිය ලක්ෂ ගණන් කෝටි ගණන් වටින බඩු භාණ්ඩ මේ කාර්යාලයේ තියෙනවා. ඒ තාප්පය ගහන්න කලබල නැත්තේ ඇයි. ඔබතුමාලා මේ මුඩු බිමට තාප්ප ගහන්න කලබල ඇයි කියන එක තමයි අපිටත් ප්‍රශ්නේ. මුඩු බිමේ මොනවා ආරක්ෂා කරන්නද?. බිම ආරක්ෂා කරන්නද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා පුද්ගලිකව ඉඩමක් ගත්තොත් ඉස්සෙල්ලම කරන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පරිභෝජනය කරන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩමේ මායිම් ලකුණු කර ගන්නේ නැත්ද?. මන්ත්‍රීතුමා කබරගොයා තලගොයා කර ගැනීමේ න්‍යායෙන් ඔබතුමාලා ක්‍රියාත්මක වෙන්නේ. හැම වෙලාවෙම ඔබතුමාලා කොරහේ කිඹුල්ලු දැකලා, කබරගොයා තලගොයා කර ගන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමුන්නාන්සේලා කරන වැඩ වලට කොරහේ නෙමෙයි මූඩියෙත් දකීවි කිඹුල්ලු. ඒක නිසා කරුණාකරලා අපි කියපු යෝජනාව, සභාවට කරපු යෝජනාව සම්මත වෙලා තියෙන්නේ. පෝද්දල කන්දේ ඉඩම ආරක්ෂා කර ගන්න ඕන. අපිත් කියන්නේ ඒක. ඒක ඔබතුමාගේ වගකීමක්. හැබැයි මේ අනිත් අවස්ථා ඔක්කොම තියෙද්දි තමුනාන්සේ ඇයි පෝද්දල කන්දේ හිස් ඉඩම ආරක්ෂා කරන්න තාප්ප ගහන්නේ. ඒකයි අපිට තියෙන ගැටළුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අද ඊයේ කලබල වෙන්න දෙයක් නෙමෙයි. අයවැයෙන් පවා සල්ලි වෙන්කරලා තිබුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා අදාළ ප්‍රශ්නයට තාර්කිකව උත්තර දෙන්නේ නැතුව වටේ යන්න එපා. මම අහන්නේ මෙච්චර වත්කම් තියෙන සභා භූමි ආරක්ෂා කර ගන්නේ නැතුව ඇයි හිස් ඉඩමේ තාප්පයක් ගහන්න යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වටේ මිනිස්සු ඒ ඉඩම අල්ල ගන්නවා. වටේ පිටේ මිනිස්සුන්ට ඒ ඉඩම අල්ල ගන්න ඔබතුමාලා වක්‍රාකාරයෙන් උදව් උපකාර කරනවා. ඒ ඉඩම අල්ල ගන්න දෙන්නේ නෑ මන්ත්‍රීතුමා මම කොහොමවත්. ඔය මායිම් කණුවත් තව සතියක් දෙකක් යද්දි නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නෑ වැරදියි. ඔබතුමා, ඔබතුමාගේ බල බප්‍රදේශයේ මිනිස්සු සැක කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට දේපල පිළිබඳ බොහොම තණ්හාවක් තියෙන්නේ. තැපැල් කාර්යාල ගිනි තිබ්බා. බස් ගිනි තිබ්බා. එහෙම අතීතයක් තියෙන ඔබතුමාලා මේ කරන්න හදන්නේ ඒක. ඔබතුමාලගේ හැමදේම තියෙන්නේ ඒකේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාලා ඔය බයිලේ කිය කිය හැමදාම ඉන්න ඕනද?. අපේ දේශපාලනය පිළිබඳ අපි භාවිතයෙන්ම ඔප්පු කරලා හමාරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලු දේපල විනාශ කරපු ඔබතුමාලා දැන් සද්භාවයෙන් කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඕවා බංකොලොත් තර්ක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මට විනාඩියක් කතා කරන්න අවශයයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි විනාඩියක් කතා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විනාඩියක් කියන්නේ විනාඩි දෙකක් විතර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විනාඩියක් කියන්නේ විනාඩි දෙකක් නෙමෙයිනේ. විනාඩියක් කියන්නේ විනාඩියක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේක ඉස්කෝලේ කථික තරඟය වගේ.

සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ඇත්තටම පෝද්දලට විතරක් නෙමෙයි. බෝපෙ පෝද්දලටම අදාළයි. බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් ඕන කියන එකට කිසි ප්‍රශ්නයක් නෑ. මේකට අපි ඔබතුමන්ලා අවුරුදු දහයක් පහළොවක් තිස්සේ හැප්පෙනවා. මම යෝජනා කරා සිට්ට්‍රස් වත්තෙන් අක්කර පහක් අරගෙන ආදාහනාගාරයක් සඳහාත් ගම් පුළුල් කිරීමටත් අරගන්න කියලා. නමුත් එකක් තියෙනවා ඒ අතරේ අපේ චමින්ද මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරයෙක් විදියට එතුමා උනන්දුයි. එතුමා ස්වාධීනව ගෙනාවා යෝජනාවක්. මේක බොහොම පැහැදිලි තැනකට ආවා. ඒක කෙරෙනව නම් ප්‍රශ්නයක් නැහැයි කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ ස්ථාවරයේ මම තාමත් ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වැඩක් තියෙන්නේ ගරු සභාපතිතුමා අපේ ඩඩ්ලි මන්ත්‍රීතුමා ගිහින් ගයන්ත කරුණාතිලක ඇමතිතුමා හම්බ වෙලා ඒ සිට්ට්‍රස් වත්තෙන් අක්කර පහක් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා කතා කරා. දැන් දවස් දෙකකට විතර කලින් සමෘද්ධි රැස්වීමකට ආපු වෙලාවේ කිව්වා අන්න ඔයගොල්ලන්ගේ වැඩේ හරි. ඒ වැඩේ කෙරෙනවා කිව්වා.

එතකොට බොහොම පැහැදිලිව ඒ තැන තියෙනවා. ඒක ගැන කතාවක් නෑ. මේක ගැන ලැජ්ජ වෙනවානම් ලැජ්ජ වෙන්න ඕන කවුරුවත් නෙමෙයි පාලන බලයේ දිගටම හිටපු අපි ඔබතුමන්ලා. මම දිගටම ගෙනාපු යෝජනාවක් තමයි මේක කරන්න ඕන කියන එක. නමුත් ආදාහනාගාරයක් හදන්න කවුරුවත් උනන්දු වුනේ නෑ. දැන් හරි චමින්ද මන්ත්‍රීතුමන්ලා උනන්දු වෙන එක හොඳයි. අපිත් ඒ හා සමානව දෙගුණයක් උනන්දුයි මේ වැඩේට. එකක් තියෙනවා මේ තදියමේ තාප්පයක් හදන්න එනකොට මිනිස්සුන්ට එනවා කුතුහලයක්. බලහත්කාරයෙන් හදන්න ගියේ. ඒක නිසා මේ කුතුහලය ඇවිත් තමයි  මිනිස්සු ආවේ. ඒක ජේ. වී. පී. එක පිට හරි යූ. එන්. පී. එක පිට හරි මේ ප්‍රශ්නය දාන එක ගැන වැරැද්දක් තියෙනවා. දේපල ආරක්ෂා කරන්න ඔබතුමාට අපි කොන්දේසි විරහිතව සහයෝගය ලබා දෙනවා. මම මේක මීට ඉස්සෙල්ලත් කිව්වා. අද වෙනකන් අපිට බැරිවුනා සභාවේ තාප්පය හදන්න. ඒක නැවත හිතලා අපි වැඩ කරමු. මම පසුගිය සභාවලත් යෝජනා ගෙනාවා. ගැමුණු මාවත ළඟ ඉඩම එක එක්කෙනා අල්ලා ගන්නවා. රත්න ශ්‍රී විජේසිංහ මැතිතුමාගේ ගේ ළඟ ඉඩම අල්ල ගෙන. මේ අපි ක්‍රියාත්මක වෙන්න ඕන දේවල්. මම මේක ගැන තව කතා කරන්නේ නෑ. ඇත්තටම ජනතාව කුපිත වෙච්ච දෙයක් වුනේ තාප්පයක් හදන්න ගියාම. ඒ විතරක් නෙමෙයි මම හිතන්නේ. ඉතාම වැරදි විදියට අයවැය යෝජනා වලට දාලා තිබුණා ආදාහනාගාරයේ තාප්පයේ ඉදිකිරීම කියලා. අදාහනාගාරයක් සභාවට ඇත්තෙත් නෑ. නැතුව තමයි ඒ යෝජනාව දාලා තිබුණේ. ඒක මම එදා නිවැරදි කරා. ඒ නිසා සභාපතිතුමනි ඔබතුමා මේක ගැන ඉක්මන් වුනා වැඩියි. සාධාරණ පිළිතුරක් දීලා ජනතාවත් එක්ක කතා කරන්න තිබුණා. මෙතන කොහොමත් එකක් තියෙනවා. ඇත්තටම ඉතා ඉක්මනින් ඒ කටයුතු ටික කෙරුණා. සියලුම මන්ත්‍රීවරු අපි එකතු වෙලා මේ කාර්යය කරමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ චමින්ද මන්ත්‍රීතුමා බෝපෙ පෝද්දල වෙනුවෙන් පුද්ගලික මතයක් නෙමෙයි, බෝපෙ පෝද්දලට ආදාහනාගාරයක් අවශ්‍යයි කියන මතයේ ඉඳගෙන ලොකු වැඩ කොටසක් කරා.

( ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි අගය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** රුපියල් තුන්දාහක මායිම් කණු එතුමාගේ වියදමින් දැම්මා. එතුමා පැහැදිලි කරාවි ඒක. ඉතිං සභාවක් හැටියට මේ කටයුත්තට සභාවේ අරමුදල් යොදවන්න වෙවි. එතුමාගේ පෞද්ගලික මුදල් වියදම් කරලා එතුමා සෑහෙන්න මහන්සි වුනා. අදාහනාගාරයක් බෝපෙ පෝද්දලට අවශ්‍යයි. පෝද්දල කන්ද වේවා, සිට්ට්‍රස් වත්ත වේවා ආදාහනාගාරයක් අවශයයි. අපි සභාවේ කතා කරපු පහුගිය කාලේ මේක ඉක්මනින් ක්‍රියාවට නගමු කියලා එකඟතාවයකට ආවා. මිනිස්සුන්ගේ විරුද්ධතාවයකුත් තියෙනවා. මටත් හම්බ වුනා ඒ සම්බන්ධව ලිපියක් මන්ත්‍රීවරුන්ට ලබා දීපු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ලිපියේ නිර්වචනය ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාගෙන්. ඒකේ නොදන්න දෙයක් තියෙනවානම් එතුමාගෙන් අහන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම අහන්නේ එතන ඒ ආදාහනාගාරය හදද්දි ළිං ජලයට හානි වෙනවානම් දඩල්ල, කුරුඳුවත්ත, බද්දේගම අදාහනාගාර හදද්දි ළිං ජලයට හානි වුනේ නැද්ද?.

දැන් එතකොට අපි එකින් එක ගමු. බද්දේගම ආදාහනාගාරය අවට ගෙවල් නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උදුල මන්ත්‍රීතුමා දැන් තාක්ෂණය දියුණුයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දැන් අපිට බැරිද මේ දියුණු තාක්ෂණය උපයෝගි කරගෙන මෙතන ආදාහනාගාරය හදන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාක්ෂණය දියුණුයි. ඒ හින්දා ආදාහනාගාරය හපුගල සුසාන භූමියේ හදන්න. හපුගල තමයි බල ප්‍රදේශයේ මැද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගේන්න පුළුවන්නම් ප්‍රශ්නයක් නෑ. දැන් තාක්ෂණය දියුණු නිසා මෙතන ප්‍රශ්නයක් ඇත්තෙම නැනේ ඔබතුමා කියන විදියට. ඇයි ඔයතරම් කලබල වෙන්නේ. සභාවේ ඉඩම ආරක්ෂා කරන්න සභාපතිවරයා උත්සාහ දරන කොට ඇයි මේ කලබල වෙන්නේ. සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් සභාවට පවරාගෙන මේක ආරක්ෂා කරන්න උත්සාහ කරන කොට ඇයි භූමිතෙල් ගෑවුන ගැරඬියෙක් වගේ ඔයගොල්ලෝ දඟලන්නේ. මට කියන්න තියෙන්නේ එකම දෙයයි. ඔබ දෙපල ඉතිං කවදාවත් මොනදේ ගෙනාවත් විරුද්ධයිනේ. ඒක හින්දා මේක මට අමුත්තක් නෙමෙයිනේ. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ මේ සභාවේ ගෙනාපු හැමදේටම විරුද්ධ වුන පක්ෂයක්. ඔබතුමන්ලා සභාවේ හොඳ දෙයක් කියලා උදවු කරපු එක දෙයක් මට කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ආදාහනාගාරයේ යෝජනාව සම්මත කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආදාහනාගාරයේ යෝජනාව සම්මත කරා. ඒත් කරන්න දෙන්නේ නැනේ. ඔබතුමා කියන එක හරි. ආදාහනාගාරයේ යෝජනාව සම්මත කරා. මම වගකීමෙන් කියනවා මේ මාධ්‍යයත් ඉන්න වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ මේ ආදාහනාගාරය මේ බෝපෙ පෝද්දල කොතනකවත් ඉදිකරන්න දෙන්නේ නෑ. කොතන හැදුවත් මෙතුමන්ලා මේ විරෝධතාවය ඉදිරිපත් කරනවා. උඩින් පෙන්වනවා අපි ආදාහනාගාරය හදන එකට එකඟයි කියලා. නමුත් කොතන හැදුවත් මෙතුමන්ලා විරුද්ධයි. ඒක මම වගකීමෙන් කියනවා. ඒක මම දන්නවානේ. හපුගල හදන්න ජනතා විමුක්ති පෙරමුණ එකඟද?. කෙලින් කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක බලප්‍රදේශයේ මධ්‍යයේ ඉදිකරනවා නම් වඩා සුදුසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ආදාහනාගාරය හපුගල හදන්න උත්සාහයක් ගන්න ඔබතුමා එකඟද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එකඟයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොටත් මෙතුමන්ලා වැඩේ පත්තු කරලා මිනිස්සුන්ව අවුලනවා. ඒක මම දන්නවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** හපුගල හදන්න ගියාම මේ වගේ ජන විරෝධතාවයක් ආවොත් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මෙතුමන්ලා ඒ ජන විරෝධය පැත්තේ. ඔතන පුළුවන්නම් හෙට ගිහින් කුලප්පු කරයි ආදාහනාගාරයක් හපුගලට ගේන්න හදනවා කියලා. එහෙම පක්ෂයක්. මෙතුමන්ලා යැපෙන්නේ ඒකෙන්. ඇත්ත කතාව ඒකයි. ජනතා විමුක්ති පෙරමුණ යැපෙන්නේ ඒකෙන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේ විදියට ගියොත් බෝපෙ පෝද්දලට කවදාවත් ආදාහනාගාරයක් හදන්න වෙන්නේ නැනේ. එක්කෝ වඩා සුදුසු භූමිය බලලා හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම දන්නවා සභාපතිතුමා තහින්නේ මේ ප්‍රශ්නයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක්සත් ජාතික පක්ෂයට මට පොදුවේ විවේචනයක් නෑ. නමුත් අද කරපු දේ වැරදියි. එක මන්ත්‍රීවරයෙක් තමයි මේක උසි ගැන්නුවේ. මම ඒක දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කිවුවේ ප්‍රේමලාල් අබේසේකරද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම කිවුවේ නෑ කාගෙවත්. හොරාට ඉස්සෙල්ලා කෙසෙල් කැන වැට පැන්නා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පෝද්දල කන්දේ ඉඩමට ගියපු මන්ත්‍රීවරු කියන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා හපුගලට ආදාහනාගාරය ගේන්න කියනවානම් ඒකට කුහක කමක් නැතුව මම මගේ සහයෝගය ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම තමයි රජයේ කන්දට පාර දාලා දුන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** පාරට තාර දැම්මේ කවුද?

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මෙතුමා කියනවානම් ඒ ඉඩම අල්ලගෙන නෑ කියලා, මම මිනින්දෝරු මහත්මියත් එක්ක ඒක ඔප්පු කරනවා. ගැටළුවක් ඇති නොවන විදියට මායිම් සුද්ධ කරලා ඒ සම්බන්ධව වැඩ කරේ. මම මේක හදන්න කියන්නේ මම මැරුණම පුච්චන්න නෙමෙයි. අවුරුදු ගාණක් දේශපාලනය කරපු නායකයෝ මෙතන ඉන්නවා. මේක ප්‍රාදේශීය සභාවට වෙන් වෙච්ච සුසාන භූමියක්. ඒක අත අරිනවා නම් මම කියන්නම්. එක පුද්ගලයෙක් ඉන්නවා ඒ ඉඩම ආසන්නයේම. මම නම කියන්නේ නෑ. ඔහුගේ ඉඩමට නඩුවක් තියෙනවා. ඒ නඩුව ඉවර වුනහම ඒ පුද්ගලයට ඕනේ ඒ ඉඩම කැබලි කරලා වෙන්දේසි කරන්න. එතුමා තමයි මේ කට කතා යවන්නේ. ළිං වහන්න වෙනවා. මිනී අළු එනවා කියලා. මේ බුද්ධිමත් ජනතාව ඒක ගැන දන්නවා. මම ආදාහනාගාර සෑදීමේ තාක්ෂණය ගැන හොයලා බැලුවා. දැන් තාක්ෂණය දියුණුයි. ඒ දුම ඩෝවර් සිස්ටම් එකකින් ඇදලා අරගෙන පොළව යට ටැංකියකට අරගෙන වතුර ස්ප්‍රේ කරලා නැන්පත් කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. ඇයි අපිට ඒක කරන්න බැරි. මෙතන ඔක්කොටම ඉස්සෙල්ලා ඇවිල්ලා තියෙන්නේ ඉරිසියාව සහ කුහකකම. බොහොම පැහැදිලිව කියන්නේ මම දේශපාලන තීන්දුවක් ගන්නවා සභාව තුළ මේ අත්‍යාවශ්‍යය කාර්යය ඉටු කරන්න බැරි වුනොත්. දේශපාලන තීන්දුවක් අරගෙන වෙනදා වගේ ජීවත් වෙන්න යනවා. බොහොම ආවේගශීලිව කතා කරන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු අද කරපු ක්‍රියාදාමය එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ එකතු වෙලා පෙළපාලි ඇවිල්ලා සභාව වෙනස් කරපු ආකාරය නින්දිත ක්‍රියාවක් බැවින් බොහොම පැහැදිලිව ඒක හෙලා දකිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව කතාව දැන් අවසන් කරනවා.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** රජයේ පාසල් වලට/ පාසල් ගොඩනැගිලි වලට සහ රජයේ ආයතනවල ගොඩනැගිලි වලට / පොදු ස්ථාන වලට / නව ගම්මාන වලට / මංමාවත් වලට , ජීවතුන් අතර සිටින ක්‍රියාකාරි දේශපාලඥයන්ගේ නම් යෙදීම. (මහින්ද දේශප්‍රිය මයා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව)

මේ වගේ යෝජනා ඉදිරියේදී කරන්න එපා කියලා දැනුවත් කරන්න තමයි මේ ලිපිය ඉදිරිපත් කරේ.

**02.** නේවාසික කටයුත්තක් සඳහා පර්චස් 06 ක බිම් කොටසක් බදු දීම සඳහා විශේෂ අනුමැතිය ලබා ගැනීම. / ඒ. කේ. රංජී මයා (ප්‍රභාෂි සී. විදානපතිරණ මිය, සහකාර ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල)

මේකට සභා තීන්දුවක් ගන්න ඕන. ඒ වගේම නාගරික සංවර්ධන අධිකාරියෙන් අදහස් විමසලා තමයි මේ පිළිබඳ අන්තිම තීන්දුව ගන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ සිද්ධිය සම්බන්ධව මම දැනුවත්. මේ රංජි මහත්තයා ඉතාම අපහසුවෙන් තමයි මේ නිවස හදාගෙන ඉන්නේ. එතුමාට සාධාරණයක් ඉෂ්ට කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක වනක මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය නේද?.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ නිවස පිහිටලා තියෙන්නේ පෝද්දල කොට්ඨාශයයි, නරාවල කොට්ඨාශයයි වෙන්වෙන තැන. වනක මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයට අයිති. මේ සම්බන්ධව අවසර ලබා දෙන්න කියලා මම ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව ගැටළුවක් තියෙනවා. තවත් අය මේ වගේ ඉල්ලීම් කරොත් මොකක්ද ඇතිවෙන තත්ත්වය කියන එක. සභාව ඒ ගැනත් අවධානය යොමු කරන්න ඕන. ඒ කෙසේ වෙතත් වැරදි පූර්වාදර්ශයක් වෙයිද කියන එකත් ගැටලුවක් තියෙනවා. එහෙම නොවන ආකාරයට කටයුතු කරන්න ඕන. ඒ වගේම නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් අරගෙන ඒ තියෙන රෙගුලාසි අනුව තමයි අපිට ඉදිරියේදී ක්‍රියාත්මක වෙන්න සහා තීන්දුවක් ගැනීමේ වරදක් නෑ. නමුත් ක්‍රියාත්මක වීමේදී තව දීර්ඝ ක්‍රියාවලියකට යන්න වෙනවා.

ඒ ලිපිය අනුව 111/ජී මුලන බටහිර ග්‍රාම නිලධාරි වසමේ 301/1, මුලන, නරාවල පෝද්දල ලිපිනයේ පදිංචි අලවත්ත කංකානම්ගේ රංජි මහතා වෙත නේවාසික අවශ්‍යතාවයක් සඳහා මු.පි.ගා. 2507 පිඹුරේ කැබලි අංක 109 2/1 (පර්. 4.4 ක බිම් කොටස) දිගු කාලීනව බදු දීමට අප ප්‍රාදේශීය සභාවේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට යටත්ව පූර්වාදර්ශයක් නොවන පරිදි විශේෂ අනුමැතිය ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටසක් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම. (ඩබ්. ඩබ්. කරුණාරත්න මයා, ලේකම්, හොරයිසන් විව් මිතුරු හවුල, හොරයිසන් විව්, හපුගල, වක්වැල්ල.)

ඇත්තටම ඒ භූමිය තාම ප්‍රාදේශිය සභාවට පැවරීමක් කරලා නෑ. ද ෆිනෑන්ස් සමාගම සතුව තමයි දැනට අයිතිය තියෙන්නේ. වතුර මෝටරය සඳහා වෙන්කරපු ඉඩම් කෑල්ල ඒ හොරයිසන් වීව් ඉඩම වෙන්දේසි කරද්දි. දැන් වතුර මෝටරයක අවශ්‍යතාවය නෑ. දැන් නල ජලය ලබා දීලා තියෙනවා. ඒ ඉඩම් කෑල්ල අල්ලපු ඉඩමේ කෙනා ලබා ගන්න උත්සාහයක නිරත වෙලා ඉන්නවා. ඒ හින්දා සමිතියෙන් ඉල්ලීමක් කරනවා බදු පදනම මත හරි වෙනත් ක්‍රමයකට හරි ඒ ඉඩම් කෑල්ලේ තාවකාලික මඩුවක් හදාගෙන ඒ අයගේ බඩු භාණ්ඩ ආරක්ෂා කර ගන්න ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක නිකං තියෙන ඉඩමක් නම් සමිතියට පැවරීම නිසා බදු ක්‍රමය යටතේ සභාවට යම් ආදායමක් එනවා නම් ඒක සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

වටරැක නැගෙනහිර ග්‍රාම නිළධාරි වසමේ හොරයිසන් වීව් ව්‍යාපෘතියේ අප ප්‍රාදේශීය සභාව යටතට පත්කර ඇති ඩී. එල්. චන්ද්‍රරත්න මහතාගේ නිවස ඉදිරිපිට ඇති ජල මෝටරය සවි කර තිබූ ඉඩම් කැබැල්ල හොරයිසන් වීව් මිතුරු හවුලේ භාවිතයට තාවකාලික ගොඩනැගිල්ලක් සාදා පරිහරණයට යොදා ගැනීමට බදු දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 123/ඩී, බෙරලියදොළ ග්‍රාම නිලධාරි වසමට අයත් යුනිවර්සල්සිටි ළමා උද්‍යානය අසල පිහිටි ප්‍රාදේශීය සභාව සතු භූමියේ සේවා පියසක් ඉදිකිරීම. (ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ටෙක්ලා ගීගනගේ මැතිණිය, නො. 219, ඩාර්ලින්ටන් වත්ත, හපුගල, වක්වැල්ල)

ගමේ තියෙනවා සමිතියක්. ඒ සමිතියත් එක්ක සාකච්ඡා කරලා තීරණයකට එළඹෙන එක තමයි සුදුසු කියලා මට හැඟීමක් තියෙනවා. යුනිවර්සල්සිටි මිත්‍රත්ව සංසදය සමඟ සාකච්ඡා කරලා අපි තීරණයක් ගමු.

123/ඩී, බෙරලියදොළ ග්‍රාම නිලධාරි වසමට අයත් යුනිවර්සල්සිටි ළමා උද්‍යානය අසල පිහිටි ප්‍රාදේශීය සභාව සතු භූමියේ සේවා පියසක් ඉදිකිරීමට අදාළව එම ගම්මානයේ ඇති යුනිවර්සල් සිටි මිත්‍රත්ව සංසදය සමඟ සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණ ඉදිරියේදී තීරණයක් ලබා ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** වැලුව නාන තොටුපලට යන මාර්ගය අවහිර කිරීම සම්බන්ධව (චන්දන මානවඩු මයා ඇතුළු ගිංතොට, කුරුඳුවත්ත, වැලුව ගම්මානයේ ගම්වාසීන්)

වැලුව නාන තොටුපලට යන මාර්ගය අවහිර කිරීම සම්බන්ධව තාක්ෂණ නිලධාරි වාර්තාවක් අරගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-** නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** ප්‍රධාන කාර්යාලයේ ලේඛනාගාරය අලුතින් රාක්ක ගසා සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-**එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තොරතුරු පනත යටතේ අවුරුදු 15 ක ලේඛන ආරක්ෂිතව තියෙන්න ඕන. ඒ නිසා තමයි මේ යෝජනාව කරේ.

**02.** ඇක්සස් රියල් එක්ස්ටේට් ආයතනය විසින් හපුගල බටුවන්තුඩාව ප්‍රදේශයේ සිදු කරනු ලැබූ ඉඩම් වෙන්දේසිය සඳහා අවසර ලබා දීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවය සම්බන්ධයෙන් දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද පරීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ යෝජනාව මම දිගටම ගෙනාවා. ඒක ඉතාම වැදගත් දෙයක්. ඒ වගේම ගරු සභාපතිතුමනි බොහොම පැහැදිලිව මේ ඉඩමේ තියෙනවා නේවාසික පහසුකම් සඳහා නුසුදුසු කොටසක්. ඒ සම්බන්ධව ලිපිගොනු තියෙනවද නැද්ද මම දන්නේ නෑ. බොහොම පැහැදිලිව එන්.බී.ආර්.ඕ. ආයතනයෙන් දීපු වාර්තාවේ නිර්දේශ යටතේ තියෙනවා පළවන ඇමුණුමෙහි “A” ලෙස දක්වා ඇති බිම් ප්‍රදේශයේ සිදු කර ඇති අක්‍රමවත් සංවර්ධන කටයුතු නිසා බෑවුම් ස්ථායිතාවයට බලපෑම් සිදු වී ඇති බවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි මෙහෙම කරමු. ඉඩම් වෙන්දේසි සම්බන්ධව කමිටුවක් සකස් කරානේ. ඒ කමිටුව කැඳවලා අපි සාකච්ඡා කරමුද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එන්.බී.ආර්.ඕ. ආයතනය නුසුදුසුයි කියන එක මේ අයට සුදුසු වෙන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාළ ආයතන පරිසර කමිටුවට කැඳවන්නම්. ඔබතුමාලා එදාට සම්බන්ධ වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** දීර්ඝ කාලීන ණයගැති ශේෂ සම්බන්ධව විස්තර මේ වන විට සොයා ගත නොහැකි හිඟහිටි අක්කර බදු ගිණුම රුපියල් එක්දහස් එකසිය හතරයි ශත හතරයි, ණය ගැති ගිණුම රුපියල් තුන්දහස් එකසිය හතලිස් තුනයි ශත හැට තුන හා වෙනත් ආයතන තැන්පත් ගිණුම රුපියල් හයදාහයි. සභා ආදායමෙන් කපා හැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකේ නීතිමය තත්ත්වය මොකක්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව පළාත් පාලන කොමසාරිස්ට යවලා එයාගේ නිර්දේශ මත තමයි ක්‍රියාත්මක කරන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ වැඩ කටයුතු අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා දෛනික ගෙවීම් පදනම මත (වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකුගේ දෛනික ගෙවීම් පදනම මත) වැඩ ක්ෂේත්‍ර පරිපාලකවරයෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අලුතෙන් සේවකයෙක් බඳවා ගෙන පැරණි සේවකයන්ගෙන් වැඩ ගන්න අපහසුයි. මගේ යෝජනාව නම්, රජයේ ආයතනවල ප්‍රතිපත්තිය වන්නේ සේවකයන්ගෙන් පැරණිතම, ජ්‍යෙෂ්ඨතම සේවකයා තමයි වැඩ පරිපාලක විදියට පත් කර ගන්නේ. ඉස්සර තිබුණේ ආරච්චි කියලා. දැන් එනවා පරිශ්‍රපාලක කියලා. මේකේ ජ්‍යෙෂ්ඨයට ඒ අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා අපි කීප පාරක්ම උත්සාහ කරා. සාර්ථක වුනේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක වෙන්න බෑ සභාපතිතුමා. ජ්‍යෙෂ්ඨයට අවනත වෙන්නේ නැති අයගෙන් අලුතෙන් කෙනෙක් දාලා වැඩ ගන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එහෙම දාලා බැලුවා. ඒ අය අනිත් අය එක්කම තමයි වැඩ කලේ. එයා අනිත් අයට යන්න දීලා එයත් යන එක. ඒක තමයි දිගටම වුනේ. මෙතෙක් ඕක නවත්ත ගන්න බැරිව ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒක පත්කරන්න ඕන නාමිකව නෙමෙයි බලයක් එක්ක දෙන්න ඕන. තනතුරු පවරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලයක් එක්ක දීපු එකක්වත් ක්‍රියාත්මක වුනේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙම බොහොම පහසු විදියටද මේකේ සේවකයෝ වැඩ කරන්නේ. සභාපතිතුමාට, ලේකම්තුමාට සේවකයෝ අවනත නැද්ද?. අපි නියෝගයක් දුන්නා නම් ඉහළ ඉඳන් පහළට ඒක ක්‍රියාත්මක කරන්නේ නැති කෙනෙක් ඉන්නවා නම් එයාව වහාම සේවයෙන් ඉවත් කරන්න. අපි දන්න තරමින් යම්කිසි ආයතනයක සේවක මණ්ඩලයක වැඩ බලන්න සේවකයෙක් යොදවනවා නම් එතන ජ්‍යෙෂ්ඨයට තමයි ඒ අවස්ථාව ලබා දෙන්නේ. මම දන්නේ නෑ ඔබතුමා මොන පදනම මත මෙහෙම කෙනෙක් බඳවාගන්න යෝජනාව ඉදිරිපත් කරාද කියලා. ආයතනයේ ඉන්න ජ්‍යෙෂ්ඨයාට කරන හානියක් මේක. පිටින් අලුතින් කෙනෙක් අරගෙන පැරණි සේවකයන්ගෙන් වැඩ ගන්න යොදවන එක වැරදියි. ආයතනයේ ඉන්න ජ්‍යෙෂ්ඨයාටයි ඒ අවස්ථාව ලබා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගන්නේ ස්ථිර කෙනෙක් නෙමෙයි. කම්කරු කෙනෙක්ගේ දීමනාව දීලා වැඩ පරීක්ෂක කෙනෙක් ගන්නවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සභාව මේ අවස්ථාවේ මූල්‍ය අර්බුදයක තියෙන නිසා මෙතන ඉන්න සේවකයන්ගේ ජ්‍යෙෂ්ඨයව තෝරාලා එයාට මේ රාජකාරිය පවරන එක හොඳයි. ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ අදහස මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ පිළිබඳ ප්‍රශ්න කිහිපයක් තියෙනවා. ඇත්තට අපි පිටින් කෙනෙක් දානවා කියන එකේ තේරුම අපි දාන කෙනා ඒ කියන්නේ

එයා වැඩ කරන්නේ නෑ. එකේ තේරුම එයාව අධීක්ෂණය කරන්න ඉහළ ඉන්න අය, ඔබතුමා, කියන දේ අධීක්ෂණය කරන්න දැම්මම ඒක ක්‍රියාත්මක කරන්නේ නැත්නම් ඒකට ඔබතුමා තීන්දුවක් ගන්න ඕන. අපි ඉන්නවා ඒ තීන්දුවත් එක්ක.

ඊළඟට එකක් තියෙනවා මේකේ අද තියෙන්නේ සේවක අතිරික්තයක්. අද මේ සභාවේ අවංකවම තියෙන්නේ සේවක අතිරික්තයක්. මේ සභාවේ පහල ප්‍රධාන කාර්යාලයට ගිහින් බලන්න කී දෙනෙක් නිකං ඉන්නවද කියලා. ඒක පිළිබඳ ප්‍රශ්නයක් විගණනයක් යනවා ආණ්ඩුකාරතුමා ගනිපු වැරදි තීන්දුව මත. ආණ්ඩුකාරතුමාට එහෙම ගන්න බලතල නෑ. මොකක් හරි අසාධාරණයක් වුනොත් පුළුවන්. ගන්න ක්‍රමවේදයක් තියෙනවා. මේ ගනිපු වැඩ කරන අය සමග අපේ පෞද්ගලික අමනාපයක් නෑ. ඒක නරක පූර්වාදර්ශයක් වුනේ. මේ අතරේ තව කෙනෙක් බඳවා ගන්නවා කියන්නේ ප්‍රශ්නයක්. මෙතන තාවකාලිකව බඳවා ගනිපු එක සේවකයෙක්වත් ගිහින් තියෙනවද?. එහෙම ගිහිල්ලා නෑ.

දැන් මේ ඉන්න සේවකයන්ට ඉස්සරහට යන්න අවස්ථාවක් තියෙනවා කියලා, එයාලගේ ඔලුවේ මැවෙන්න ඕන අපි හොඳට වැඩ කරලා ඉහළට යන්න ඕන කියලා. මම ගරු සභාපතිතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලනවා මේ යෝජනාවට අපි බොහොම පැහැදිලිවම විරුද්ධයි. ඇත්තටම මේ ඉන්න කෙනෙක් නැත්නම් කාර්යාල දෙකෙන් දෙන්නෙක් යෝජනා කරන්න පුළුවන් වැඩ බලන්න. ඔබතුමාට ඒකේ ගෞරවයත් ඒවී. වැඩ කරන මිනිස්සුන්ට පොඩි ගෞරවයක් හිමිවෙනවා ඒකෙන්. මම නම් යෝජනා කරන්නේ ඒකයි. ගරු සභාපතිතුමනි ඔබතුමා නැවත වාරයක් හිතන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ස්ථිර සේවකයෝ කොන්ත්‍රාත් සේවකයෙක් යටතේ වැඩ කරන්නේ නෑ. රජයේ රෝහල්වල ඇටෙන්ඩන් හිටිය කෙනා තමයි ඕවර්සියර් වෙන්නේ. ඕවර්සියර් වැඩ කරනවානේ. ඒ අය හොඳට වැඩ කරගෙන යනවා. ඒ කාලේ නම් වැඩ නායකයෝ කියලා පත්කරගෙන හිටියේ. මැනලා දෙනවා කරන්න ඕන වැඩ ප්‍රමාණය. එහෙම සේවකයොන්ගෙන් වැඩ ගන්න පුළුවන්. අනිත් එක සේවකයෝ උනන්දු වෙනවා එතකොට. අපේ මිනිහෙක්ට තමයි උසස් වීම දීලා තියෙන්නේ කියලා. ඒ නිසා වැඩේ යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මමත් ඒ යෝජනාව සම්බන්ධව අදහස් දක්වන්නම්. වඩා සුදුසුයි වැටුපක් ගෙවලා තව කෙනෙක් බඳවා ගන්නවා වෙනුවට දිරිමත් කරන්න දීමනාවක් ගෙවලා ඉන්න කෙනෙක්ව ඒ අධීක්ෂණ තත්ත්වයට පත් කරන එක. නැත්නම් පැරණි වැටුපම දීලා වැඩ භාර දුන්නම මිනිස්සු දිරිමත් වෙන්නේ නෑ. සාධාරණ දිරි දීමනාවක් එකතු කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතනවා පෝද්දල උප කාර්යාලයෙන් නම් ඒ සඳහා සුදුසුම ලලිත්. මේ කාර්යාලයෙන් සේවකයෙක් යෝජනා කරන්න. මේකෙත් ඉන්නවානේ ගොඩක් සේවකයෝ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාවේ සියලු දෙනාගේ මතය අනුව ඒ ආකාරයට ජ්‍යෙෂ්ඨ කම්කරුවෙක් යොදවලා බලමු. ඒ සම්බන්ධව අපි ඉදිරියේදී හරියටම තීන්දුවක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැටළුවක් නෑ. දැන් අපි තීරණය කරන්න ඕන නෑ කවුද පත්කරන්නේ කියන එක. අපි ඒක වෙනම තීරණය කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය දන්නේ වැඩ කරන පිළිවෙල. ඒ අනුව පැරණිම ජ්‍යෙෂ්ඨ කණ්ඩායම එක්ක ඔබතුමා සාකච්ඡා කරලා ඒ තනතුරට කෙනෙක් පත් කරන්න. නීතිමාලාවක් එක්ක ඒ තනතුර දෙන්න. කට වචනෙට පත් කරලා හරියන්නේ නෑ. ඒ අනුව, ක්‍රියාත්මක විය යුතුයි. සභාවේ අපි බැඳී ඉන්නවා ඔබතුමා එක්ක ඒ තීන්දු තීරණ සම්බන්ධව. යම් කෙනෙක් ඒ නීති පිළිපදින්නේ නැත්නම් එයාට කරන දඬුවම අපිට ඉදිරියේදී බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට අපි ඒ පත්කරන කෙනාට තනතුරක් නම් කරලා දෙනවාද?. වැඩ ක්ෂේත්‍ර පරිපාලකද?, වැඩ නායකද? එතකොටනේ වගකීමක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම හිතන්නේ අපි නම් කරනවා නම් කවුරුහරි ඒකේ කිසි වැරැද්දක් නෑ. සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට කැමැත්ත පරිදි යම් කෙනෙක් වැඩ කරන්න ඕන නේ. ඒ වැඩ කරන කෙනෙක් ඉන්නවා නම් කවුරුහරි, අබේසේකර මන්ත්‍රීතුමා ලලිත්

කියන නම යෝජනා කරා. එතුමා වැඩ කරනවා කියලා විශ්වාසයක් තියෙනවා නම් සියළු මන්ත්‍රීවරුන්ට, ඒක සුදුසුයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ජ්‍යෙෂ්ඨත්වය වගේම පැමිණීමත් බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි සාකච්ඡා කරලා තීරණය කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක එහෙම බලන්න කියලා අපි ඉල්ලීම් කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැනට මේ සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුර සඳහා නිලධාරියෙක් පත් කරලා තියෙනවාද?. ඒ සම්බන්ධව සභාවේ යෝජනාවක් සම්මත කරලා තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා යෝජනාවක් හරහා දැන් පත්කරපු නිලධාරිණියට බලය පැවරීමක් ගත්තා චෙක්පත් අත්සන් කිරීම සඳහා. මේ සම්බන්ධව ලේකම්තුමාට සභාව දැනුවත් කරන්න මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- සභාවේ පරිපාලන කටයුතු සහ මූල්‍ය කළමනාකරණ කටයුතුවල බලතල ලේකම්ට පැවරී ඇති බව.
- ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුරට සේවා අවශ්‍යතාවය මත තාවකාලික පත්කිරීමක් සිදු කළ බව.
- I ශ්‍රේණියේ කළමනාකරණ සහකාර නිලධාරියෙක් සභාවේ සේවයට පැමිණි විට මෙම ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුර එම නිලධාරියාට ලබා දෙන බවට අදාළ නිලධාරිණිය සමඟ එකඟතාවයකට පැමිණි බව.
- I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර නිලධාරීන් සභාවේ දැනට සේවය නොකරන බව.
- අධීක්ෂණ මට්ටමේ තනතුරකට නිලධාරියෙකු පත් කරන විට සලකා බලන සුදුසුකම්
- අදාළ පත්වීම සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා බව
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ පත්කිරීම සම්බන්ධයෙන් ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

<u>ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 05.** වක්වැල්ල කොට්ඨාශයට සවි කිරීමට නව වීථි පහන් කට්ටල 40 ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 06.** නව සවිකිරීම් සඳහා වීථි පහන් කට්ටල 60 ක් ගෙන ඒමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 07.** ගොඩකන්ද සේවා පියස භූමියේ ආරක්ෂිත වැට ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගොඩකන්දේ සේවා පියස තියෙන ඉඩම කාගේද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ ඉඩම

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතකොට ප්‍රාදේශීය සභාවේ ඉඩමෙද සේවා පියස හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔව්. ප්‍රාදේශීය සභා ඉඩමක සේවා පියස හදලා තියෙන්නේ. පර්චස් 40 ක් තියෙනවා මුළු ඉඩම. ඒකෙන් පොඩි භූමි ප්‍රමාණයක තමයි සේවා පියස හදලා තියෙන්නේ. තව පර්චස් 33 ක විතර භූමියක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 08.** පසුගිය කාලය තුළ සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක නොවීමට බලපෑ හේතු පිළිබඳ වාර්තාවක් ලබන මස මහා සභාවට පෙර ලබා දෙන මෙන් යෝජනා කරමි. (මාර්ග/ඉදිකිරීම්/සංවර්ධන යෝජනා හැර)

මගේ යෝජනා වලින් නොකෙරුන ටික මම ඉල්ලන්නේ. මට ඉල්ලන්න තියෙන්නේ එපමණයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට ඒක ඉල්ලන්න අයිතිය තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 09.** සභාව සතු පොදු ළිං පිහිටි සියලු භූමියන්ගේ ආරක්ෂිත වැට ඉදිකර සභාවේ අයිතිය ප්‍රදර්ශනය කිරිමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 10.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ කලේගාන කාර්යාලය සහ පෝද්දල උප කාර්යාලයේ සේවක මහත්වරු තිස්පස් දෙනෙක් පමණ සේවය කරනු ලබයි. ඉන් පහළොස් දෙනෙක් කසල එක්රැස් කිරීමේ කටයුතු වලට යොමු කොට ඉතිරි විසි දෙනා මාර්ග සහ කාණු ශුද්ධ පවිත්‍ර කිරිමේ කටයුතු සඳහා එක් දිනකට කොට්ඨාශ වෙත කම්කරු මහත්වරු දස දෙනෙකු බැගින් යෙදවූ විට එක් කොට්ඨාශයක් සඳහා මසකට දින හතර බැගින් සේවා කටයුතු සඳහා කම්කරු මහත්වරු යෙදවීමට හැකි වේ යැයි යෝජනා කරමි.

මේ යෝජනාව කර ගන්න පුළුවන්කම තියෙනවානම් සියළුම මන්ත්‍රීවරුන්ට සහ මන්ත්‍රීවරියන්ට ප්‍රයෝජනවත් වේවි. සේවක මහත්වරු පනස් දෙනෙක් විතර ඉන්නවා කියලා අපිට සංඛ්‍යා ලේඛන ලැබිලා තියෙනවා. ඒ පනහෙන් තිස් පස් දෙනෙකු පමණ ව්‍යාපෘතිවල වැඩ කරනවා. එයින් විස්සක් පමණ තමයි මම බලාපොරොත්තු වුනේ කසල කම්කරුවන් විදියට කාණු ශුද්ධ කිරීම, පාරවල් ශුද්ධ කිරීම සහ වෙනත් කටයුතු සඳහා යෙදවීමට. ප්‍රිමික්ස් ව්‍යාපෘතිය පහුගිය කාලේ තිබුණේ නෑ. ඒක දැන් නැවත ක්‍රියාත්මක වෙනවා. එතනදී ප්‍රීමික්ස් ව්‍යාපෘතියට පස් දෙනෙක් ගියාම තව පහළොස් දෙනෙක් ඉන්නවා. මම බලාපොරොත්තු වුනේ විසි දෙනෙක්. එතකොට බෙදන්න පුළුවන් කොට්ඨාශ දොළහේ වැඩ වලට. කොට්ඨාශ දොළහ හය ගානේ දෙකට බෙදනවා. කම්කරුවෝ දහ දෙනා ගානේ අපිට යොදවන්න පුළුවන්. එතකොට එක මාසෙකට කොට්ඨාශයක් සඳහා කම්කරුවෝ

ලැබෙනවා. එක කොට්ඨාශයකට එතකොට හතර වතාවක් අවස්ථාව ලැබෙනවා. සෙනසුරාදා, ඉරිදා අතඇරලා මේක හැදුවේ.

ඒ අනුව බලාපොරොත්තු වුනේ වෙන දෙයක් නෙමෙයි. අපිට දැන් ඇත්තටම ප්‍රාදේශීය සභාව තුල වැඩ කිරීමේ අපහසුතාවයක් තියෙනවා. දැනට පවතින රජයෙන් ගම්පෙරලිය වගේ විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. අපි ඒකට කැමතියි. අපිට ප්‍රාදේශීය සභාවේ ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආණ්ඩුවෙන් ලැබෙන්නේ නෑ. අපි ඒක හින්දා බලාපොරොත්තු වෙනවා අඩු ගානේ පාරවල් ටිකවත් සුද්ද කරලා ඒ ගෞරවය මේ සභාවට ලබා ගන්න. ඒ නිසා තමයි මම මේ යෝජනාව ගේන්නේ. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. ඒක තමයි මගේ ප්‍රධාන ඉල්ලීම. අපිට ඒක බැරිවෙන එකක් නෑ. දැනට පහළොස් දෙනෙක් ඉන්නවා. තව එක්කෙනෙක් ගත්තත් අට දෙනා ගානේ බෙදන්න පුළුවන්. එහෙම කරොත් මේ කාරණය ඉෂ්ට කරන්න පුළුවන්. අපි බලාපොරොත්තු වෙනවා මන්ත්‍රීවරු කතා කරලා මේ ගැන තීරණයක් ගනී කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

දැනට ඉන්න කම්කරු මහත්වරු පිළිබඳව විස්තර ලබා දීලා ඇති. මුළු කම්කරුවන් සංඛ්‍යාව පනස් දෙනෙක්. ඒ පනස් දෙනාගෙන් දහහතර දෙනෙක් ප්‍රධාන කාර්යාලයේත් උප කාර්යාලයේත් සේවය කරනවා. තිස් හය දෙනෙක් ඉන්නවා ඉතිරි සංඛ්‍යාව. ලබුදුව වෙළඳ සංකීර්ණයේ එක කම්කරුවෙක් සේවය කරනවා. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය සඳහා කම්කරුවෝ පස් දෙනෙක් යොදවලා තියෙනවා. කසළ එකතු කිරීම සඳහා කම්කරුවෝ දොලොස්දෙනෙක් යොදවනවා. වීථි පහන් නඩත්තුව සඳහා තව කම්කරුවෝ දෙදෙනෙක් යොදවලා තියෙනවා. එතකොට මුළු සංඛ්‍යාව තිස්පස් දෙනෙක් වෙනවා. තව පහලොස් දෙනෙක් ඉතුරුයි. අපි සේවකයන් දස දෙනෙක් වැඩිපුර ගත්තේ එක වැඩකට වැඩි සේවක ප්‍රමාණයක් යොදවන්න. මේ ඉන්න අයගෙන් අනිවාර්යයෙන් දෙතුන් දෙනෙක් නිවාඩු යනවා. අද හතර දෙනෙක් නිවාඩුයි. මේ හේතුව නිසා කම්කරුවෝ ප්‍රමාණය දෙකට බෙදලා වැඩ කරන්න අවස්ථාවක් නෑ. තව කෙනෙක් දැන් මෙතනින් වැඩ පරිපාලක කෙනෙක් විදියට අඩු වෙනවා. අද කලේගාන කොට්ඨාශයට ලබා දීලා තියෙන දවස. අද යොදවන්න වුනේ කම්කරුවෝ හය දෙනයි.

කසළ ව්‍යාපෘතියේ යෙදිලා ඉන්න අය නිවාඩු ගත්තම මේ අය තමයි යොදවන්න වෙන්නේ. මේක අපි ඉදිරියේදී අපේ කාඩර් එක වැඩි කර ගත්තම බලමු මොකද කරන්න පුළුවන් කියලා. දැනට මේ තත්ත්වයෙන් තමයි යන්න වෙන්නේ. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ඉදිරියේදී දිගටම ක්‍රියාත්මක කරනවා. රියදුරෙක් අළුතෙන් බඳවා ගත්තා. යකඩ ප්ලේට් දෙකක් මිලදී ගත්තා. ට්‍රැක්ටරයක් ඒ කාර්ය සඳහා වෙන් කරා. එතනට කම්කරුවෝ පස් දෙනෙක් අනිවාර්යයෙන් යොදවන්න ඕන. දැනට අපි මේ තත්ත්වයෙන් ඉදිරියට ගිහින් බලමු.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 11.** බෝපෙ පෝද්දල බලප්‍රදේශය තුල ගිංතොට ප්ලයිවුඩ් කර්මාන්ත ශාලාව මෙම ප්‍රදේශයේ තිබූ ඉතා විශාල කර්මාන්ත ශාලාවකි. නමුත් පහුගිය කාලය තුල මෙම කර්මාන්ත ශාලාව වසා දමා එම ඉඩම වෙනත් පාර්ශවයකට විකුණා හෝ පවරා දී එම ඉඩම වෙන්දේසි කිරීමට කටයුතු කරන බවට දැන ගැනීමට ඇත. එම ඉඩම වෙන්දේසි කිරීම නවතා වෙනත් කර්මාන්තයක් හෝ සුදුසු කාර්යයකට ලබා ගැනීමට යෝජනා කරමි.

ඔබතුමාලා දන්නවා දීර්ඝ කාලයක් ගිංතොට ප්‍රදේශයේ ප්ලයිවුඩ් කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වුනා. මේ තුනිලැලි සංස්ථාව කිවුවම ගිංතොට, කලේගාන, වටරැක, හපුගල, පිටිවැල්ල, බූස්ස යන සියලු ප්‍රදේශවල දහසකට වැඩි ප්‍රමාණයක් ඒ කාලේ මේ කර්මාන්ත ශාලාවේ වැඩ කරා. නමුත් අද වෙනකොට එම කර්මාන්ත ශාලාව වැසී ගිහිල්ලා තියෙනවා කුමන හෝ හේතුවක් නිසා. මම කියන්න යන්නේ වෙන මුකුත් නෙමෙයි. ඒ ප්‍රදේශයේ අපි දේශපාලන කටයුතු වල නිරත වෙද්දිත් ආපු ඉල්ලීම නිසයි මේ යෝජනාව කරේ. මන්ත්‍රීතුමා තුනී ලෑලි සංස්ථාව තියෙන ඉඩම අපිට බේරලා දෙන්න, වෙනත් කර්මාන්ත ශාලාවක් හරි ඒ භූමියේ ඉදිකරන්න කියලා අපිට ඉල්ලීම් ආවා. මොකක් හරි රජයේ ආයතනයක් ඉදිකරන්න ඕන එම ස්ථානයේ. අද රැකියා විරහිත මිනිස්සු ගොඩක් ඉන්නවා. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා මේ ප්‍රදේශයට තිබුණ අයිතිවාසිකම් ගිලිහී යන නිසා නැවත වතාවක් ඒක රඳවා ගන්න. ඔබතුමාලා දන්නවා ඇති අපේ දෙමව්පියෝ ඉන්න කාලේ සිමෙන්ති ෆැක්ටරිය, තුනී ලෑලි ෆැක්ටරිය වගේ ආයතනවල වැඩ කරන අයට තමයි හොඳ පාපැදියක් තිබුණේ. ඒ අය ඒකෙන් තමයි රැකියාවට ගියේ. ප්ලයිවුඩ් එකේ වැඩ කරනවා කිවුවම

හිරයක් දෙන්න වුනත් කැමතියි. ඒ කිවුවේ ගැණු ළමයෙක්ව කසාද බඳින්න දෙන්න වුනත් කැමතියි ඒ කාලේ. එහෙම අවස්ථාවක් තිබුණ තැනක් තමයි ප්ලයිවුඩ් ආයතනය. මේ ව්‍යාපෘතිය කඩාකප්පල් කරලා රාජ්‍ය දේපල විකිණීමේ වැඩපිළිවෙලකුත් එක්ක යන්නේ. රටක් වශයෙන් නොවුනත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන දේ හරි ආරක්ෂා කර ගැනීම පෙරදැරි කරගෙන තමයි මම මේ යෝජනාව ගේන්නේ. සභාවේ සියලු දෙනාගේ සහයෝගය මේ කාර්යය සඳහා ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ කාර්යය අපි කරන්න ඕන. බෝපෙ පෝද්දල ජනතාවට හා ඒ අවට ජනතාවට යම්කිසි සහනයක් ලබා දීමට මේ ඉඩම නැවත පවරාගෙන හෝ මේ කාර්ය ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලිනුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ මේ ඉඩම 99 අවුරුදු බද්දට ලබා දීලා තිබුණේ. වර්තමානයේ ඒ දේ තවත් නිවැරදි කරලා දුන්නා. සම්පූර්ණ ඉඩමම සින්නක්කරව වර්තමාන ආණ්ඩුවෙන් අදාළ පුද්ගලයාට නිදහස් කරලා තියෙනවා. ඔන්න එක්සත් ජාතික පක්ෂයේ තත්ත්වය. මම වගකීමෙන් කියන්නේ. 2018 වර්ෂයේදී 99 අවුරුදු බද්දට දීලා තිබුණ මේ ඉඩම මෙතුමන්ලා පත්කරපු ජනාධිපති ප්‍රධාන ආණ්ඩුවෙන් දීලා තියෙනවා සින්නක්කරවම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනාධිපතිතුමා දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනාධිපතිතුමා කාගේද එතකොට. ඔබතුමන්ලා ඡන්දය දීලා පත්කරන කොට ජනාධිපති ඔබතුමාගේ. දැන් ඔබතුමන්ලාගේ නෙමෙයි. මහජන දේපල මංකොල්ලා කනකොට ඔබතුමන්ලාගේ නෙමෙයි. කැබිනට් පේපර් එකක් හරහා දුන්නේ. නැත්නම් දෙන්න බෑ. කැබිනට් පේපර් අපිද දාන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන එක හරි. ආණ්ඩුවේ ප්‍රධානියා කැබිනට් එකේ ප්‍රධානියා ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානියා ජනාධිපති. එතකොට වර්තමානයේ කැබිනට් එකට තීන්දුවක් ගෙනාවොත් ජනාධිපති ඒකට බැහැයි කිවුවොත් මුළු කැබිනට් එකම එකගවුනත් ඒක කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලට හොඳ වුනාම හොඳයි. නරක දෙයක් කරොත් නරකයි. ඔය දෙගොල්ලෝ රටට ගේම් එක දෙනවා. ඔය දෙගොල්ලෝ හවුලේ මේ රට විනාශ කරනවා. වෙන මුකුත් නෙමෙයි කැබිනට් පේපර් එක දැම්මේ කවුද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනාධිපති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරිසර අමාත්‍යාංශයෙන් දැම්මේ. එතකොට අනුමැතිය දීලා තියෙන්නේ කවුද?. ආණ්ඩුවේ සම්බන්ධයක් නැද්ද?. මේ ආණ්ඩුවෙන් වෙච්ච දෙයක් නෙමෙයිද මේක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනාධිපතිතුමා කැබිනට් පේපර් එක දාලා එතුමාම ඇවිත් සම්මත කරා. එතුමාට මොනවා හරි තියේනම් සම්මත කර ගන්න කැබිනට් එක රැස්කරනවා. නැත්නම් කැබිනට් එක රැස් කරන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 99 අවුරුදු බද්දට දුන්නේ යූ.එන්.පී. ආණ්ඩුවෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ඉඩම සින්නක්කරව දුන්නේ මේ ආණ්ඩුවෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පසුගිය ආණ්ඩුවෙනුත් සින්නක්කරව දුන්නා. ෂැන්ගිලා හෝටෙල් එකේ ඉඩම දුන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවක්. අපි ප්‍රාදේශීය සභාව විදියට මහජන දේපල මංකොල්ලා කන්න දෙන්නේ නෑ. ඔබතුමාට ඕන මේක දෙන්නද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි විරුද්ධයි ඒකට. පහුගිය ආණ්ඩුවෙන් සින්නක්කරව ඉඩම් දුන්නා. පෝට්සිටි එකත් සින්නක්කරව දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් කතාකරන්නේ ගිංතොට තුනීලැලි සංස්ථාවේ ඉඩම පිළිබඳව. ඔබතුමාලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් තමයි ඒ ඉඩම 99 අවුරුදු බද්දට දුන්නේ. වර්තමාන ඔය දෙගොල්ලන්ගේ ආණ්ඩුවෙන් 2018 වර්ෂයේදී ඒ ඉඩම සින්නක්කරව දුන්නා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක ජනාධිපති දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ජනාධිපති. ජනාධිපති ආණ්ඩුවේ කෙනෙක් නෙමෙයිද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනාධිපතිට තනි මතයට ඕන දෙයක් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කොහොමද කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රටේ නීතිය එහෙමයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ ආණ්ඩුවනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙනුත් ඕක කරානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ප්‍රාදේශීය සභාවට අදාළ කාරණාව මම කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් පෝට්සිටි දුන්නා. ෂැන්ගිලා දුන්නා. දැන් ඒවා කතා කරන්න එපා. අපි ඒවා කතා කරන එක නවත්තමු. අපිත් දැඩිව විරුද්ධයි තුනී ලැලි සංස්ථාවට මෙහෙම වෙනවට. මේක ජනාධිපතිගේ තනි මතයට දීලා තියෙන්නේ. අපි ඇමතිතුමා එක්ක සාකච්ඡා කරා මේ ගැන. එතුමාලවත් දන්නේ නෑ කැබිනට් එක වෙලාවේ මේක අනුමත කරගෙන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කැබිනට් එකේ කවුරුවත් දන්නේ නෑ. බබාලා ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මමත් ඒ යෝජනාව දාලා තියෙනවා. අපිට මේක වෙනුවෙන් දිවි හිමියෙන් සටන් කරන්න අයිතියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ සංවිධායකතුමා මේකට විරුද්ධව පෙළපාලියකුත් සංවිධානය කරන්න කියලා අපිට කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආණ්ඩුවෙන්ම දීලා ආණ්ඩුවට විරුද්ධව පෙළපාලි යනවා. මොකක්ද ඔයාලගේ දේශපාලනය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව මේ තුනී ලැලි සංස්ථාව පටන් ගත්ත කාලේ ඉඳලා වෘත්තිය සමිතිවල නායකත්වය දරලා තියෙනවා ජිනසේන අයියලගේ කාලේ ඉඳලා. මේක කොහොම හරි පෞද්ගලිකරණය වුණා. හරි වැරදි කතාව මොකක් වුනත් ඒක විවෘත ආර්ථිකය නිසා වෙච්ච දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි මේක රජයට පවර ගන්න උත්සාහයක යෙදෙමු. මම ඉන්නේ ඒ මතයේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම. මම හිතන්නේ ඒකට අපේ සභාවේ කවුරුවත් විරුද්ධ වෙන එකක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනතා විමුක්ති පෙරමුණේ මතය මොකක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ජනාධිපතිලා, අගමැතිලා, ඇමතිලා ඔක්කොම මේකට එකඟ වුනත් අපි මේකට විරුද්ධයි. ඒ යෝජනාව මම ස්ථිර කරා. මගේ අනිත් යෝජනාව ආවම මම කතා කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා ඒකට විරුද්ධ වෙන එක හරි. දැන් ඒ ඉඩම අරගෙන තියෙන්නේ කවුද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම පළවෙනි කතාව කියන්නම්. මේක මංකොල්ලයක්. මගේ යෝජනාවේදී මම කියන්න හිටියේ. නමුත් මම දැන් කියන්නම්. ඒක යශෝධා සමූහ ව්‍යාපාරයට තමයි මුලින්ම ලබා දුන්නේ 99 අවුරුදු බද්දට. දැන් ලක්ෂ 80 ක් වැනි මුදලට සින්නක්කරව දුන්නා. මේක මංකොල්ලයක්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කවුද ගත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගත්තෙත් එයාම තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එයා කාගේ කවුද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ රජයේ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නිවාස සෑදීමේ වැඩ පිළිවෙලට මම විරුද්ධයි. මම විරුද්ධ නිවාස සෑදීමට නෙමෙයි. එහෙම ගිහින් බැරි හින්දා. නිවාස හදනවාට විරුද්ධ නෑ. නිවාස හදන්න ඕන. අපි මීට වැඩිය හොඳ දෙයක් කතා කරමු. මේකට අපි කවුරු කවුරුත් එක හිතින් වැඩ කරමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි සභාවේ සියලු මන්ත්‍රීවරු එකතු වෙලා පිකට් එකක් කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක නවත්වන්නේ නැත්නම් දිගටම පිකට් කරමු.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒකට නම් සියලු දෙනාම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකටත් මිනි පෙට්ටියක් ගෙනිච්චොත් නරකද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමාලගේ යෝජනාවට අපි සහයෝගය ලබා දෙන්නේ. අර වතුර ප්‍රශ්නයටත් අපි සහයෝගය දෙන්න එනවා කිවුවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 12.** කහදූව වත්ත කොහොඹන් වත්ත මාර්ගයේ ටයිටස් තිලකසේකර මහතාගේ නිවස අසල කොන්ක්‍රීට් පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

ඒක සභාපතිතුමනි මීටර් 20 ක පමණ දිගින් යුතු කාණුවක්. සභාවට සල්ලි ආපු දවසක කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 13.** අප ප්‍රාදේශීය සභාව විසින් සකස් කරනු ලබන සියලු ඇස්තමේන්තු සිංහල භාෂාවෙන් සකස් කර දෙන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක ගැන ටිකක් කතා කරන්න අවසර ලබා දෙන්න. සභාව සියළුම ඇස්තමේන්තු ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන්නේ. මේ කොන්ත්‍රාත්කරුවන්ට සහ මේ මන්ත්‍රී මණ්ඩලයේ බොහෝ දෙනෙක්ට මේ ඇස්තමේන්තුව කියවා තේරුම් ගැනීමට අපහසුයි. ඒ නිසා මේ වැඩ ක්‍රියාත්මක වීමේදී මේ ව්‍යාපෘතිවල යම් යම් අඩුපාඩු හෝ යම් යම් අතිරික්ත කරුණු වැඩිපුර ඉටු වෙනවා. වැඩිපුර ඉටුවුනාම ගෙවන්න විදියකුත් නෑ. අඩුවෙන් ඉටුවුනාම කපනවා. මේකේ ගැටලුවක් තියෙනවා. මේක පුද්ගලිකව මගේ ගැටලුවක් නෙමෙයි. මේ ඇස්තමේන්තු ඕනම භාෂාවකින් කියවලා තේරුම් ගැනීමේ හැකියාව මට තියෙනවා.

නමුත් මේ ප්‍රායෝගික ගැටළුව විසඳා ගැනීමට අවශ්‍ය නිසා මම මේ යෝජනාව කරන්නේ. ඊට තාක්ෂණික ගැටළුවක් නැතෙයි කියලා මම විශ්වාස කරනවා. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙම ඇස්තමේන්තු සිංහල භාෂාවෙන් සකස් කරන්න. ඒ නිසා කාටත් පහසුවක් හැටියට මෙම ඇස්තමේන්තු සිංහලෙන් සකස් කරන්නේ. තාක්ෂණික අපහසුතාවයක් තියෙනවානම් ඒ අපහසුතාවය මඟ හරවා ගෙන ඇස්තමේන්තු සිංහලෙන් සකස් කර දෙන ලෙස යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී මෙහෙම කියන්න ඕන. ගොඩක් තාක්ෂණික වචන විදියට තියෙන්නේ ඉංග්‍රීසි වචන. ඒවාට සිංහල භාෂාවෙන් තේරුම් නොතිබෙන්න පුළුවන්. අවශ්‍යතාවය තියෙන අයට ඒක දෙන්න පුළුවෙන් වෙයි අමාරුවෙන් හරි ලෑස්තිකරලා. හැම ඇස්තමේන්තුවක්ම සිංහලෙන් දෙනවා කියන එක ප්‍රායෝගික නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සිංහල වචන නැත්තේ නෑ. දිව උලුක්කු වෙනවා ඒවට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඉංග්‍රීසි වචනයක් සිංහලෙන් ලියලා හරි කියවන්න පුළුවන්. තේරුම් ගන්නනේ පුළුවන් වෙන්න ඕන. ඒක නිසා මම හිතන්නේ නෑ අපහසුයි කියලා. අපිට සභාපතිතුමනි අවශ්‍යනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වුනත් ගෙන්න ගන්න පුළුවන් සිංහල ඇස්තමේන්තුවල පිටපත්. එච්චර ලොකු දිග වචන නෑ. තියෙනවා තමයි තාක්ෂණයේදී අපි අහපුවත් නැති වචන. ඒක ඇත්ත තමයි. ඉංග්‍රීසි වචනය සිංහලෙන් දාලා හරි මොකක්හරි කරන්න පුළුවන් අපිට. ඒක ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උදාහරණයක් විදියට කොන්ක්‍රීට් කියන වචනයට ඇති සිංහල වචනයක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක සිංහලෙන් ''කොන්ක්‍රීට් මිශ්‍රණය'' කියලා යොදන්නකෝ. තේරුම් ගන්න එපැයි වැඩක් කරන්න කලින්. අපි තාක්ෂණ නිලධාරියාට දොස් කියනවා නෙමෙයි. මෙතන ගැටළුවක් තියෙනවා. ඒ අයට ඉගැන්වීම් කරලා තියෙන ආකාරයට. වර්ග මීටර් වලින් හෝ වර්ග අඩි වලින් ගණනය කරන්න. පාරේ කොන්ක්‍රීට් දානවා නම් වර්ග මීටර් මෙපමණයි. වර්ග අඩි මෙපමණයි කියලා දක්වනවා. ඒකේ ගැටළුවක් නෑ. ගැටළුව තියෙන්නේ උදාහරණයක් විදියට අඩි 10 ක් පළල මීටර් 65 ක් දිග මාර්ගයක් කොන්ක්‍රීට් අතුරන්න කියලා එනවා නම් පහසුයි. මේකේ ඝණ මිටර් තියෙන්නේ. ඒක වර්ග මීටර් කරගෙන කොන්ක්‍රීට් දාලා මනින්න ගියහම අඩුවැඩි වීම් සිද්ධ වෙනවා. ඒකට තාක්ෂණ නිලධාරීන් සාක්ෂි දරාවි. ඒ නිසා ඒකත් සඳහන් කරනවානම් වඩා හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා ඇස්තමේන්තු සිංහල භාෂාවෙන් සකස් කිරීමේ හැකියාව පිළිබඳ තාක්ෂණ නිලධාරියාට සභාව දැනුවත් කිරීමට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ. පී. පී. එස්. ගුණසේකර මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- සම්මත ඒකක මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස් කරන බව.
- ඇස්තමේන්තු හා මිනුම් පත්‍රය ආධාරයෙන් සංවර්ධන ව්‍යාපෘතිවල වැඩකටයුතු සිදු කරන බව.
- සියළුම සම්මත ඒකක මිල ගණන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති බව
- ගිවිසුම අත්සන් කිරීමේදී ඇස්තමේන්තුවල සහ මිනුම් පත්‍රය සම්බන්ධයෙන් ඇති ගැටළු ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ට සාකච්ඡා කොට නිරාකරණය කර ගත හැකි බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට ඇති ගැටළුද සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 14.** ආනන්ද මාවත යද්දෙහිවත්ත මාර්ගය ආරම්භක ස්ථානයේ සිට ඉදිරියට පැති බැම්මක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුදල් ආවම කරමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපි මාස 06 කට පස්සේ හරි අපේ ආණ්ඩුවක් යටතේ හරි මේ යෝජනා ක්‍රියාත්මක කරනවා. තමුන්නාන්සේලා කලබල වෙන්න එපා. ඒක අපි කරගන්නම්. යෝජනා ඉදිරිපත් කරලා පළාත් පාලන දෙපාර්තමේන්තුවට ගිහින් එනකොට අපි මේකට සුදානම් වෙලා ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 15.** කලේගාන කොට්ඨාශයට අවශ්‍ය තැන්වලට සවි කිරීම සඳහා වීථි ලාම්පු කට්ටල 25 ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 16.** කලේගාන පොළ භූමිය පිටුපස ඇති වැට අනාරක්ෂිත බැවින් එම ස්ථානයේ ආරක්ෂිත බැම්මක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ පොළ පිටුපස ගෙදර හේදිලා කැඩිලා යනවද?

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔබතුමාලා ගිහින් බලන්න. පොළ පිටිපස්සේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 17.** වී. සී. පාරට යාබද පාරේ ගෙවල් හතකට පමණ ගමන් ගන්නා මාර්ගය දෙපස ප්‍රදේශවාසීන් තාප්ප බැඳ මාර්ගය අත්පත් කරගෙන ඇති බැවින් එම මාර්ගය මැන සභාවට අත්පත් කර ගැනීමට යෝජනා කරමි.

මෙම පාරට ත්‍රීවිල් එකක්වත් ගන්න බැරි තරමට අපහසුතාවය තියෙනවා. ගරු සභාපතිතුමාත් ගිහින් ඒක නිරීක්ෂණය කරා. ඒ පාරේ පළල ටිකක් එහාට වෙන්න අඩි හතරක් තියෙනවා. පාරේ මුල හරියේ අඩි තුනක් තුනහමාරක් වගේ තියෙන්නේ. ඒ මනුස්සයට ත්‍රීවිල් එකක්වත් ගන්න බැරි අපහසුතාවයක් තියෙනවා. ලෙඩක් හැදුනොත් ලෙඩාව උස්ස ගෙන තමයි එන්නේ. ඒ පාර කොන්ක්‍රීට් කරලා තියෙනවා. මම යෝජනා කරනවා ඒ පාර මැනලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 18.** ඊරියගහ හන්දිය නිතර රිය අනතුරුවලට භාජනය වන ස්ථානයක් බැවින් ඕපාත සහ බටුවන්තුඩාව අතුරු මාර්ග දෙකේ මාර්ග බාධක දැමීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 19.** පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් මෙම සභාවට (2019.06.18) ඉදිරිපත් කරන මෙන් යෝජනා කරමි.

- කැලි කසළ ඉවත් කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන වැඩපිළිවෙල.
- අනවසර ඉදිකිරීම් සම්බන්ධව මෙතෙක් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරාත්මක වාර්තාවක්.
- අනතුරුදායක ගස් සම්බන්ධව ගෙන ඇති තීන්දු තීරණ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ වාර්තාවක් හදලා ඇති ඒ වාර්තාව ප්‍රගතිය වෙලාවේදී ලබා දේවි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ගැන කතා කරන්න ඕන. මේ සම්බන්ධව ඇති අඩුපාඩු අපි නිවැරදි කර ගත යුතුයි. මොකද හේතුව තීන්දුවක් ගන්නවා අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව දැනුම ඇති නිලධාරියා ගිහිල්ලා අනතුරේ තත්ත්වය පිළිබඳව නිරීක්ෂණය කරලා. පෞද්ගලික ආරවුල් දිහා බලලා නෙමෙයි ඒ තීන්දු තීරණ ගන්න ඕන. එහෙම නිවැරදි තීන්දු අපේ නිලධාරීන් ගන්නවා කියලා අපි විශ්වාස කරනවා.

මම උදාහරණයක් කියන්නම් වටරැක ප්‍රදේශයේ අනතුරුදායක ගසක ප්‍රශ්නයක්. දැන් මේ ගහේ අතු කපන්න කිවුවා, දැලක් දාන්න කිවුවා. දැන් මේකෙදි සිද්ධ වෙන්නේ ඒ මිනිස්සුන්ට හැමදාම දිගින් දිගට යන්න. මේ පාර අත්ත කපනවා. ඊළඟ පාර ගොබලුවල්ල කපනවා. ආපසු මාස හයකින් විතර ආයිම මේ දේවල් කරන්න ඕන. මේකට ස්ථිර විසඳුමක් අවශ්‍යයි. ඒ වගේමයි මම තමුන්නාන්සේලාට යොමු කරනවා බලන්න මේ ප්‍රශ්නයේදී ගරු සභාපතිතුමා වගකීමක් පවරලා තියෙනවා මේ සම්බන්ධව ලේකම්තුමාට. මම හිතනවා ඒකේ ප්‍රශ්නයක් නෑ. ඒක එහෙම විය යුතුයි. ඉතාම නිවැරදි තීන්දුවක් අරගෙන තියෙනවා.

සභාවේ දැන ගැනීම සඳහා මම මේ උදාහරණය කියන්නේ. ගාල්ල, උළුවිටිකේ, හල්වතුරගොඩ වත්ත ලිපිනයේ පදිංචි ශ්‍රියාලතා මහත්මියගේ නිවසට තියෙන අනතුරුදායක ගසක් පිළිබඳව සභාවට වාර්තා කරනවා. අදාළ නිලධාරීන් ගිහින් බලලා ඒ අනතුර තියෙනවා කියලා බොහොම පැහැදිලිව දැකලා ගස කැපීම සඳහා දන්වා යවලා තියෙනවා ලියුමක් 2019.05.06 වෙන දින තියෙන බලතල අනුව වගන්ති දාලා. ඒ පාර ඒ දේ ක්‍රියාත්මක නොවුනට පස්සේ 2019.05.14 දින නැවතත් දන්වා යවනවා ඒකම කරන්න කියලා. අද වෙනකන් ඒ ගහ කපලා නෑ. පුදුමෙයි කියන්නේ ඊට පස්සේ 2019.06.05 දින ශ්‍රියාලතා මහත්මියට ලිපියක් යවනවා ඔබගේ නිවස අසල පිහිටා ඇති අනතුරුදායක පොල් ගස සම්බන්ධයෙන් 2019.05.25 දින අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරි විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලද අතර, එහිදි පොල් ගහ ඇඳ, බැඳ තබා ඇති බැවින් අනතුරුදායක තත්ත්වය පහව ගොස් ඇති බවට වාර්තා කර ඇත. මේවා මම හිතන්නේ සභාව හැල්ලුවට පත්කරන දේවල්. මම කියන්නේ ඔබතුමා මේවට නිවැරදි තීන්දු තීරණ ගන්න. අපි කවදාවත් අහලා නෑ කැපුවේ ඇයි අනතුරක් නැතේ කියලා. මේ වගේ දේවල් මෙහෙම කරාම හොද නෑ. ඇත්තටම මම දන්නේ නෑ තාක්ෂණ නිලධාරිතුමා ගිහින් මොකක්ද කියලා බලලා තියෙන්නේ. පොල් ගසේ උසත් එක්ක බැලුවම ඒක අනතුරුදායකයි. සමහර තැන්වලදී නිලධාරීන් අසරණ වෙනවා. මම දකින්නේ නිලධාරීන් අසරණ කරන්නේ නැතුව අපි බොහොම පැහැදිලි තැනක ඉමු සියළු මන්ත්‍රීවරු. අපි කිසිම බලපෑමක් කරන්නේ නැතුව ඉමු කිසිම දේකට. සභාපතිතුමා විදියට ඔබතුමා ඒ නිවැරදි තැන ඉන්න. ඒ වැඩේ නිලධාරීන්ට භාර දෙන්න. මේ පිළිබඳව වහාම තීන්දුවක් ගන්න. ඒ අනතුර පහව ගිහින් නෑ කියලා කවුරු මොනවා කිවුවත් පේනවා. ගෙයක් දොරක් කැඩුනොත් සභාවෙන් වන්දි ගෙවලා ඒ හානිය පියව ගන්න පුළුවන්. නමුත් ජීවිත හානියක් වුනොත් වගකියන්නේ කොහොමද?. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔබතුමා මේ පිළිබඳව හොයලා බලලා ඒකේ යථාර්තය දකින්න. මේ ප්‍රශ්න දුර දිග අරන් ගියොත් සභාවට ලොකු නරකක් වෙන්නේ. අපි දැන දැන සභාවට නරක දේවල් කරන්න හොඳ නෑ. මේවා ඊළඟ අදියරට ගියහම සභාවට හොඳ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 20.** බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ පිහිටි වටිනා සම්පතක් වන ගිංතොට තුනී ලැලි සංස්ථාවට අයත් භූමිය විකුණා දැමීම සඳහා ගෙන යන වැඩපිළිවෙල වහා නතර කිරීම සඳහා සභාව මැදිහත් වන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතන්නේ මේක ගැන තවදුරටත් කතා කරන්න අවශ්‍යතාවයක් නෑ. අපි සියළුම දෙනා එක මතයක ඉන්නවානේ. මම හිතන්නේ ගරු සභාපතිතුමනි මේ පිළිබඳව අපි ඉදිරි දින කීපය තුලදී බොහොම පැහැදිලි විරෝධතාවයක යෙදෙන්න ඕන. නැත්නම් මේකට අවශ්‍ය කටයුතු කරාට පස්සේ අපි මොන දේ කරත් වැඩක් නෑ.

හොඳම උදාහරණය තමයි අපි එදා දවසේ කරන්න ඕන වෙලාවේ නොකරපු නිසා අපිට ලොකු දීර්ඝ ක්‍රියාවලියකට යන්න සිද්ධ වෙලා තියෙනවා කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ප්‍රශ්නයට. ඒ නිසා මේ අතින් කඩලා දාන්න තියෙන දේ තවදුරටත් වර්ධනය වෙන්න දෙන්න එපා. ඔබතුමාට සම්පූර්ණයෙන්ම සහයෝගය ලබා දෙනවා. ඔබතුමා කියන්න අපි මොකද කරන්න ඕන කියලා. අපි ඉස්සෙල්ලම හිතනවා මේ සඳහා ලොකු උද්ඝෝෂණයක් කළ යුතුයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන්න ඕන ලොකුම දේ ජනාධිපතිතුමා කරලා තියෙන්නේ ඕකට. ඒ මිනිහට සින්නක්කර ඉඩමක් දීලා තියෙන්නේ අබේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමා දන්නවා සින්නක්කර ඉඩමක් කැබලි කරලා විකිණීමේ අයිතිය ඒ පුද්ගලයා සතුයි. මම සභාපතිවරයා විදියට උපරිම උත්සාහය ගන්නවා ඒක නවත්වන්න. නමුත් සින්නක්කර ඉඩමක් අයිති පුද්ගලයෙකුට සභාවේ තියෙන නීති රෙගුලාසි අනුව ඒ ඉඩම වෙන්දේසි කිරීමේ අයිතිය තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුරු මොනවා කිව්වත් මේ දේ කරන්න අපි ඉඩ දෙන්නේ නෑ. මේක ලොකු සමාජ මංකොල්ලයක්. අපි මහජන නියෝජිතයෝ හැටියට පත් කරලා තියෙනවා. අපි සභාපතිතුමා මේකට ගන්න පුළුවන් හැම ක්‍රියාමාර්ගයක්ම ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අමතක කරන්න නරකයි ඒ ඉඩම දැන් සින්නක්කර ඉඩමක්. දැන් ඒ ඉඩම පොදු ඉඩමක්වත්, රජයේ ඉඩමක්වත් නෙමෙයි. ඒ ඉඩම වෙන්දේසි කිරීමේ අයිතිය ඒකේ අයිතිකාරයා සතුයි. මම වගකීමෙන් කියනවා සභාපතිවරයා විදියට ඒ ඉඩම වෙන්දේසි කරන්න ඉඩ නොදෙන්න හැම දේම මම කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළවෙනි එක තමයි මේ ගැන සභාවෙන් ලියුමක් සකස් කරන්න. මේකට සභාවේ කවුරුවත් විරුද්ධ නැනේ. මේ මංකොල්ලයට ඉඩ දෙන්න එපා. නැවත පවරා ගන්න කියන්න මේ ඉඩම ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, ඉඩම් ඇමතිතුමාට දන්වන්න. ඊට පස්සේ අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා මේ ඉඩම යොදවන්න කියන්න. තුනී ලෑලි සංස්ථාවට හරි වෙන දෙයක් හරි. අක්කර 16 තියෙනවා. ලක්ෂ 80 යි මේකට ගෙවලා තියෙන්නේ. මේ ඉඩම විතරක් කෝටි 80 කට වැඩිය වටිනවා. මේකට මැදිහත් වෙන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක ඔබතුමන්ලාගේ නායකයන්ටත් කියලා පැහැදිලි කරලා දෙන්න. ඒ නායකයෝ උද්ඝෝෂණ කරන එක නෙමෙයි කරන්න ඕන. කැබිනට් පේපර් දාලා ඒ ඉඩම මංකොල්ල කනකොට මැදිහත් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාට කියන දේ තමයි කවුරු කොහොම කරත් වැරැද්දනම් වැරැද්ද. ඒ කාලේත් වික්කා. මේ කාලෙත් වික්කා. හැම කාලෙම වික්කා. දැන් අපි මේක නතර කර ගන්න බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරිසරය පිළිබඳ මහ ඇල්මක් තියෙන ඔබතුමන්ලාගේ ජනාධිපති අපේ නෙමෙයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමන්ලාත් දින 52 ක් තියාගෙන හිටියා ඒ ජනාධිපති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අනේ නෑ අපි තියන් හිටියේ නෑ. ඒ ආණ්ඩුවට සහයෝගය දීපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි දේශපාලනය කරන්නේ නෑ. ඕන තැනක අපි කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ජයවේවා. අපි වෙන මොනවා කියන්නද

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කාලේ අබේසේකර මන්ත්‍රීතුමා මහින්ද මහත්තයට ඡන්දය දීලා වැඩ කරේ. අබේසේකර මන්ත්‍රීතුමා ඡන්දය දුන්නේ නෑ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- මහින්ද මහත්තයා අගමැති වුනාම ඔබතුමාලා සුභ පතලා කටවුට් දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අගමැති අපේනේ. අගමැති පත්කරාම අගමැතිට සුභ පතන්නේ නැතුව කාට සුභ පතන්නද ? අද අපි විපක්ෂ නායකතුමාට සුභ පතනවා. විපක්ෂ නායකතුමා අපේනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- මහින්ද රාජපක්ෂ මහත්තයා කාගේ පිලේද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපේ පිලේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. පොහොට්ටුවේ නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ. පොහොට්ටුවේ. සාමාජිකත්වය ගත්තම පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වෙනවා. නමුත් නිල නොවන මට්ටමෙන් මහින්ද මහත්තයා පොහොට්ටුවට නායකත්වය දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- එතුමා විපක්ෂ නායකකම ගත්තේ පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තේ නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතුමා පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තේ නෑ. අපි පොහොට්ටුවේ සමාජිකයෝ. නමුත් ඒක නොගත්තේ වෙන හේතුවක් නිසා නෙමෙයි. ඒක ගත්තා නම් පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ප්‍රසිද්ධියේ ගත්තනේ එතුමා සාමාජිකත්වය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගත්තා නම් මන්ත්‍රීධූරය අහෝසි කරන්න පුළුවන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ෆේස්බුක් දාලා තිබුණා සාමාජිකත්වය ගත්තා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- මහින්ද මහත්තයා ප්‍රසිද්ධියේ පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තා. පස්සේ පාර්ලිමේන්තුව විසිරවීම නීතිවිරෝධියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරාම ප්‍රසිද්ධියේ කිවුවා අයේම මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් කියලා. තාමත් සාමාජික මුදල් කපනවා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පොහොට්ටුවේ සාමාජිකත්වය ඉස්සෙල්ලම ගත්තේ ඔබතුමාලා වැඩ කරන, ඔබතුමාලා උදව් කරන ඔබතුමාලාගේ පක්ෂයේ මිනිස්සු. සාමාජිකත්ව අංකය ෆේස්බුක් දැම්මා මෙන්න මගේ සාමාජිකත්ව අංකය කියලා. අපිට ඉස්සෙල්ලා ඒ අය සාමාජිකත්වය ගත්තේ. ඔබතුමාලාගේ නායකයෝ තමයි පොහොට්ටුවේ සාමාජිකත්වය ඉස්සෙල්ලම ගත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- සභාපතිතුමා මගේ තර්කය ඕක නෙමෙයි. අපි ප්‍රාදේශීය ප්‍රාථමික දේශපාලඥයෝ. ජාතික නායකයෝ, ලෝකේ ප්‍රසිද්ධ නායකයෝ ඒ අය. එයාලා දේශපාලන තීන්දු තීරණ ගන්න ඕන අපි වගේ දේශපාලන නොදරුවන්ගේ පැත්ත බලලා. ඒ අය ගන්න තීන්දුයි අපි කතා කරන දේවලුයි දෙකක්. එදා ජාතික නායකයෝ විදියට ඉඳලා අපේ පක්ෂය නැති කරලා ඒ පක්ෂය හොඳයි කියලා ගිහිල්ලා ආයේත් ඇවිල්ලා විපක්ෂ නායකකම ගත්තා. ඒ නිසා අපිට මඩ ගහන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- **21.** මන්ත්‍රී කණ්ඩායමේ ඡායාරූපය සියළුම මන්ත්‍රීවරුන්ට ගෙවීමකින් තොරව ලබා දීමට යෝජනා කරමි.

අනේ ඉතිං මැරුණම හරි ඕක බල බල ඉන්න පුළුවන්නේ. ඒ නිසා ගෙවීමකින් තොරව ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

ඒක අපි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසීම් කරලා උත්තරයක් දෙන්නම්.

කාන්තා මාධ්‍ය සාමූහිකයන්ගේ සංවිධානයෙන් ඇවිත් ඉන්නවා අද සභා රැස්වීම නිරීක්ෂණය කරන්න. කාන්තා මන්ත්‍රීවරියන්ට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දෙමු. එතුමියලාට යන්නත් තියෙන නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතුමියන්ලාගෙන් අහන්න අපේ සභා රැස්වීම පාර්ලිමේන්තුවට වඩා හොඳද නරකද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තමන්ගේ ප්‍රදේශවල තියෙන ගැටලු, කෙරුණ දේවල්, නොකෙරුණ දේවල්, සංවර්ධන කටයුතු පිළිබඳ අදහස් දක්වන්න ඩඩ්ලි මන්ත්‍රීතුමාගේ යෝජනා දෙක ඉදිරිපත් කරාට පස්සේ.

<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි.

**22.** ලබුදූව කුරුන්ද කන්ද රක්ෂිත කොටසේ දේශීය මිශ්‍ර වන වගාවක් ඇති කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයට දැනුම් දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම යෝජනා කරේ ලබුදූව කුරුන්ද කන්ද උස් ප්‍රදේශයේ, මුදුන හරියේ හෙක්ටයාර් 8.5 ක පමණ වපසරියකින් යුතු පයිනස් වගාවක් තියෙනවා. මේ පයිනස් වගාවට අවුරුදු 30 ක් විතර වෙනවා. මම අවුරුදු 20 ක විතර ඉඳලා උත්සාහ ගත්තා මේ පයිනස් වගාව මෙතනින් අයින් කරලා දේශීය මිශ්‍ර වන වගාවක් ඇති කිරීමට. අවුරුදු 20 ක් තිස්සේ මම මේක ගාල්ල දිස්ත්‍රික් පරිසර කමිටුවට යෝජනා කරා. ගාල්ල දිසාපතිතුමා එක්ක ලොකු සටනක් කරගෙන ගියා මේක කරන්න. නමුත් ඒ අවස්ථාවෙත් කර ගන්න බැරිවුනා. හේමකුමාර නානායක්කාර මැතිතුමා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමති විදියට පත්වෙලා ආවම එතුමාට මම මේක කිවුවා. එතුමා මේකට එකඟතාවය පළ කරා. මේකට යම් වැඩපිළිවෙලක් ඊට පස්සේ ක්‍රියාත්මක වුනා. මේ ඉඩමට අයිතිකාරයෙක් හිටියේ නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් අයිති නෑ කිවුවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් අයිති නෑ කිවුවා. ඒ වෙලාවේ ආණ්ඩුව විසිරිලා ගිය නිසා මේ වැඩේ කරගන්න බැරි වුනා. අතිගරු ජනාධිපතිතුමා පරිසරය පැත්තෙන් විශාල වන වගා ඇතිකරගෙන පරිසර හිතකාමීව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරගෙන යනවා. මේක නිසා මම මේ යෝජනාව ප්‍රාදේශීය සභාව හරහා ජනාධිපති ලේකම් කාර්යාලයට යොමු කිරීමට තමයි බලාපොරොත්තු වුනේ. මේ ඉඩමේ පිඹුරු අංකය පි.පි.ගා./3574. දැනට මේ ඉඩමේ අයිතිය තියෙන්නේ ගාල්ලේ අඩෙව් වන නිලධාරීට. ගැසට් කරලා අයිතිය භාරදීලා තියෙනවා. මම එතුමා හම්බ වෙලා සාකච්ඡා කරා.

ඊළඟට මේ ඉඩම නිසා පහුගිය කාලේ කෘමි විශේෂයක් ඇතිවෙලා තිබුණා කුරුන්ද කන්ද ප්‍රදේශයේ. මේ පයිනස් වගාව තියෙන ඉඩම තුළ වැටෙන රොඩුත් එක්ක මේ කෘමි විශේෂය හටගෙන පහලට ඇවිල්ලා බරපතල ප්‍රශ්නයක් ඇති වුනා ජනතාවට. මේ කාරණය පිළිබඳව දිගින් දිගටම පේරාදෙණිය විශ්ව විද්‍යාලය, රුහුණු විශ්ව විද්‍යාලය ආදී විශ්ව විද්‍යාල ගණනාවක් ඇවිත් පරීක්ෂණ කරා. නමුත් ඒ වැඩ කටයුතු තාම අවසන් වෙලා නෑ. අර කෘමි විශේෂය ටික ටික පහළට ඇවිල්ලා දැන් පන්සල තියෙන පහල ප්‍රදේශයේ ගෙවල් වලට හානි කරනවා. ඒ කෘමි විශේෂය නොයෙක් නම් වලින් හඳුන්වනවා. කාකයෝ කියනවා. තව නොයෙක් නම් කියනවා. නමුත් කෘමි විශේෂය තාම අඳුරන්නේ නෑ. මේ සත්තු දෙබර කූඩුවක් වගේ කූඩු හදනවා. කෙසෙල් කැනකට ආවොත් මුළු කෙසෙල් කැනම ආවරණය කර ගන්නවා. ඒ මිනිස්සු එදිනෙදා වේල පිරිමහ ගන්න උයන පිහන හට්ටි වළං පවා ආවරණය කර ගන්නවා. විශාල වශයෙන් කණ්ඩායම් විදියට එන නිසා මහා හානියක් වෙනවා. මේක ඇතිවුනේ මේ පයිනස් වගාව නිසා. පයිනස් වගාවෙන් මහා විශාල භූගත ජල හානියක් වෙනවා. මොකද පයිනස් කොළ පොළවට වැටිලා ස්ථරයක් හැදිලා තියෙනවා. ඒ නිසා වැසි ජලය සම්පූර්ණයෙන්ම පහළට ගලාගෙන යනවා. පොළවට වැසි ජලය ලැබීමේ ප්‍රවණතාවය අඩුයි.

එතකොට මෙවැනිම ප්‍රදේශයක් තිබිලා තියෙනවා බෝගහගොඩ ඇටමැස්ස කන්ද කියලා. මේ බෝගහ ගොඩ ඇටමැස්ස කන්දේ අක්කර 40 ක් තිබිලා තියෙනවා. ඒත් පයිනස් වගාවක් තිබිලා මේ

විදියටම හානිය වෙන නිසා දැනට අවුරුදු දෙකකට විතර කලින් දේශීය මිශ්‍ර වන වගාවක් අද වෙනකොට ඇතිකරලා තියෙනවා. කොස්, හොර, මිල්ල, කැන්ද, දෙල්, ඩොංගා, නැදුන් වගේ දේශීය ගස් වර්ග වගා කරලා තියෙනවා. ඒක සාර්ථක විත්තිය මට දැන ගන්න ලැබුණා අඩවි වන නිලධාරී කාර්යාලයෙන්. ඔබතුමා මේ යෝජනාව යවන්න. අපිට එතුමලාගේ සහයෝගය ගන්න පුළුවන්. මේ යෝජනාව මම කරන්නේ පොදු මහා ජනතාවට ආර්ථික වශයෙන් සහ පාරිසරික වශයෙන් සුභදායක වෙන සහ ඵලදායිතාවයකට යන්න පුළුවන් කාරණාවක්. කොස්, දෙල් වගේ දේවල් ඉන්දුවොත් අද තියෙනවා ලොකු ඉල්ලුමක්. තමුන්නාන්සේලාට පාර තොටේ යනකොට දකිනවා ඇති බෝක්කුවක් බෝක්කුවක් ගානේ, හන්දියක් හන්දියක් ගානේ කොස් විකුණන ආකාරය. ජනතාවට යම් ආර්ථික වාසියක් ඒකෙන් අත්පත් කර ගන්න පුළුවන් මේ වන වගාව ඇති කරොත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන ආදාහනාගාරය හදන්න බැරිද?

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** වන වගාව ඇති කරලා ආදාහනාගාරය හදන්න පුළුවන්. ඒ උනාට යන එක අමාරුයිනේ. බස් ගෙනියන්න බෑ කන්ද හුගක් වැඩියි.

කරුණාකරලා දැන් සභාපතිතුමා මේ යෝජනාව ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන අපි හොයලා බලන්න ඕන. කුරුන්ද කන්ද කියන්නේ නාය යන ප්‍රදේශයක්. මගේ දැනුමේ හැටියට පස නිරාවරණය වුනොත් නාය යන්න පුළුවන්. ඒ හේතුව නිසා තමයි ෆයිනස් ගස් වවන්න ඇත්තේ නාය යාම වළක්වා ගන්න. මේකට උපදෙස් ගන්න වැඩපිළිවෙලකට යන්න ඕන. එහෙම නැති වුනොත් ඒ චෝදනාව එන්නෙත් අපිට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යටි වගාවක් යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** යටි වගාවක් ගිහින් ඒ වගාව යම් ප්‍රමාණයකට ආවට පස්සේ අර වගාව අයින් කරත් කමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳ මන්ත්‍රීවරුන්ගේ අදහස් මොනවාද?.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඩඩ්ලි මන්ත්‍රීතුමාගේ යෝජනාව බොහොම හොඳ යෝජනාවක්. මම ඒ ගැන වැදගත් යමක් කියන්න ඕන. කුරුන්ද කන්ද කියන්නේ ගොඩක් අන්ත අසරණ මිනිස්සු ඉන්න ගමක්. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ගත්තම අන්තම අසරණ ජනතාව ජීවත් වන්නේ කුරුන්ද කන්දේ. ෆයිනස් වගාව කරපු භූමියේ වෙන වගාවක් කරන්න බෑ. අපි වෙන වන වගාවක් කරන්න පටන් ගත්තත් මුල් අවදියේදී ඒ ශාකවලට වතුර දාන්න ඕන. කුරුන්ද කන්දේ මිනිස්සුන්ට නල ජලය ලැබෙන්නේ දවසට පැය 06 ක් විතර. ඒ මිනිස්සුන්ට බොන්න වතුර ටිකක් නැතිකොට මේ පැල වලට අවශ්‍ය වතුර ලබා දෙන්නේ කොහොමද කියලා මම දන්නේ නෑ. මම දන්නේ නෑ ඔබතුමා කොහොමද ඒ කාරණය තීරණය කරන්නේ කියලා. අනික ඒ ගමේ මිනිස්සුන්ට යන්න වැසිකිළියක් නෑ. ගමන් බිමන් යන්න පාරක් නෑ. ඉන්න ගෙයක් දොරක් නෑ. ඒක මේ සියළුම මන්ත්‍රීවරු පොදුවේ දන්න කාරණාවක්.

මට මේ කාරණාව කියන්න අවස්ථාවක් වෙනවා මේක අදාළ මාතෘකාව නොවුනත්. සමෘද්ධි දීමනාව ඉල්ලුවා කුරුන්ද කන්දේ පවුල් 48 ක්. ඒ වුනාට කුරුන්ද වසම සමෘද්ධි වලින් කපලා දාලා තියෙනවා. මේක සියලු මන්ත්‍රීවරු පිළිගන්න ඕන. බොහොම හිතේ අමාරුවෙන් මම මේ කාරණාව කියන්නේ. මේක මානුෂීය හැඟීමෙන් බලලා කතා කරන්න ඕන කාරණාවක්. මගේ අදහස නම් ඔබතුමන්ලාගේ ආණ්ඩු යටතේ අන්න ඒ අසරණ මිනිස්සුන්ට ඉන්න තැනක් හදා ගන්න උදව් කරන්න. වැසිකිළි පද්ධති නැති ගෙවල් 23 ක් මම හොයාගෙන තියෙනවා. මගේ ලග නම් ලැයිස්තුව තියෙනවා. අපිට ආණ්ඩු බලය නැති නිසා ඒ කාරණා කරන්න බැරි වුනා. මම ගොඩක් කැමතියි මගේ වසමේ කවුරුහරි වැඩ කරනවා නම්. කුරුන්ද කන්ද වෙනුවෙන් මම පුළුවන් දෙයක් කරාට මීට වැඩිය දෙයක් කරන්න බෑ. ඔබතුමා ඒ සම්බන්ධව හොයලා බලලා අවශ්‍ය කටයුතු සලසනවා නම් බොහොම හොඳයි කියලා මම කියනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ ගැන වචනයක් කතා කරන්න අවශ්‍යයි. අපේ මන්ත්‍රීවරිය සඳහන් කළ ආකාරයට සමෘද්ධි දීමනාව කපා හැරීම සම්බන්ධව. සමෘද්ධි දීමනාව එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ට විතරක් ලබා දුන්නා කියන එක මම තරයේ හෙලා දකිනවා. අපි කිසිම කෙනෙකුගේ සමෘද්ධි දීමනාව කැපුවේ නෑ. සියලුම දෙනාට ලබා දුන්නා. ඒ වගේමයි මේ තිස් වෙනිදට කලින් මගේ ගමේ සමෘද්ධි දීමනාව නොලැබුණු, අයදුම්පත්‍ර භාර නොදුන්නු අනෙක් සියළු දෙනාටමත් සමෘද්ධි දීමනාවේ හිමිකම ලබා දෙන්න මම කටයුතු කරනවා. අයදුම්පත්‍රය මගේ ශ්‍රමය දායක කරලා ලබා දීලා මම ක්‍රියාත්මක වෙනවා.

ඒ වගේම මන්ත්‍රීතුමිය කියපු ආකාරයට වැසිකිළි ආධාර ලබා දීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහාත්, ගම්පෙරලිය වැඩ සටහන යටතේ, දක්ෂිණපායෙනුත් පක්ෂ භේදයකින් තොරවත් ක්‍රියාත්මක වෙනවා. සියලු දෙනාටම ඒ දේවල් ලබාදෙනවා. ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා මගේ ගමේ අයට මම දේශපාලන පක්ෂ භේදයකින් තොරව ඒ දේවල් ලබා දීලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමිය, අපේ පක්ෂයෙන් කිසිම කෙනෙකුගේ සමෘද්ධි දීමනාව කපා හැරියේ නෑ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** කපා හැරියා කියලා නෙමෙයි මම කිවුවේ ඉල්ලීම් කරපු කිසිම කෙනෙකුට ලැබුණේ නෑ කියලා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මන්ත්‍රීතුමිය දැනුවත් වෙන්න ඒ කාරණා වෙලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් නෙමෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැයිස්තුව යැව්වා. නමුත් ඔබතුමාලා යවපු දෙවැනි ලැයිස්තුවෙන් තමයි ප්‍රමුඛතාවය ඉවත් වුනේ. අර ලැයිස්තුව උඩට ගියා ඊට පස්සේ අවංකවම. මම වගකීමෙන් කියනවා කුරුන්ද කන්ද වසමට එක සමෘද්ධි සහනාධාරයක් ලැබුනේ නෑ. මීපාවල වසමට එක සමෘද්ධි සහනාධාරයක්වත් ලැබුණේ නෑ. යවපු ලැයිස්තුවල පවුල් 40 ක් 50 ක් ඉන්නවා. මම අහන්නේ ඔබතුමාලා වගකීමෙන් කියනවාද කුරුන්ද වසමේ, මීපාවල වසමේ සමෘද්ධි දීමනාවක් ලැබිය යුතු පවුල් නෑ කියලද?. නිලදෙණිය වසමේ සමෘද්ධිලාභීන් 34 දෙනෙක් ඉන්න කොට, හපුගල වසමේ සමෘද්ධි ලාභීන් 26 දෙනෙක් ඉන්න කොට කුරුන්ද වසමේ එක් කෙනෙක්වත් නැති වෙන්න හේතුව මොකක්ද. මීපාවල වසමේ එක් කෙනෙක්වත් නැති වෙන්න හේතුව මොකක්ද. ඒ වසම්වල දෙන්න ඕන මිනිස්සු නැද්ද. එතකොට ගොඩකන්ද වසමේ දෙන්නෙක් වෙන්න හේතුව මොකක්ද?. ගොඩකන්ද වසමේ තිබුණ ඒවත් කපලා තිබුණා. මේක සාධාරණද? මේක තනිකර එක්සත් ජාතික පක්ෂයේ අයට අවශ්‍ය විදියට හදපු ලැයිස්තුවක් තමයි දැම්මේ. පාක්ෂිකයෝ තෝරලා අවශ්‍ය ලැයිස්තුවට දැම්මේ. ඔබතුමාලාට පක්ෂය කවුද කියලා හොයා ගන්න බැරුව ගනිපු අයත් ඉන්නවා. නමුත් බොහොම පැහැදිලිව එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ලැයිස්තුවක් හදලා දීපු සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙලක්.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මම මේකට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමියට විරුද්ධ වෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඔබතුමාගේ කොට්ඨාශයේ විසි හය දෙනා අරගෙන බලන්න. මම ඕනනම් මෙතනට ගෙන්වන්නම්. ඔබතුමා වෙනුවෙන් පාප්ප ගාලා පෝස්ටර් අලවපු අයටත් සමෘද්ධි දිමනාව ලබා දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන්න ඇති. මම අහන්නේ පොදුවේ. ඔය කියන්නේ මම දුන්නා කියලා. කොහොමද මෙහෙම වෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරියට තේරුවා නම් ඔබතුමියලා දෙපල කොහොමද සමෘද්ධි දීමනාව ලබා දෙන්නේ. දැන් කිවුවේ අපි දුන්නා කියලා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** පක්ෂ භේදයකින් තොරව ඉල්ලපු ඉල්ලීම් මම සලකා බැලුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කරන්න ඇති. නමුත් අපි කියන්නේ පොදුවේ එක්සත් ජාතික පක්ෂය ලැයිස්තුව හදලා තමන්ට ඕන අයට තමයි සමෘද්ධි සහනාධාරය ලබා දුන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අවුරුදු 20 ක් තිස්සේ එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයෝ සමෘද්ධි දීමනාව නැතුව හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මෙච්චර කල් දුන්නේ ශ්‍රී ලංකා කාරයොන්ට වෙන්න ඇති.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** 1994 ඉදලම සමෘද්ධි දීමනාව දුන්නේ නෑ අපේ පාක්ෂිකයොන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙන්න මේක දාන්න ඕන මාධ්‍යයට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- නමුත් අපි කෑ ගැහුවා. ඉල්ලීම් කලා. එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයොන්ට සමෘද්ධි දීමනාව දුන්නේ නෑ. එතකොට අසාධාරණයක් වුන අයට ලබා දෙන්න තමයි ලක්ෂ හයකට සමෘද්ධි දීමනාව ලබාදෙන්න තීරණය කලේ. ලක්ෂ 06 න් තාම ලබා දුන්නේ ලක්ෂ 02 කට විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා කියන විදියට අවුරුදු 20 ක් එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයොන්ට සමෘද්ධි දීමනාව ගන්න බැරි වුනා. මේ වෙලාවේ ඔබතුමාලා ඉල්ලීම් කරලා ගත්තා. ඒ කියන්නේ ඔබතුමාලා එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයොන්ට තමයි සමෘද්ධි දීමනාව ලබා දුන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- මේ සමෘද්ධි දීමනාව ලබා ගන්න ගමේ ලැයිස්තුව ගත්තේ දේශපාලන අධිකාරියෙන් නෙමෙයි. සමෘද්ධි නිලධාරිතුමියට තමයි සියලු අයදුම්පත්‍ර භාර දුන්නේ. සමෘද්ධි නිලධාරිනිය ඒ ටික ගිහින් දුන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පස් දෙනෙකුගේ කණ්ඩායමක් ගෙයින් ගෙට ගිහින් පරීක්ෂා කරා. ආර්ථික සංවර්ධන නිලධාරිතුමිය, ග්‍රාම නිලධාරිතුමිය ඊට පස්සේ අපේ දේශපාලන අධිකාරියේ කෙනෙකුත් දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔන්න කිවුවා. නිලධාරීන්ගේ කොඳු කැඩුවා. මෙන්න තත්ත්වය මෙතුමන්ලාගේ. දේශපාලන අධිකාරියේ කෙනෙක්ව දාලා නිලධාරීන්ගේ කොන්ද කඩනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දීපු ලැයිස්තුවට නෙමෙයි දුන්නේ. මෙතුමන්ලාගේ දේශපාලන අධිකාරියෙන් දීපු ලැයිස්තුවට ලබා දුන්නේ. මෙන්න සාක්ෂි. මම අහන්න කැමතියි, රජයේ සේවකයෝ සමීක්ෂණයට යනකොට කොහොමද දේශපාලන අධිකාරියේ කෙනෙක් යන්නේ. මොකටද යන්නේ. රජයේ සේවකයෝ සමීක්ෂණයට යනකොට දේශපාලන අධිකාරියෙන් යනවා. මම අහන්න කැමතියි අබේසේකර මන්ත්‍රීතුමාගෙන් ඔබතුමා එකඟද රාජ්‍ය සේවකයෝ සමීක්ෂණයට යනකොට දේශපාලන අධිකාරියෙන් ඔබතුමාලගේ ගැත්තෙක් යවලා ඒවා වෙනස් කරනවාට. මෙන්න සමෘද්ධි සහනාධාරය ලබා දීපු විදිය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- සමෘද්ධි නිලධාරි කාගේ පාක්ෂිකයෙක්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කාගේ පාක්ෂිකයෙක්ද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- පොහොට්ටුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- රජයේ නිලධාරියෙක්. මෙන්න මෙතුමන්ලාගේ දැනුම.

(සභාව ඝෝෂාකාරි විය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- සභාපතිතුමා සමෘද්ධි නිලධාරියෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම සමෘද්ධි නිලධාරියෙක් නෙමෙයි. මම රැකියාවෙන් අස්වෙලා ඉන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- අභියාචනා දාන්න කියන්න අසාධාරණයක් වෙලා තියෙනවානම්. ලක්ෂ 06 න් ලක්ෂ 02 කටයි තාම සමෘද්ධිය ලබා දුන්නේ. තව ලක්ෂ 04 කට සමෘද්ධිය ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා** ඃ- ඇලබඩ වසමේ හතර දෙනෙකුගේ සමෘද්ධි දීමනාව කපලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් කියාස් මන්ත්‍රීතුමා කියන්නේ රජයේ නිලධාරීන් එක්ක ඔබතුමාලගේ දේශපාලන අධිකාරියේ කෙනෙක් යැවුවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ඔව් යැව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මොකක්ද තියෙන සදාචාරාත්මක අයිතිය. රජයේ සේවකයෝ සමීක්ෂණයක් කරන්න යනවා. ඒ අය එක්ක දේශපාලන අධිකාරියේ කෙනෙකුත් යනවා. එතකොට සාධාරණව සමෘද්ධි සහනාධාරය දෙන්නේ කොහොමද?. මෙතුමන්ලා පිළිගන්නවා සම්පූර්ණයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ට තමයි සමෘද්ධිය දුන්නේ කියලා. තමන්ගේ

ගැත්තෙක් දාලා රජයේ සේවකයෝ අධීක්ෂණය කරන්නේ කොහොමද?. එතකොට මොකක්ද රජයේ සේවකයන්ගේ තියෙන ගෞරවය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අභියාචනා දාන්න. අපි දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට ඉතාමත්ම කණගාටු වෙනවා. අනෙක් පැත්තෙන් සතුටු වෙනවා කීප දෙනෙක්ට හරි සමෘද්ධි සහනාධාරය ලැබුණ එක පිළිබඳව. ඒ වගේම ඉතාමත්ම කණගාටුවෙනවා දුප්පත් ග්‍රාමසේවා වසම් වලට එක සමෘද්ධි සහනාධාරයක්වත් හම්බ වෙලා නෑ. දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා රාජ්‍ය නිලධාරීන්ගේ කොන්ද කඩලා ඉතාමත්ම අසාධාරණ විදියට තමයි සමෘද්ධි සහනාධාරය ලබා දුන්නේ. මම ඔප්පු කරලා පෙන්වන්නම්. කොන්ත්‍රාත්කරුවන්ට, තට්ටු දෙක තුනේ ගෙවල් තියෙන මිනිස්සුන්ට, ලක්ෂ ගණන් ආදායම තියෙන මිනිස්සුන්ට මේ සමෘද්ධි සහනාධාරය දීලා තියෙනවා. මාධ්‍ය එනවා නම් මම ඔප්පු කරලා පෙන්වන්නම්. ඕපාත ප්‍රදේශයේ, ලබුදූව ප්‍රදේශයේ සමෘද්ධිය දීලා තියෙනවා තමන්ගේ යටතේ මිනිස්සු පස් දෙනා, දහ දෙනා, කොන්ත්‍රාත් කරන අයටත් දීලා තියෙනවා. තට්ටු තුන හතරේ ගොඩනැගිලිවල උපකාරක පන්ති කරන අයටත් සමෘද්ධිය දීලා තියෙනවා. මම වගකීමෙන් කියන්නේ. අපි කරන්න පුළුවන් හැමදේම කරනවා. දුප්පත් මිනිස්සුන්ට දෙන්න තියෙන දේ මංකොල්ලා කාලා තියෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සමෘද්ධි සංවර්ධන නිලධාරීන් එක්ක කතා කරලා මම වගකීමෙන් කියන්නේ. කුරුන්ද කන්ද කොට්ඨාශයේ 48 දෙනෙක් ඉන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ අය අයදුම්පත්‍ර දැම්මද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 48 දෙනෙක් තේරිලා එක් කෙනෙක්ටවත් ලැබුණේ නෑ. සමීක්ෂණයට ඇවිල්ලා ඔක්කොම කරලා 48 දෙනෙක් තෝරලා එක් කෙනෙක්ටවත් සමෘද්ධි සහනාධාරය ලැබිලා නෑ. එක සහනාධාරයක්වත් ලැබිලා නෑ සමහර වසම් වලට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක සමෘද්ධි නිලධාරීන්ගේ වැරැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමද සමෘද්ධි නිලධාරීන්ට චෝදනා කරන්නේ. ඔයගොල්ලෝ ගැත්තෙක් දාලා ඒ මිනිස්සුන්ව යට කරලා අන්තිමේදී ඒ මිනිස්සුන්ට චෝදනා කරන්න එපා. ඔබතුමාලාගේ දේශපාලන හිතවත්කම් අනුව කට්ටිය දාලා සමීක්ෂණය කරලා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට චෝදනා කරන්න එපා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලැලි ගෙවල්වල ඉන්න අයටවත් සමෘද්ධිය ලැබිලා තිබුණේ නෑ. මේ සමෘද්ධිය දුන්නේ දුප්පත් අයට නෙමෙයි. පාක්ෂිකයන්ට. ඒක සම්පූර්ණ වැරදියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ඔප්පු කරලා පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** තට්ටු හතරේ බිල්ඩින් එකක් තියෙන මනුස්සයෙකුටත් සමෘද්ධිය දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පෙත්සමක් ගහලා නවත්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දුන්නේ ඇයි කියලා ඇහුවම වකුගඩු රෝගියෙක් කිවුවා. එහෙමනම් වකුගඩු රෝගීන් හැමෝටම දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සමෘද්ධි නිලධාරීන් වගකියන්න ඕන එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කියන්න එපා. ඔබතුමන්ලාගේ ගැත්තෝ දැම්මේ ඒ අයව අධීක්ෂණය කරන්න. දැන් සමෘද්ධි නිලධාරීන්ට දොස් කියන්න එපා. ඔබතුමා කිවුවා සමෘද්ධි නිලධාරීන් ඔබතුමාලගේ පක්ෂයේ. ඒ නිසා අධීක්ෂණය කරන්න දැම්මා කියලා. දැන් සමෘද්ධි නිලධාරීන්ටත් දොස් කියනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දැන් සමෘද්ධි නිලධාරීන් දැම්මා නම්, ආර්ථික සංවර්ධන නිලධාරීන් දැම්මා නම්, රජයේ නිලධාරීන් දැම්මා නම්, කොහොමද අබේසේකර ලී බඩු එක අයිති කෙනාට සමෘද්ධිය ලැබුනේ. එයාට කොහොමද ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ජාතිකය තමන්ගේ, අවජාතක වෙනකොට අයිතිකාරයෙක් නෑ. ජාතකය ගැන කියනකොට තමන්ගේ, අවජාතක වෙනකොට අයිති කියන්නේ නෑ දැන්. මාර කතාවක් මේක.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ៖-** සමෘද්ධිය දෙන්න ඕන පක්ෂ භේදයකින් තොරව දුප්පත් මිනිස්සුන්ට. මම කියන්නේ ඒක. කවුරු කරත් කලින් දුන්නේ නැති වුනත් විය යුත්තේ එහෙම. පාක්ෂිකයන්ට පගාව දෙන එක නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම ඉතා වගකීමෙන් කියනවා අපේ ආණ්ඩුව කාලේ දීපු එක හරියටම දුන්නා. ඒ වගේම ඔබතුමාලගේ ආණ්ඩුව කාලේ තමයි 25% ක් කැපුවේ. සහනාධාරවලින් 25% ක් අයින් කරේ ඔබතුමාලගේ ආණ්ඩුව කාලේ. 2001 දී රනිල් මහත්තයා ආපු ගමන් 25% ක් සහනාධාර කැපුවා. ඒ ගොල්ලන්ගේ ආණ්ඩුවෙන් කරේ 2001 දී.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** සමෘද්ධි අධිකාරිය සම්පූර්ණයෙන්ම දේශපාලන අධිකාරියක්. ආපහු කියන්න ඕන නෑ අපි හොඳටම දන්නවා ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක අධීක්ෂණය කරන්න දේශපාලන ගැත්තෝ දැම්මා. වැරදුනහම වගකීම සමෘද්ධි නිලධාරීන්ගේ

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඔබතුමාලා දීර්ඝ වශයෙන් කරුණු පැහැදලි කරානේ. අපිටත් අවස්ථාවක් දෙන්නකෝ.

ගරු සභාපතිතුමනි, මේ සමෘද්ධි සහනාධාරය ලබා දීම සම්බන්ධයෙන් බරපතල ගැටළුවක් මතු වුනා කියලා මෙතනදී තහවුරු වුනා. මේ ප්‍රශ්නය මතුවුනා සම්බන්ධීකරණ කමිටුවේදීත්. පැහැදිලිව සමෘද්ධි සහනාධාරය ලබා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිවෙකුගේවත් විශ්වාසයක් නෑ. අපි දකිනවා ලංකාවේ සාමාජීය ආර්ථික සංවර්ධනයට ගනිපු උපාය මාර්ගයක් විදියට සහනාධාර බෙදිල්ල පාලක පක්ෂයේ ඉඳපු පක්ෂ දෙකම මාරුවෙන් මාරුවට දේශපාලනීකරණය කරා. ඒ රාජ්‍ය යාන්ත්‍රණය හරහා සියල්ල තමන්ගේ ඡන්දගොඩ වැඩි කරගන්න කරේ. එහෙම නැතුව රටේ සංවර්ධනයට, ආර්ථිකය නංවන්න, ජන ජීවිත ගොඩනගන්න සැලසුම් හදනවා වෙනුවට යැපුම් මානසිකත්වයට ජනතාව යොමු කරා. ඒකේ ප්‍රතිඵල නිසා තමයි ලක්ෂ ගාණක පවුල් වලට දිළිඳු සහනාධාර ලබා දෙන තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. අපිට ප්‍රශ්නයක් තියෙනවා පවුල් ලක්ෂ 06 කට සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න තීරණය කරලා තියෙන නිසා. පවුල් ලක්ෂ 06 කට සහනාධාර දෙන්න කාරණා දෙකක් ඉෂ්ට වෙලා නෑ. හිටපු පවුල් වලට දීලා නෑ, සුදුසුකම් තිබුණ පවුල් ලක්ෂ 06 කට දීලා නෑ. නැත්නම් අලුතෙන් පවුල් ලක්ෂ 06 ක් දුප්පත් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒ දෙකම නෙමෙයි. ඊළඟ මැතිවරණ ඉලක්ක කර ගෙන කරන දෙයක් මේ. යන යකා කොරහ බිඳගෙන යනවා වගේ මේ ආණ්ඩුව ඉවර වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඒක තමයි මමත් කිවුවේ. අසූ ගණන් වලදී ග්‍රාම නිලධාරි තනතුර යටපත් කරලා, ඉඩම් නිලධාරීන් පත් කරලා රටේ යාන්ත්‍රණය දේශපාලනීකරණය කරා. මේ පාලකයෝ මාරුවෙන් මාරුවට මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණය තමන්ගේ දේශපාලන අභිමතයට යටපත් කරලා මුළු රාජ්‍ය යාන්ත්‍රණයම දේශපාලනීකරණය කරලා ඡන්ද ඉලක්ක කරගෙන දේශපාලනය කරා. මේ විදියට රටක් පාලනය කරන එක වැරදියි. රටක් පාලනය කරද්දි සංවර්ධන උපාය මාර්ග ඕන අපේ රටේ අනාගත සැලසුම් ඉලක්ක කරගෙන. ඒ වෙනුවට කරන්නේ තමන්ගේ ඡන්ද ගොඩ ඉලක්ක කරගෙන යැපුම් මානසිකත්වයට මිනිස්සුන්ව පත් කරන එක. ඒ නිසා තමයි අපි රටක් හැටියට මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. අපි ජනතා විමුක්ති පෙරමුණ විදියට මේ පාර්ශවයන් දෙකට, මෙතෙක් කල් මේ රට පාලනය කළ සියලුම පාලකයන්ට එරෙහිව ක්‍රියාකරනවා. දුප්පත්කම යැපීමක් කර ගත්තට අපි විරුද්ධයි. රටේ තියෙන ආර්ථික දරිද්‍රතාවය තමන්ගේ යැපීම් මාර්ගයක් කර ගන්න නරකයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** අපේ පාක්ෂිකයෝ අවුරුදු 20 ක් විතර හූල්ල හූල්ල හිටියේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** එහෙම හූල්ල හූල්ල ඉන්න එක තමයි ප්‍රශ්නය තියෙන්නේ. එහෙම හූල්ලනකොට තමුන්නාන්සේලාගේ මඩිය තර වෙනවා. ඒ දරිද්‍රතාවය නඩත්තු කරේ අපිද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පහුගිය ආණ්ඩුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පහුගිය ආණ්ඩුව සමෘද්ධිය දුන්නේ නැද්ද?. ඊට කලින් ආණ්ඩු ජනසවිය දුන්නේ නැද්ද?. ඉතිහාසය පුරාම මේ රටේ දරිද්‍රතාවය යැපීම් මාර්ගයක් කර ගන්න පත්වුණ ආණ්ඩු හැම එකක්ම ක්‍රියා කරා. මේ රටේ ආර්ථිකය හදන්න කාටවත් සැලසුමක් නෑ. අපි කියන්නේ මේ ක්‍රමවේදය සහමුලින්ම වෙනස් විය යුතුයි. යැපුම් මානසිකත්වය වෙනුවට සංවර්ධන මානසිකත්වයක් හදන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සමෘද්ධි සහනාධාරය ගැන කතා කරන කොට මෙතනදී ඉදිරිපත් කිරීමක් කරා සමෘද්ධිය කැපුවේ නෑ කියලා. මගේ කොට්ඨාශයේ සමෘද්ධි සංගමයේ හිටපු සභාපතිතුමිය තමයි නිවාස අධීක්ෂණයට ගියේ. එතුමියගේත් සමෘද්ධිය කපලා තියෙනවා. එතනින් විතරක් නැවතිලා නෑ. එතුමිය මට චෝදනා ඉදිරිපත් කරපු වෙලාවේ කිව්වා. වික්‍රමසිංහ - සිරිසේන ආණ්ඩුව ආවේ මිනිස්සුන්ගේ පර්ස් එක පුරවලා ආර්ථිකය සවිමත් කරලා යන්න කියලා. ලක්ෂ 14 ක් වෙච්ච සමෘද්ධි ලාභීන් ප්‍රමාණය ලක්ෂ තුනකට හතරකට අඩු කරලා ආර්ථිකය සංවර්ධනය කරයි කියලා අපි හිතුවේ. තවත් ලක්ෂ 06 ක් ඒගොඩට එකතු කරලා මේ ජනතාව හිඟන තත්ත්වයට පත්කිරීම පිළිබඳව වික්‍රමසිංහ - සිරිසේන ආණ්ඩුවට මාගේ අප්‍රසාදය පළ කරනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** බොහොම ස්තුතියි ඩඩ්ලි මන්ත්‍රීතුමා. ෆයිනස් කැලෑවෙන් පටන් අරගෙන සමෘද්ධි දීමනා ලබා දීමේ කාරණාව පිළිබඳ අපි ගොඩක් දැනුවත් වුනාට.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂ නායක කියාස් මන්ත්‍රීතුමා අපිට හොඳ කරුණු ටිකක් හෙළි කරා. අපි ඇහුවා අධීක්ෂණය සඳහා නිවෙස්වලට කවුද ගියේ කියලා. හොඳම කතාව මේක තමයි. ග්‍රාම නිලධාරිතුමිය ගියා. ආර්ථික සංවර්ධන නිලධාරිතුමිය ගියා. සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමිය ගියා. හැබැයි මේ නිලධාරීන්ගේ රාජකාරියට බලපෑම් කරන්න ශාඛා සමිතිවල නිලධාරියෙක් යැවුවේ නැද්ද?. යවලා තමුන්ගේ හිතවත් පාක්ෂිකයොන්ට සමෘද්ධිය ලබා දෙන්න කටයුතු කරා. අපේ කාලය තුල එක ශාඛා සමිති නිලධාරියෙක් යවලා අපි ඒ රාජකාරි වලට බාධා කරේ නෑ. අපි නිවැරදිව ඒ දේ කලා. අපේ ගම්වල සමෘද්ධි සමිතියේ ඉන්නවා එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයෝ. එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ සභාපතිත් ඉන්නවා. අපි කවදාවත් බාධා කරන්නේ නෑ. හැබැයි ඔබතුමාලා මේ වෙලාවේ හැසිරුනේ තමුන්නාන්සේලාගේ දේශපාලන අනාගතය ගැන හිතාගෙන ලක්ෂ ගණන් ඔබතුමන්ලාගේ පාක්ෂිකයොන්ට සමෘද්ධිය ලබා දෙන එක. හැබැයි අපිට වේදනාවක් තියෙනවා. ඉතාම පිළිකුල් සහගතව හෙලා දකිනවා. ගම්වල තියෙන ප්‍රාදේශීය ශාඛා සමිතිවල නිලධාරීන් රජයේ නිලධාරින් එක්ක ගිහිල්ලා ඒ සාධාරණ තීන්දුව වෙනස් කරපු එක ගැන. ඒ කාරණය මම සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒ කතාවට මම ඇත්තටම විරුද්ධ වෙනවා. ඒක පාර්ශවීය තින්දුවක් අරගෙන සියලු දෙනාට චෝදනා එල්ල කරන්න එපා. ගිංගඟ මිටියාවතේ වැලි ගොඩදාලා ජීවත්වෙන පවුල් ගණනාවක් හිටියා. වැලි ගොඩ දැමීම තහනම් නිසා ජීවත් වෙන්න රැකියාවක් නැතිව ඉදපු ඒ මිනිස්සු කුලී වැඩ කරලා ජීවත් වුනේ. ඒ පවුල් වලටත් ලබා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි පිළිගන්නවා. ලබා දිය යුතු කොටසකටත් ලබා දුන්නා. පොදුවේ ගත්තම එක්සත් ජාතික පක්ෂයේ බලපෑම් යටතේ දුන්නේ. ලැයිස්තුව යැව්වේ එක්සත් ජාතික පක්ෂයෙන්, අපි කියන්නේ ඒකයි. දැන් මෙතුමා බොහොම පැහැදිලිව කිව්වා තමන්ගෙ කෙනෙක් යවල තමයි ලැයිස්තුව හැදුවෙ කියලා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපි කාන්තා මන්ත්‍රීවරියෝ තුන්දෙනාම කිසිම දේශපාලන බලපෑමක් කලේ නෑ. ඒ නිලධාරීන්ට එයාලගෙ රාජකාරිය කරන්න ඉඩ ලබා දුන්නා. ගමේ ඉන්න සියළුම අසරණ මිනිස්සුන්ට අපි අවස්ථාව ලබා දුන්නා. අපිටත් දුක දැනෙනවා, අන්න ඒ හේතුව මත මම කියන්නේ අපි වැඩ කරපු හැටි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට එක එක්කෙනා එක විදියක්. මරු, ඒක ෂෝක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මට අවස්ථාව ලබාදෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හා කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ කාංචනා මන්ත්‍රීතුමිය මගේ ඥාති සහෝදරිය හොඳ ප්‍රශ්නයක් මතු කරල දීල හොඳ සංවාදයක් ගොඩනැගුවා. ඒක හොඳයි. හැබැයි ඉඩ කඩ දීලා අනිත් මන්ත්‍රීවරුන්ටත් කතා කරන්න අවස්ථාව ලබා දුන්නා නම් තමයි දෙගොල්ලොන්ටම හොඳ. මොනව උනත් එකක් තියෙනවා සුසිල් සිරිවර්ධන මහත්තයා මේ සමෘද්ධි ව්‍යාපාරය නිර්මාණය කරනකොට බිලී කොක්කක් දෙන්න මිසක් මාළුවෙක් ලබාදෙන්න නෙවෙයි අදහස් කලේ. නමුත් එකක් තියෙනවා එදා ඉඳපු අපේ දේශපාලඥයෝ, අපේ හිටපු දේශපාලඥයෝ සියළුම දෙනා මේ බිලී කොක්කක් වෙනුවට දුන්නේ, අද දෙන්නෙත් මාළුවෙක්. ඒක තමයි ඇත්ත කතාව. හැබැයි එකක් තියෙනවා අපේ ආණ්ඩුවකට, දැන් මම මේ ඉන්න ආණ්ඩුවට ඉගෙන ගන්න පාඩම් ගොඩක් තියෙනවා. මේක මෙහෙමම කියන්න ඕන. අපිට කරගන්න ඕන දේ කරගන්න ඕන උනාට ඒක කරන විදිය ඉගෙන ගන්න එපැයි. කියාස් මන්ත්‍රීතුමා කියපු එක හරි. අපේ නියෝජිතයෙක් ගියා. ඒ ගියාට අපි නිලධාරීන්ට බලපෑම් කරානම් ඒ නිලධාරීන්ට ඕන තැනකට පැමිණිලි කරන්න පුළුවන්. අපි බොහොම සාධාරණව කතා කරමුකෝ. කවුද මේ නිලධාරීන් හතර දෙනා. අපේ පාක්ෂිකයො දාල යනව වගේ ඒ කාලේ පාක්ෂිකයො දාල යවන්න ඕන නෑ. සමෘද්ධි නිලධාරියා කියන්නේ අනිවාර්යයෙන්ම ඔබතුමාලා අපි හිටපු පක්ෂයේ කෙනෙක්. තව සාමාජිකයෝ දාලා යවන්න ඕන නෑ දෙන්න ඕන කාටද කියල බලන්න. ආර්ථික සංවර්ධන නිලධාරී කියල දෙන්න ඕන නෑ. හැබැයි එකක් තියෙනවා මේක කියන්නේ හඬ නගල කියන්න වෙන තැනක් නැති නිසා. දැන් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා රටේ යමක් කමක් තේරෙන දිග දකින නායකයෙක් හිනා වෙන්න කමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිග දකිනවා කිව්වේ මොකක්ද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නම්. ඇත්තටම ඇයි ඇහුම්කන් දෙන්න බැරි. ඔබතුමා මටනේ කියන්නේ හැමතිස්සෙම ඇහුම්කන් දෙන්නේ නෑ කියලා. ඒ නිසා ඇහුම්කන් දෙන්න.

ඇත්තටම මොනව නැතත් පාඩම් දෙකක් ඉගැන්නුවා. ඒ තමයි පහුගිය 2002 දී අවුරුදු දෙකක පාලන කාලය තුළදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා කටු අත්තේ මල් පිබිදුවා. රටේ ආර්ථිකය හදල තමයි එතුමා රස්සාවල් දෙන්න ගියේ. මොකක්ද උනේ. එතුමා රට ගිහිල්ල එනකොට චන්ද්‍රිකා මැතිණිය අරගත්තා. ඒක ඉවර උනා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ආවම උපාධිධාරී 45000කට රැකියා ලබා දුන්නා. ඇත්තටම රස්සාවල් දෙන්න ඕන තමයි. හැබැයි දුකක් හිතෙනවා අද දැක්කොත්, අවුරුදු හතරක් විශ්ව විද්‍යාලෙ හිටපු, අවුරුදු 13 ක් පාසල් අධ්‍යාපනය ලබපු බුද්ධියෙන් වැඩ ගත්තද? අදටත් නෑ. මේ ඊයෙ පෙරේදා වජිර අබේවර්ධන මැතිතුමා වාඩි වෙන්න තැන්, ඉන්න තැන් හදල දෙනකම් මුකුත් නෑ. වෙනද දවල් 12 වෙනකොට පුටු ටික, බංකු ටික එකතු කරලා තමයි කෑම කන්නේ. කෑම කන්න තැනක් නිර්මාණය වෙලා තිබුනේ නෑ. දැන් තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යාල හැදෙන්නේ. අගතිගාමී විදියට අරගෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් කරා. මේ දවස් 52 ටත් රස්සාවල් දුන්නා. නීත්‍යානුකූල නැති ආණ්ඩුවෙනුත් රස්සාවල් දුන්නා. දැන් මේ අවුරුදු 20 ක් විතර දුක් විඳපු මිනිස්සු ඉන්නව නේ. සුදුසුකම් තියෙන අයට හරි රස්සාවක් ලබා දෙන්න ක්‍රමවේදයක් හදන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දෙපැත්තෙන්ම සැප වින්දනේ. මම කියන්නේ ඔබතුමා දුක්විඳින පැත්තේ හිටියේ නෑ. දැන් මිනිස්සු දුක් විඳිනවා. එක්සත් ජාතික පාක්ෂිකයෝ අවුරුදු 20 ක් දුක් විඳිනවා මේ කියන විදියට. ඔබතුමා ඒ කාලෙත් සැප වින්දා. දැනුත් සැප විඳිනවා. ආයෙම අපේ ආණ්ඩුව ආවම ඒ පැත්තට ඇවිත් සැප විඳීවි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හැමදාම දේශාපාලනය කරන්න බලාපොරොත්තුවක් නෑ. මම ඔබතුමාට කියන්නම්. මේ අහන්න ඔබතුමා මතක තියාගන්න මේ දීපු එකේ අපිට බනිනවා අපේ ගම් වල ඉඳපු මිනිස්සු. මොකද දෙන්න ඕන අයට දුන්නේ නෑ. නාවින්නේ තොග ගණනක් හැලිලා තියෙනවා. දෙන්න ඕන සාධාරණ මිනිස්සුන්ට දීල නෑ. කවුද කැපුවේ? මේක සත්‍ය කතාවක්. කැපුවෙ කවුරුවත් නෙවෙයි නිලධාරීන්. ඉතාම නරක විදියට නිලධාරීන් කැපුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ඒකට අපේ අප්‍රසාදය පල කරනවා. නිලධාරීන් නෙවෙයි කැපුවේ. වෙච්ච දේ මම කියන්නම්. මෙහෙන් යවපු ලැයිස්තුවට ප්‍රමුඛතාවය දීල යැවුවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් යවපු ලැයිස්තුව ප්‍රමුඛතාවය දීල යැවුවේ. ඔබතුමාල යවපු ලැයිස්තුව ඔබතුමාල දීපු ටික තෝරල දුන්නේ. එතනදී උඩ තිබුන ටික කැපුනා. ඔබතුමාලාගේ ඒවට ප්‍රමුඛතාවය දෙන්න ඕන හින්දා උඩ ඒවා කැපුනා. ඒක කරේ නිලධාරීන් නෙවෙයි. ඔබතුමාලා. ඔබතුමාල යවපු ලැයිස්තුව නිසා කැපුවේ. අසරණ නිලධාරීන්ට චෝදනා කරන්න එපා. නිලධාරීන්ට

මේ වෙලාවේ චෝදනා කරනවට මම විරුද්ධයි. ඔබතුන්ලාගේ හෙන්චයියො දාලා අධීක්ෂණය කරලා අන්තිමට වැරද්ද නිලධාරීන් පිට දාන්න එපා. වැරද්ද ඔබතුමාල පිළිගන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ 86% ක් මට ඡන්දය ලබා දුන්නා. මම ඒ නිලධාරීන්ට කිවුවේ එක්කෙනෙක්ටවත් කපන්න කියන්නෙත් නෑ මම, එක්කෙනෙක්ටවත් දෙන්න කියන්නෙත් නෑ මම. අයදුම්පත්‍ර දැම්මම ඔබතුමාලා තෝරන්න. ඔබතුමාලා ලැයිස්තුව හදන්න. අල්ලා දෙවියන් පල්ලා, බුදු හාමුදුරුවෝ පල්ලා මම කිවුවෙ එහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බුදු හාමුදුරුවෝ ගැන කියලා දිවුරන්න එපා. වෙන ඕන එකක් ගැන කියලා දිවුරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ නිලධාරීන් ගෙන්නල අහන්න. අපි කවදාවත් එහෙම කරේ නෑ. කැපිලා තියෙනවා සමහරු. ඒකට මටත් පුදුමයි. ඒ අයට අපි ආයෙත් ඉල්ලුම් කරන්න කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි. ඔබතුමත් කිවුවා, අබේසේකර මන්ත්‍රීතුමත් කිවුවා අපේ නියෝජිතයො යැවුවා කියලා අධීක්ෂණයට. ඒක බොහොම පැහැදිලිව කිවුවනේ. ඒ ඇති. අපිට දැනගන්න ඕන උනෙත් ඒ ටික තමයි. වෙච්ච අසාධාරණේ ගැන අපේ දුප්පත් අහිංසක මිනිස්සු බලාගනීවි. ඔහොම නියෝජිතයෝ යවල කරපු අසාධාරණය ගැන දුප්පත් අහිංසක ගම්වල මිනිස්සු බලා ගනීවි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මම කුරුන්ද කන්දේ ෆයිනස් වගාව ගැන කතා කරේ. ඒ ෆයිනස් වගාව ඉවත් කරලා දේශීය වන වගාවක් දාන්න මම යෝජනා කරේ. කාංචනා මන්ත්‍රීතුමිය ඒ යෝජනාවට වඩා වැදගත් තව දෙයක් දැම්මා. මම කිවුවෙ වෙන කතාවක්. එතුමිය කිවුවෙ වෙන කතාවක්, ඒ නිසා ඒකට වැඩිය මේක වැදගත් කියලා කියන්න බෑ. මගේ යෝජනාව මට වැදගත්. ඒකට වතුර දාන්න ඕනද නැද්ද කියලා මම දන්නේ නෑ. ඇට මැස්ස කියන කන්දේ අක්කර 40 ක් දේශීය වන වගාව කරානම් අඩෙවි වන නිලධාරී කාර්යාලය, මේක කරන එක ඒ අය බලා ගනීවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇට මැස්ස කන්ද අපි බලන්න යමුද? ඒක කොහෙද තියෙන්නේ?

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** බෝගහගොඩ. දේශීය වන වගාවක් දාලා සාර්ථක උන තැනක් ඒක. අඩෙවි වන නිලධාරීන් ඒක කරාවි. මේ යෝජනාව දාන්න. ක්‍රියාත්මක කරනකොට අවශ්‍ය විදියට කරගනීවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 23.** වටරක නැගෙනහිර සිරිගුණසිරි මාවත (උස් ඒදණ්ඩ පාර) සංවර්ධනය කිරීමට ඇති බාධාවන් ඉවත් කොට මාර්ගයේ මායිම් ලකුණු කරන මෙන් යෝජනා කරමි.

දැන් උස් ඒදණ්ඩ පාර සංවර්ධනය කරගෙන යනවා මගේ යෝජනාවක් විදියට දාලා. එතන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. පාර අල්ලලා තියෙනවා ආවරණය කර ගෙන. ඒ නිසා පාරේ පටුවීමක් තියෙනවා. කරුණාකරලා සභාපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා උස් ඒදණ්ඩ මාර්ගයේ පළල ලකුණු කරලා දෙන්න කියලා. ඒ පාරේ කාණු පද්ධතිය හදන්න ඕන. කාණු පද්ධතිය හදන්න වෙන්නේ අර පාර අල්ල ගනිපු කොටස අතඇරලා. එතකොට පාර තව ඇතුලට එනවා. ඒක නිසා පාරේ මායිම ලකුණු කරලා දෙන්න. කාණු පද්ධතිය යනවා පාරේ දෙපැත්තෙන්ම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ඒකට අදාළ අවහිරතාවය ඉවත් කරලා දෙන්න සභාවෙන් කරන්න පුළුවන් දේ කරලා දෙන්න.

<u>**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- **24.** පාස්කු ඉරිදා දින සිදු වූ ප්‍රහාරයෙන් රටේ ජාතික ආරක්ෂාව සහ සාමාන්‍ය ජන ජීවිතය ගොඩනැගීමට නොහැකි වූ ආණ්ඩුව වහා ඉවත් විය යුතු බව ප්‍රාදේශීය මට්ටමින් බලකරන ලෙස යෝජනා කරමි.

ඇත්තටම මම මේ යෝජනාව කියන්න කලින් මේ ආණ්ඩුවේ තියෙන දුර්වලකම්, ඊට කලින් ආණ්ඩුවේ තිබුණ දුර්වලකම් මිනිස්සු කොයිතරම් දුප්පත් වෙලාද මේ ප්‍රහාරයෙන් පස්සේ සාමාන්‍ය ජන ජීවිතය කොයි තරම් අවුල් වෙලාද ජාතික ආරක්ෂාව කියන්නේ මොකක්ද කියලා තැකීමක් නැතුව පුදුමාකාර විදියට සහනාධාර බෙදන්න ගත්තා දෙගොල්ලොම. 1994 ඉඳන් ඒ අය බෙදපු විදියයි, දැන් මේ අය හැන්දෙන් බෙදන විදියයි බැලුවහම සාමාන්‍ය මිනිස්සුන්ට ලැබුණද වෙනම සමීක්ෂණයක් කරන්න වෙනවා. ඒ කියන්නේ කාටද මේක ලැබිලා තියෙන්නේ. ලැබිච්ච ජනතාව කවුද? නොලැබිච්ච ජනතාව කවුද කියලා ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ යෝජනාව ඔබතුමන්ලාගේ පක්ෂයෙන් පාර්ලිමේන්තුවට ගෙනල්ලා තියෙනවා. ඒක විශ්වාසභංගයක්. ඒක පරාද වුනාම උද්ඝෝෂණ කරන්න ඕන නෑ. ආණ්ඩුව ඉබේම විසිවෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- උද්ඝෝෂණයක් නෙමෙයි මේ. ප්‍රාදේශීය සභා මට්ටමින් ඉන්න මන්ත්‍රීවරුන්ට ඔබතුමන්ලාගේ ආසනයේ ඉන්න ආසන සංවිධායකතුමාට කියන්න පුළුවන් මේ ආණ්ඩුව සම්බන්ධව.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදර මන්ත්‍රීතුමා විසින් මේ සභාවට ගෙනාපු පවතින රජය ඉවත් කළ යුතුයි කියන යෝජනාව ඉතාමත්ම ඕනෑ කමින් හා ඉතාමත්ම සතුටින් සභා සම්මත කරන්න ඕන.

එතුමාලා 2015 ජනාධිපතිවරණය වෙලාවේදී මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාට සහයෝගය පලකරලා විශාල වශයෙන් උදවු කරපු පක්ෂයක්. ඊට පස්සේ කීප අවස්ථාවකදීම ආණ්ඩුවේ පැවැත්ම වෙනුවෙන් උදවු කරපු පක්ෂයක්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- සභාපතිතුමා මගේ වෙලාව මේක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ රජය වහා පෙරලා දැමිය යුතුයි කියලා අදහසක් එනවා නම් මේ පක්ෂයේ අයට, මේ රජය ගහලා පන්නන්න ඕන කියලා අදහසක් එන්න ඕන සාමාන්‍ය ජනතාවට. ඒ නිසා අපි කියනවා තමුන්නාන්සේලාට තේරුම් ගන්න අද මේ රටේ පවතින ආණ්ඩුවට මොකක්ද වෙලා තියෙන්නේ. මේ රජයට ප්‍රජාතන්ත්‍රවාදි අයිතිය අනුව ඡන්දයක් පවත්වන්න බෑ. පළාත් සභා ටික විසුරවලා දැම්මා. අද වෙනකන් ඡන්දයක් තියා ගන්න බෑ. ඡන්දයට බය රජයක්. ඒ වගේම මේ රටේ සාමාන්‍ය ජනතාවට කිසි ලෙසකින්වත් ආරක්ෂාව සැපයීමේ හැකියාවක් නෑ. මේ රජය ගෙදර යැවිය යුතුයි කියන තැන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉන්නවා. ඒකට තමුන්නාන්සේලාට වඩා ඉදිරියෙන් අපි ඉන්නවා. ඒ නිසා අපි ගෙනාපු යෝජනාවක් ජනතා විමුක්ති පෙරමුණ හිටපු ගමන් ගෙනාපු එක අපි අගය කරනවා. අද බලන්න රතන හාමුදුරුවෝ කොහේද ඉන්නේ. අද උදේ තමුන්නාන්සේලා මලබෙර හඬවමින් මිනි පෙට්ටියක් ගෙනාපු වෙලාවේ මට සිහි වුනේ මේ යන්නේ එක්සත් ජාතික පක්ෂයේ මලගම කියලා. මේ එන්නේ එක්සත් ජාතික පක්ෂයේ අවසානය කියලා. තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා තව මාස හයකින් අපේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ක්‍රියාත්මක කරලා මේ නොහැකියාවෙන් පෙලෙන කිසිම කාර්යයක් කරගන්න බැරි මේ අකර්මන්‍ය රජය ඉවත් කරනවා. ජනාධිපතිතුමයි, අගමැතිතුමයි දික්කසාද නඩුවක ජෝඩුව වගෙයි. ජනාධිපතිතුමා අගමැතිතුමාට බනිනවා. අගමැතිතුමා ජනාධිපතිතුමාට බනිනවා. මේ දෙන්නා හරියට දික්කසාද නඩුවක ජෝඩුව වගෙයි. මේ වගේ මිනිස්සුන්ට ආණ්ඩු කරන්න පුළුවන්ද?. අපිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැතුව ඕනම ඡන්දයක් ජයග්‍රහණය කිරීමේ හැකියාව තියෙනවා. අපි තමුන්නාන්සේලාට මතක් කර දෙන්න කැමතියි අපි 2020 ලබන කොටම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ ප්‍රගතිශීලි ජනතාව එකතු කරගෙන මේ රටේ ස්ථාවර රජයක් ගොඩනගන්න උත්සාහ දරනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බන්දුතිලක මන්ත්‍රීතුමා ඔබතුමා කියන්නකෝ. කියන්නකෝ ඉතිං.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ඔබතුමා එතුමා කතා කරන කොට කලබල වුනේ නෑ නේ. මමත් කතා කරනකං ඉන්න. මම එතුමාට කියනවා එතුමාගේ ප්‍රකාශය දේශපාලන වේදිකාවක කරන්න. ඒකට කමක් නෑ. ඉදිරියට මැතිවරණයක් එනවානේ. 2005 ජනාධිපතිවරණයේදී මහින්ද මහත්තයට ඔය කියන කිසිම අංකුට්ටෙක් හිටියේ නෑ. අපි දන්නවා. අපි 2005 දී දේශපාලනය කරේ මහින්ද මහත්තය දිනවන්න තමයි. හැබැයි ඔය කියපු එක කකුලක්වත් එදා එතන හිටියේ නෑ. අඩුම තරමේ ගමක පෝස්ටරයක්වත් අලවන්න කෙනෙක් හිටියේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට අපි නිකං හිටියා. ඔබතුමාලා හැමදාම කරේ ඕකනේ. ඔබතුමාලා හැමදාම කරේ රටේ නායකයෙක් පත්කරලා කකුලෙන් අදින එක. හැමදාම කරේ මේක. අපි එදා ඉඳන් අද දක්වා කෙලින් හිටියා. ඔබතුමාලා කරන්නේ රටට නායකයෙක් පත් කරලා බෙල්ල මිරිකලා පහළට ඇදලා දාන එක.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- 2005 දී අපි මැතිවරණයට වැඩ කරා. අපිත් කැන්වසින් ගියා. තමුන්නාන්සේලා කැන්වසින් ගිය හැටි අපි දැක්කා. අපේ පළාතේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්නකෝ 2005 දී අපි කැන්වසින් ගියේ කොහොමද කියලා. එදා එක්සත් ජාතික පක්ෂයට බයේ තමුන්නාන්සේලා හැංගිලා හිටියේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි අපි නිකංම ඉන්නම්. ඔබතුමාලා ආණ්ඩුව පෙරලන්නකෝ. අපි බලන් ඉන්නම් ආණ්ඩුව පෙරලන හැටි. හැබැයි කතාව නෙමෙයි ක්‍රියාව තමයි වටින්නේ මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂය වැටෙන හැම වෙලාවකම උදවු කරලා තියෙනවා. දැන් කියනවා ආණ්ඩුව පෙරළන්න කියලා. විහිළු කතා කියන්න එපා මන්ත්‍රීතුමා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මට ප්‍රශ්නයක් තියෙනවා මේ සභාවේ මීට කලින් මයික්‍රෆෝන දෙකයි ක්‍රියාකරේ. දැන් තුනක් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මයික් එකක් ඔන් වෙන එක ප්‍රශ්නයක් නෙමෙයිනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- අපි අහන්නේ මීට කලින් එහෙම තිබුණේ නෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතනින් ඔක්කොම උනත් ක්‍රියාත්මක කරන්න පුළුවන්. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කතා කරන කොට මයික් එකක් ක්‍රියාත්මක වෙලා තිබුණේ නෑ. ඒකේ රෙකෝඩින් එක ලබා ගන්න ඕන නිසා තව මයික් එකක් ක්‍රියාත්මක කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම නම් සභාවේ අනිත් අයටත් ඒ අවස්ථාව ලබා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- ඃ-** ඔබතුමා දැනුත් කරන්නේ ඒ වැඩේනේ. දැනුත් එතුමගේ අවස්ථාව ඔබතුමා ගන්නවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කතා කරන කොට ඔබතුමා ඇහුවද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කතා කරන්න අවස්ථාව දුන්නම ඔබතුමා කතා කරන්නේ නෑ. එක එක්කෙනාගෙන් ප්‍රශ්න අහන එක කරන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ප්‍රශ්න නෙමෙයි මගේ කතාව කරන්න ඉඩ දුන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කතා කරන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- **25.** සම්ප්‍රධායික වඩු කර්මාන්තය තහනම් කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් ගත් තීරණය වහා ඉවත් කරන ලෙස ප්‍රාදේශීය සභා මට්ටමින් බල කරන ලෙස යෝජනා කරමි.

මේ යෝජනාව ගේන්න ප්‍රධානම හේතුව වුනේ සාම්ප්‍රදායක වඩු කර්මාන්තය කියන්නේ බුද්ධාගම මේ රටේ පැවත එන්නට පටන් ගත්තට පස්සේ ආපු කලාව හා නිර්මාණශීලිත්වය, වෙහෙර විහාරස්ථාන ඉදිකිරීම ඇතුළු සියළුම ක්ෂේත්‍රයන්, කැටයම් නිර්මාණ ශිල්පය පවා දියුණු වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ කලින් යෝජනාව ස්ථිර වෙලා සභා සම්මත වුනේ නෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- මෙතුමා ස්ථිර කරේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ආණ්ඩුව ඉවත් විය යුතුයි කියන යෝජනාවට මම බෙදීමක් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමකට ගිහින් අපිට ආණ්ඩුවට පක්ෂ වෙන්න බැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ඔබතුමා බෙදීමක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමකට යන්න ඕන නෑ. අපිට ඇත්තටම පක්ෂ වෙන්න බැනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේක ආණ්ඩුවට පක්ෂ වීමක් නෙමෙයි. මෙතුමන්ලා දින 52 ආණ්ඩුව වෙලාවේ විශ්වාසභංගයක් ගෙනාවම ඒකට මෙතුමන්ලාට විරුද්ධ වෙන්න බැරි වුනා. මෙතුමන්ලා එතකොට වර්තමාන ආණ්ඩුවේ අයත් එක්ක හිටියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන කාරණාව නිවැරදියි. ඒවගේම මේ දෙවැනි කාරණාවත් සභාවකට එන්න ඕන නෑ. ඔබතුමන්ලා ජනාධිපතිතුමාට කිවුවා නම් හරි. ඔබතුමන්ලාගේ නායකයෝ නිතරම ජනාධිපතිතුමාව හම්බවෙනවානේ. ඒ වෙලාවක කිවුවා නම් මේ ප්‍රශ්නය මේ තරම් දුර යන්නේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා වාඩිවෙන්න. එතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න අරින්න. අන්තිමට ඔබතුමාලාම මට කියනවා මේ සභාව මම පාලනය කරන්නේ නෑ කියලා. දැන් අදහස් දක්වන්න අවස්ථාව දෙන්න බෑ. කරුණාකරලා වාඩිවෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම කියන්න ගියේ මේ වගේ යෝජනාවක් ගෙනාවම සභාව තුල කුලප්පුවීම් ඇති වෙනවා. වඩුකර්මාන්තය ඉවත් කරන්න කියලා යෝජනාවක් ආණ්ඩුව ගෙනල්ලා නෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ජනාධිපතිතුමා කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කිවුවට එහෙම යෝජනාවක් ගෙනල්ලා නෑ. ගැසට් කරලත් නෑ. ගෙනල්ලත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි හරි ඔන්න ඕක ස්ථිර කරන්න අරින්න. කියාස් මන්ත්‍රීතුමා වාඩිවෙන්න. ඕන දෙයක් කරන්න අරින්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගේනවද නැද්ද කියලා දන්නේ නෑ. ජනාධිපතිතුමා මේ ගැන ප්‍රකාශයක් කරා. ගනිපු තීරණයක් තියෙනවා. ජනාධිපතිතුමා කොහේදි හරි රැස්වීමකදී ප්‍රකාශයක් කරා. ගමේ වඩු මඩු ටික වහලා වෙනත් රස්සාවක් හොයා ගන්න කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ ජංගම වඩු මඩු වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි හරි ඕන එකක් ගේන්න කියන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- පස්සේ නිවැරදි කරේ. මුලින් කිවුවේ ගමේ වඩු මඩුව වහන්න කියලා. වෙන රස්සාවක් හොයා ගන්න කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- **26.** අම්බලන්වත්ත, බැදිපාරට හැරෙන මංසන්දියේ බෝක්කුව අබලන් වී ඇති බව මීට ඉහතදී සභාවට යෝජනා කළ නමුත් මෙතෙක් එය සිදු වී නොමැති බැවින් වහා එය පිළිසකර කර දෙන මෙන් සභාවට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනට දාන්න ගෙනාපු සිලින්ඩර් දෙක පිපිරුවානේ. දැන් අලුතින් සිලින්ඩර් දෙකක් ගෙනත් තියෙනවා ඒක දානවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- තාම දාලා නෑ ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉදිරියේදී දානවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- තාම එතන තියෙනවා හැබැයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම තියෙද්දි දාන්න බෑනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- එහෙම තියෙද්දි වතුර බහින්නේ නෑ. වහිනකන්ම ඉන්නවද දාන්න. හොඳට වහිනකන්ම ඉඳලා දාන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- **27.** කපුහෙම්පල බල ප්‍රදේශයේ කුඩා බිම් ප්‍රමාණවල ජීවත්වෙන ජනතාවට කසළ බැහැර කිරීමට තැනක් නොමැති හෙයින් එම අතුරු මාර්ගවල අත් ට්‍රැක්ටරයක් දමා හෝ කුණු ඉවත් කරන මෙන් යෝජනා කරමි.

කපුහෙම්පලට විතරක් නෙමෙයි මේ ප්‍රශ්නය සීමා වෙන්නේ. බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ පර්චස් 07 ක 10 ක වගේ ඉඩම්වල ඉන්න පවුල්වල අයට මේ ප්‍රශ්නය බලපානවා. මොකද ඔවුන්ගේ දෛනික කසළ ටික ඉවත් කර ගන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. මේ සම්බන්ධව සභාව යම් ක්‍රියාමාර්ගයක යෙදෙනවානම් අඩුම තරමේ අත් ට්‍රැක්ටරයක් හරි දාලා අතුරු මාර්ගවල යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුණු දාන්න මොකක්හරි නිසි ක්‍රමවේදයක් හරි, මොකක්හරි ක්‍රමවේදයක් හැදෙනකම් අලුතෙන් කුණු එකතු කරන්නේ නෑ. පහුගිය කාලේ මොන්රෝවියා වත්ත කසල අංගනයට කුණු භාර නොගෙන හිටියා. එතකොට කුණු එකතු කරලා යම් යම් උපායශීලි දේවල් අපි කරා. එහෙම ගැටළුවක් ආවොත් අපිට මුහුණ දෙන්න අමාරුයි. ඒ නිසා අපි නිශ්චිත වැඩපිළිවෙලක් දැනට සකස් කරගෙන යනවා. ඒක සකස් කරනකන් අලුත් පාරවල්වල කුණු එකතු කරන්නේ නෑ.

නරාවල සිට්ට්‍රස් වත්තේ ඉඩම පිළිබඳව අපි බලාපොරොත්තු තියාගෙන ඉන්නවා කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලකට යන්න. ඒක එහෙම නොවුනොත් වෙන විකල්පයකට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉඩම හම්බ වුනේ නැති වුනොත්

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** ඃ- ඒ කියන්නේ ඒ වැඩේ කෙරෙන්නෙත් නෑ කියලද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩම හම්බවෙන්න එපැයි. දෙන්නම් කියලා පොරොන්දු වෙලා තියෙනවා. නමුත් අපිට දෙනකන් කියන්න බෑ ඉඩමක් හම්බ වේවිද කියලා. ඒක එක කාරණාවක්. එහෙම නොවුනොත් අපි කුණු පිළිස්සුම් යන්ත්‍රයක් හෙවත් බර්නර් යන්ත්‍රයක් මිලදී

ගන්න අවධානය යොමු කරලා තියෙනවා. ඒකට ලක්ෂ 90 ක් විතර යනවා. අපි ණය මුදලක් අරගෙන හරි ඒක කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ දෙවැනි ක්‍රියාමාර්ගය විදියට. ඒකේ ප්ලාස්ටික් ඕන දෙයක් පුච්චන්න පුළුවන්. අළු වශයෙන් තමයි ඉතිරි වෙන්නේ. 5% ඉතිරි වෙන්නේ. පැය 03 කට වරක් ටොන් 05 ක් පුළුස්සන්න පුළුවන්. අපිට තාම යන්න බැරිවුනා ඒ යන්ත්‍රයක් සවිකරපු තැනක් බලන්න. ඉඩම ලැබුණත් මේ යන්ත්‍රය මිලදී ගැනීමේ වටිනාකමක් තියෙනවා.

**(ඊ) කාරක සභාවල වාර්තා**

**01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.05.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ප්‍රතිපත්තියක් විදියට මේ කමිටු වලට සහභාගි වෙන්නේ නැති නිසා අපි විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටු වාර්තා සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම කමිටු වලට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වෙරි ගුඩ්. ඒකට හේතුව.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** හේතුව තමයි සභාවට දක්වන විරෝධතාවය. මගේ කොට්ඨාශයේ ගැටළු රාශියක් තියෙනවා. විපී පහන් සවිකිරිමේ ගැටළුව, අනවසර ඉදිකිරිමක් පිළිබඳ ප්‍රශ්නයක් මාස තුනක විතර කාලයක් ගියා. අද වෙනකන් ඒ කටයුත්ත කෙරිලා නෑ. අපි පාර කපන කොට විරුද්ධ වුන අයට නඩු දාන්න සභාවට ලියුම එද්දි තව වෙනකන් නඩු දාන්න නීතිමය පැත්ත බලලා නෑ. ඊළඟ කාරණාව තමයි මුලනේ අපේ ලැයිස්තු අපේක්ෂිකා මල්ලිකා ගුණසේකර මහත්මියගේ යෝජනාව දාලා මාස 03 කට වැඩියි. දිනූෂ මහත්තයා තාම ඇස්තමේන්තුව හදලා නෑ. මාස 03 කට වැඩියි කියලා. ගිය කණ්ඩායම් රැස්වීමේදීත් ඒ යෝජනාව දැම්මා. අද වෙනතුරු ඒ ඇස්තමේන්තු හම්බ වුනේ නෑ. මාස තුනකට වැඩි ඇස්තමේන්තු තියෙනවා තාම මට හම්බ වුනේ නැති. මට ස්වාධීනව දේශපාලනය කිරීමේ හැකියාවක් තියෙන්න ඕන. මම කාගේවත් අතකොලුවක් වෙන්න සුදානම් නෑ. කොන්ද කෙලින් තියාගෙන දේශපාලනය කරන්න ඕන. මම කැමතියි චනක චමල් වෙන්න. මම කාගේවත් යටතේ ඉන්න කැමති නෑ. මම චනක චමල් විදියට තීරණ ගන්නේ. නරාවල කොට්ඨාශයේ අහිංසක මිනිස්සුන්ගේ තීන්දු තීරණ වලට මට සහයෝගය ලබා දෙන්න බැරිනම් සාධාරණයක් කරන්න බැරිනම් මම මෙතනට ඇවිල්ලා තේරුමක් නෑ. ඒ නිසා මගේ කටයුතු සිදු වෙනකම් කරන්නේ මේකේ කිසිම කෙනෙකුගේ කුමන්ත්‍රණයක්වත් නෙමෙයි. එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂය හිතන්න එපා බොරදියේ මාළු බාන්න. මම මේ ආණ්ඩුව ඉවත් කරන්න, සභාව වෙනස් කරන්න නෙමෙයි හදන්නේ. එවැනි තීන්දුවකට නෙමෙයි. මගේ කටයුතු වලට සාධාරණයක් ඉටු වෙනකන් මම මේ තීරණය ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතු ටික කියන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා දැනුවත් ඒ ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම හොඳයි. ඡන්ද විමසීමට යනවා. උදුල මන්ත්‍රීතුමා පක්ෂද?

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම එදා කමිටුවට ආවේ නෑ. ආවේ නැති නිසා මම දන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එන්න ඕන නෑ, ඡන්දය දෙන්න. ඒක මහ විහිළු කතාවක්නේ. එන්න ඕන, නෑ කියලා කතාවක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බලකරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනේ පැරදියන් මේ වාර්තාව. තව කෙනෙක්ගේ අත අඩු කරන්න කරුණාකරලා. සභාව ගෙනියන විදිය මම පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හරි මම අත පහළ දාන්නම්. සභාපතිතුමාගේ ඉල්ලීමට අපි ගරු කරන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටු වාර්තා සභාවේ අනුමත කරන්නේ නැත්නම් සභාව කරගෙන යමු. ප්‍රශ්නයක් නෑ.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 10

විපක්ෂව - 07

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 05

**2019-05-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-05-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-05-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
04. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
05. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-05-30 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 03 කින් සභා සම්මත විය.

**II.** 2019-06-14 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දයට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 12

විපක්ෂව - 07

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 03

**2019-06-14 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
12. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-06-14 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-06-14 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-06-14 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 05 කින් සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ ප්‍රියන්ත මන්ත්‍රීතුමා 2019.05.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට සහභාගි වුණා. අද ඇයි ඔබතුමා ඡන්දය දීමෙන් වැළකිලා නිහඬව හිටියේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අද දවසේත් මම පක්ෂව අත ඉස්සුවා. සභාපතිතුමාගේ ඉල්ලීමට අත පහල දැම්මේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ වෙලාවේ නමක් සඳහන් කරේ නෑ. සභාපතිතුමා කියමනක් හැටියට කිවුවේ කමිටු වාර්තා පරාද වුනා නම් හරි කියලා. කමිටුවට ඇවිල්ලා එහෙම ඉඳපු එක හරි නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කවුරුවත් නම් කරලා කිවුවේ නෑ. අනේ දෙවියනේ තව එකක් අඩු වුනානම් කියලා කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේක විහිළු සපයන මඩුවක් නෙමෙයි. ඒ විහිළුවට, මේ විහිළුවට තීන්දු දෙනවා නම් මේ සභාවට එන්න ඕන නෑ. මහජන මුදලක් නාස්ති කරන්න ඕන නෑ. ඔබතුමාලා වැදගත් විදියට ඡන්ද විමසීම කරා. ඡන්ද විමසීම ගණන් කරන කොට පරද්දන්න වුවමනාවක් සභාපතිතුමාට තිබුණා. සභාපතිතුමා මේ ගරු සභාවට යෝජනා කරා අත පහලට දාන්න කියලා. මම ක්ෂණිකව සභාපතිතුමාගේ වචනයට ගරු කරලා අත පහළට දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි. මගේ වචනය හරියටම ක්‍රියාත්මක කරනවා ඒ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි මෙතෙක්කල් ඔබතුමාට සහයෝගය දක්වන තීන්දු තීරණ වල හිටියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තමන් කමිටුවට ආවද, නාවද, කියන එක බලපාන්නේ නෑ ඡන්දෙ විමසීමේ දී. දැන් එහෙම හොය හොය කරන්න ගියොත් යන්න බෑ. කමිටුවේ ඉන්නෙ මන්ත්‍රීවරු 07 දෙනානම් ඒ 07දෙනා විතරයි අත උස්සන්නෙ. අනිත් අය පක්ෂ නෑ. එහෙම කොහොමද යන්නෙ?

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම හැමදාම සහයෝගය ලබා දුන්නා. අර සිද්ධිය නිසා තමයි මම අත පහත දැම්මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් නිලධාරීන් විදියට මේ කමිටු වාර්තා සභා සම්මත වේද නොවේද කියල දෙගිඩියාවක් තියෙනවා. එහෙම උනොත් අපිට ගෙවීම් කටයුතු කරන්න බැරි වෙනවා. අන්තිමට කමිටු වාර්තාව පැරදුනොත් මොකද කරන්නේ ගෙවීම් කරල තියෙනකොට. දැනට තියෙන ඒව ගෙවනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් ඔබතුමාගේ කණ්ඩායමම අනිවාර්යයෙන්ම ඒකපර්ශවීයව හොඳ හෝ නරක වලට අත උස්සන්න එපැයි. එහෙම කණ්ඩායමක් විදියට එකට අත උස්සන්න ඕන. එතකොට ඒ කණ්ඩායමේ අයගේ යෝජනා ක්‍රියාත්මක කරපුවට ගෙවීම් කරන්න අපි කමිටුවට ඇවිත් සම්මත කරල තියෙනවා. ඒ දීල තියෙන්නෙ අපේ ඒවා නොවෙයි. එතුමාගේ කොට්ඨාශයේ තියෙන ප්‍රශ්නයක් නිසා එතුමා ඡන්දය දෙන්නෙ නැත්නම් අපි කොහොමත් ඡන්දය දෙන්න අවශ්‍ය නෑ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම ඔබතුමාගේ කතාව හරි. කණ්ඩායමේ කොහේදිවත් කතා කරපු දෙයක් නෙවෙයි මේ. මම 100% ක් ගරු කරනවා ඔබතුමාගේ කතාවට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මින් පස්සෙ අපි හැමදාම විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. එහෙම වෙන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාව ආරම්භයේ ඉඳන් ශත පහක් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දෙන්න එපා කියලා මුල් සභා වාර්තාවේ තියෙනවා. අපි ඒව දුරදිග ගෙනිච්චේ නෑ. අපි හැමදාම සහයෝගය ලබා දුන්නා. හැබැයි අපි දැන් තීරණයක් අරගෙන තියෙනවා ලබන මාසෙ ඉඳගෙන අපි මේකට පැමිණීම අත්සන් කරනවා නමුත් විරුද්ධ තමයි ඡන්දය භාවිතා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ප්‍රශ්නයක් නෑ ප්‍රියන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාල ඡන්දය දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මම ඒ වෙලාවෙත් ඒක කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හැමදාම ඔබතුමන්ලා ගොඩයන පැත්තට අපි හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සරහටත් ඉන්න. එහෙම ප්‍රශ්නයක් නෑ. සභාව කඩාකප්පල් කරන්න ඔබ දෙපලට වුවමනාවක් නැති බව මම දන්නවා. ඔබතුමන්ලා කමිටු වලට එනවා. ඒ සහයෝගය දක්වනවා. සභාව කඩා කප්පල් කරන්න ඔබතුමාට උවමනාවක් නැති බව මම දන්නවා. ඒ වගේම අපේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් එහෙම කරනවානම් ඒ පිළිබඳව ගන්න ඕන ක්‍රියාමාර්ගත් මම ගන්නවා සභාපතිවරයා විදියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම ඒ ගැන කතා කරන්න ඕන. මට ආපු අදහසක් මම මේ කියන්න හදන්නේ. චනක මන්ත්‍රීතුමාට වෙච්ච අසාධාරණකම් හින්ද තමයි එතුමා ඒ වගේ දෙයක් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද වෙච්ච අසාධාරණේ?

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔහොම කරන්න එපා. එතකොට නේ ප්‍රශ්න ඇති වෙන්නෙ. ඔබතුමා ටිකක් ඉවසීමෙන් අහගෙන ඉන්න. හෙට අනිද්දා වෙනකොට ඔය ප්‍රශ්නය වැඩි වෙන්නත් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක දිගට දවස් හතරක් ඒ කොට්ඨාශයට කම්කරුවෝ ලබාදීපු එකද අසාධාරණේ, ලයිට් සියළු දේ හයි කරපු එකද අසාධාරණේ. ලයිට් කට්ටල 100 ක් ලබාදීපු එකද අසාධාරණේ? මල ගෙදර කිව්වම කම්කරුවො ලබා දීපු එකද අසාධාරණේ? ගිය අවුරුද්දේ ලක්ෂ 12ක ප්‍රතිපාදන වෙන් කරපු එකද අසාධාරණේ?

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එක පිට දවස් 4 ක් කම්කරුවෝ මගේ කොට්ඨාශයට ලබා දීලා තියෙනවානම් ඔබතුමන්ලාගේ කොට්ඨාශ වලටත් එහෙම ලබා ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපිටත් එහෙම දෙන්න. මට දීල තියෙනවා ශ්‍රමදානෙකට. ඒක මගේ පෞද්ගලික වැඩක් නෙවෙයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම දැනුවත්ව නම් මට එහෙම ලබා දීලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කම්කරුවෝ දීල නැද්ද?

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම දැනුවත්වනම් මම ඉල්ලලා මට දීලා නෑ ඔහොම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම හැදුවෙ මේ වැඩේ ඉවර කරන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඉල්ලලා තියෙද කවදාවත් කම්කරුවෝ දවස් හතරක් එක දිගට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කතා කරල දීල නැද්ද? මල ගෙදරට දීල නැද්ද?

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මල ගෙදර වෙලාවේ ලයිට් එකක් දාගන්න බැරිවුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලයිට් තියෙන්න එපැයි දාන්න. සඳුදා දවසෙ මල ගෙදර තිබුනේ. සඳුදා දවල් මට කතා කරල ඉල්ලනවා සභාපතිතුමා ලයිට් එකක් දාල දෙන්න කියලා. ලයිට් එකක් ඕන නම් උදේ කියන්න ඕන. එදා වයර් තිබුනෙත් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමනි, සභාව ගෙනියන්න ඔබතුමා. මේ ප්‍රශ්න දැන් කතා කරන්න එපා. මේවා කතා කරන්න ඕන තැන් තියෙනවා. කතා කළ යුතු පුද්ගලයෝ ඉන්නවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ ප්‍රශ්න පස්සේ කතා කරලා විසඳගමු.

**02. කර්මාන්ත හා සේවා කමිටුව :-** නැත

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව :-** නැත

**04. පරිසර කමිටුව :-** නැත

**(උ෧) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ මැයි මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස.6)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ මැයි මස ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ අප්‍රේල් මස හා මැයි මස සංසන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන**

I. ප්‍රගතිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජූනි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ප්‍රගතිය වෙලාවේදී මට කාරණා දෙකක් දැන ගන්න ඕන. බැකෝ යන්ත්‍රයේ තත්ත්වය මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැකෝ යන්ත්‍රයේ එන්ජිමේ රෙපෙයාර් එකට තමයි සෙනොක් ආයතනයට යොමු කලේ. එන්ජිමේ රෙපෙයාර් එක සාර්ථකයි. අපි දවසක් වැඩ කළා. අවුරුදු දෙකක් විතර එක තැන තිබිලා ඔයිල් සීල් කරවෙලා තියෙන්නේ. ඒවායෙන් ඔයිල් කාන්දු වෙනවා. වෙන ගැටළුවක් නෑ. බැකෝ යන්ත්‍රය වැඩ කළා ටෙස්ට්න් එකට, ඔයිල් සීල් දාන්න තියෙන්නේ. වැඩ කරන කොට ඒ අදාළ පීඩනය නිසා ඒක වෙලා තියෙන්නේ. අවශ්‍ය බර යොදලා වැඩ කරන කොට තමයි ඒ ප්‍රශ්නය ආවේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** බැකෝ යන්ත්‍රය එහේ අරගෙන ගිහින් තමයි ඒ වැඩ කටයුතු කරේ. තවදුරටත් ඔබතුමාගේ ඔවැනි ප්‍රකාශ අපි පිළිගන්නම්. හැබැයි ඔය හදපු යන්ත්‍රය දවසක් වැඩ කරන්න හම්බ වුනේ නෑ. මම දැක්කා කාංචනා මන්ත්‍රීතුමියගේ ගෙදර ගරාජයේ ගාල් කරලා තියෙනවා. ඒ නිසයි මම ඇහුවේ. ඔබතුමාට ඔහොම කියලා ඔය මට්ටමෙන් බේර ගන්න පුළුවන් නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජේ. සී. බී. එක සභාවට ගේන්න තිබුණා. දැන් වුනත් ගේන්න පුළුවන්. නමුත් එතන දැම්මෙ වෙන මුකුත් නිසා නෙමෙයි. ඒ ඔයිල් සීල් ටික ඇස්තමේන්තුවක් අරගෙන අපි ගෙනත් දුන්නම නොමිලේ හදලා දෙන්නම් කිව්වා. වාහනය හදන්න වියදමක් යන්නේ නෑ. ඔයිල් සීල් මිලදී ගන්න යන වියදම විතරයි යන්නේ. වැරදි විදියට කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙම වැරදි දෙයක් කිවුවේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයිල් සීල් පිටින් ගෙනත් දීලා සවිකර ගන්න හදන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක පිළිගත්තා. ඒ ප්‍රශ්නය ඉවරයි. මම ඇහුවේ සභාවේ ගාල් කල යුතු වාහනය එහෙම ගරාජයක දාන්න ඇත්තේ ගේන්න බැරි ආබාධයකට ලක් වුණ නිසාද කියලා. බොහොම හොඳයි.

ඊළඟ කාරණාව තමයි සභාවේ සේවකයෝ යොදවලා ඔබතුමාලා දන්සලකට මුදල් එකතු කරලා තිබුණා. ඒ ප්‍රදේශවල මිනිස්සු අහනවා දන්සල කෝ කියලා. කවදද ඒ දන්සල තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ට්‍රැක්ටරයේ ගිය අය නිසා එහෙම වුනේ. ඒ ප්‍රශ්නය ඔබතුමා මතුකරපු එක හොඳයි. ට්‍රැක්ටරයේ ගිය ගෝලයෝ දෙන්නා අතින් ඒ දේ වුනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සරසවි අසපුවේ මිනිස්සු අහනවා දන්සල කවදද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ට්‍රැක්ටරයේ තුන් දෙනාටම විරුද්ධව විනය පරීක්ෂණ කරන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක තමයි මට දැන ගන්න වුවමනා වුනේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට පොඩ්ඩක් දැන ගන්න අවශ්‍ය වෙනවා අර මහ වත්ත මාර්ගයේ අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වන විට තත්ත්වය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නඩුවාර තුනක් දැන් ඒකට ගිහින් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභා යෝජනාවක් ගෙනල්ලා සම්මත කරලා ඒක අයින් කරන්න බැරිද?. අයිති කාරයෙක් නැතේ ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑ. නඩුවක් තියෙන එකක් සභා තීන්දුවක් අරගෙන අයින් කරන්නේ කොහොමද?.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඇයි මේ නඩුව මෙහෙම ඇදෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට කියන්න බෑ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** නීතිඥ මහත්තයා මේ නඩුව අවුරුදු ගාණක් ඇදගෙන ගියොත් අපි ඉන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නීතිඥ මහත්තයාගේ නෙමෙයි නඩු කාරයාගේ ප්‍රශ්නේ තියෙන්නේ. අපිට ඕන විදියට නඩු තීන්දු ඉක්මනට ගන්න බෑ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අපිට ඕන විදියට නෙමෙයි. චූදිතයාගේ නම හරියට දීලා නෑ. විත්තිකාරයාගේ නම වරද්දලා දීලා තියෙන්නේ. නම නිවැරදි කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිවැරදි කරන්න භාර දීලා තියෙන්නේ. අපිට ග්‍රාම සේවක දීලා තියෙන්නේ අදාළ නම. අපි ඒ නම අනුව තමයි නඩු දැම්මේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒ නම නිවැරදි කරන්න කරපු ඉල්ලීම හරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි නිවැරදි කරන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මීට කලින් කාරණාවේදී ප්‍රියන්ත මන්ත්‍රීතුමා කතා කරපු එක සභා වර්තාවෙන් ඉවත් කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ප්‍රශ්නයේදී කතා කරපු විදිය වැරදියි. එතුමා කතා කරේ ඒ සිද්ධිය සම්බන්ධවනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ ට්‍රැක්ටරේ ගිය දෙන්නා ඒකට සම්බන්ධ වුනාට රියදුරුගේ ඒකට සම්බන්ධයක් නෑ. තුන් දෙනාටම විනය පරීක්ෂණ කරනවා කිව්වා. ඒ රියදුරු දැඩි සේ විරෝධතාවය දක්වලා ඒ දේ ගැන සභාව දැනුවත් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ඔබතුමා මතු කරපු හින්දා කිව්වේ. නමුත් රියදුරු අපිව දැනුවත් කරේ නෑ, මෙහෙම සිද්ධියක් වෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දන්නේ නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දන්නේ නැති වෙන්න විදියක් නෑනේ. වාහනයක එකට යන දෙන්නා මේ වගේ වැඩක් කරන කොට නොදැන ඉන්න විදියක් නෑ. එතුමා දැනුවත්. නමුත් එතුමා අපිව දැනුවත් කරේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එතුමාගේ වාහනයේ යන වෙලාවේ නෙමෙයිනේ ඕක වෙලා තියෙන්නේ. ඊට පස්සේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. වාහනය යන වෙලාවේ. වාහනය යන වෙලාවේ වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** රියදුරු කිව්වේ පස්සේ ගිහින් එකතු කරලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාහනය ගිය වෙලාවේ වෙච්ච දේවලුත් තියෙනවා. වෙනම ගිහිල්ලා වෙච්ච දේවලුත් තියෙනවා. ඔබතුමා මතු කරපු එක ගැටළුවක් නෑ. පරීක්ෂණය කරනවා. කියපු නිසා නෙමෙයි ඒකට පරීක්ෂණය කොහොමත් කරනවා. දැන් ඒ දෙන්නා ට්‍රැක්ටරයේ සේවය කරන එක නතර කරලා තියෙන්නේ. අපිට තාම පිටින් පැමිණිල්ලක් ඇවිල්ලා නෑ. තැනින් තැනින් ආරංචි එනවා. අපිට පැමිණිල්ලක් නැතුව පරීක්ෂණය කරන්න අපහසුයි. ඔබතුමා රජයේ සේවකයෙක් විදියට ඒක දන්නවා ඇති නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක සභා වාර්තාවට යනවානේ. ඒ වාර්තාව පදනම් කරගෙන ඔබතුමාට පරීක්ෂණයක් කරන්න පුළුවන්. අපි මතුකරේ ඒ කාරණාව නෙමෙයි. එතුමා ඒ කාරණාව මතු කරාට පස්සේ ඒ ප්‍රශ්න විමසීම කරපු විදිය වැරදියි. ඒ සම්බන්ධයෙන් වාර්තාවට ඇතුළත් කරන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි එහෙම කවුරුවත් බේරන්න යන්නේ නෑ. මම ඉදිරිපත් කරේ ප්‍රශ්නයක්. ඔබතුමා ඒකට කතා කරපු විදිය සුදුසු නෑ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මම අහපු ප්‍රශ්නය පිළිබඳ කාරක සභා අවස්ථාවක් කරලා හරි ඒ ගැන මාව දැනුවත් කරන්න, මටවත් ඒ නඩුවට ඉදිරිපත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහ වත්ත මාර්ගයේ පිවිසුම අවහිර වී ඇති අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- එම අනවසර ඉදිකිරීමට අදාළ නඩුව වාර තුනක් කැඳවූ බව
- නඩුවේ විත්තිකරු වන සිඩ්නි ෆොන්සේකා මහතා විසින් එම ඉදිකිරීම සම්බන්ධයෙන් තමාට හිමිකමක් නැති බවට සභාව දැනුවත් කළ බව.
- සිඩ්නි ෆොන්සේකා මහතා විසින් එම අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් ඔහුට හිමිකමක් නොමැති නම් අධිකරණයේදී එය ඔප්පු කළ යුතු බව.
- ප්‍රාදේශීය සභාව විසින් පැවරූ නඩුවේ විත්තිකරුගේ නම වෙනස් කිරීම සිදු කළ නොහැකි බව.
- අනවසර ඉදිකිරීම් සම්බන්ධ නඩුවල තීන්දු ලබා දීමට ගතවන කාලය පිළිබඳව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ප්‍රධානම දේ තමයි මම මීට පෙරත් දැනුම් දුන්නා මගේ කොට්ඨාශය අධීක්ෂණය කරන තාක්ෂණ නිලධාරිතුමා ගැන. මම ඉතාම කණගාටුවෙන් ප්‍රකාශ කරන්නේ සභාවක කිවයුතු දෙයක් නෙමෙයි මේක. මම දිගින් දිගටම වෙන අසාධාරණ වැඩපිළිවෙල නිසා, එතුමාගෙන් මට වෙච්ච් අඩුපාඩු ගැන නොකියා මගේ කොට්ඨාශය අධීක්ෂණය සඳහා වෙනත් තාක්ෂණ නිලධාරි කෙනෙක් යොදවන්න. ඒක ගැන ආයේ මුකුත් කතන්දර නෑ. මම අවුරුද්දක් තිස්සේ බලලා යම් යම් කරුණු කාරණා කතා කරලා, එතුමා යම් යම් තැන්වල කියපු කතා එක්කත් නිසා මම එතුමා එක්ක වැඩ කරන්න එකග නෑ. මගේ කර්මාන්ත වැඩ සියල්ල නැවතුනත් මගේ කාල සීමාව අවසන් වෙනකන් මම එතුමා සමඟ වැඩ කටයුතු කරන්නේ නෑ. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපි ගැටුමකට යනවට වැඩිය හොඳයි එතුමා වෙනත් කොට්ඨාශයකට යොමු කරවලා මට මේ ප්‍රධාන කාර්යාලයේ ඉන්න තාක්ෂණ නිලධාරි මහත්තයෙකුගේ සේවය ලබා දෙන්න. නිලධාරියෙක් විදියට එතුමා තැන් තැන්වල කියපු දේවල් හොඳ නෑ. උදාහරණයක් විදියට කුරුන්ද කන්ද සොහොන් පිටියේ අනවසර මාර්ගය ඉවත් කරපු වෙලාවේ තාක්ෂණ නිලධාරිතුමා එක්ක සේවක මහත්වරු ගියාට පස්සේ එතුමා කතා කරලා තිබුණ විදිය ඉතාම කැතයි. මොකද එතන කසිප්පු තිත්පොලක් තියෙන්නේ. කසිප්පු විකුණන අය අපිත් එක්ක කොහොමත් විරුද්ධයි. ඒ සොහොන්පිටිය මැදින් පාර වහනකොට ඒ කසිප්පුකාරයොන්ගෙන් විරෝධතාවය ආවම මෙතුමා කියලා තියෙන්නේ මොකක්ද?. එතන කසිප්පු බොන්න ආපු අපිට හිතවත් අය ඉන්නවා. මේක ඉන්දලා යනකන් තියෙන්න අරින්න. ඊට පස්සේ ඕන දෙයක් කර ගන්න කියලා. අහවලාගෙන් පුදුම කරදරෙයි කියලා.

ඊට කලින් අනවසර ඉදිකිරීමක් නවත්වන්න ගියා කපුහෙම්පල. මම දන්නේවත් නෑ. දෙගොල්ලෝ උරණ වෙලා එයාගේ පැත්තට එනකොට කියලා උප සභාපතිතුමා නවත්වන්න කිවුවා කියලා. මම ඒ ගැන මුකුත් දන්නේ නෑ. අන්තිමට ඒ දෙගොල්ලොම අපේ ගෙදර ආවා. ආවට පස්සේ මම සභාපතිතුමා මුණගැස්සුවා. ඒ හින්දා මෙහෙම කරන්න බෑ. වැරදිලා හරි කිවුවා කියන්නකෝ. මහජන නියෝජිතයෝ විදියට අපි ඡන්දයෙන් පත්වෙලා මේ නිලධාරීන් එක්ක සභාවේ මන්ත්‍රීවරු එක්ක, සභාපතිතුමා එක්ක මේක කරගෙන යන්න. බොහොම සුහදව යන්න ඕන ගමන යන්නේ නෑ. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් මේ තාක්ෂණ නිලධාරි මහතා වෙනුවට වෙනත් තාක්ෂණ නිලධාරි මහත්තයෙක් අපිට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක ඔබතුමාගේ පෞද්ගලික ඉල්ලීමක්ද?

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඔව්. මගේ කොට්ඨාශයට විතරක්.

දෙවැනි කාරණය සභාපතිතුමා කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ නාම පුවරුව සහ ලබුදූව ක්‍රීඩා පිටියේ නාමපුවරුව තව වෙනකං සවිකරලා නෑ. එතන 27 වෙනිදා පළවෙනි සායනය පටන් ගන්නවා. ඒක තාම ක්‍රියාත්මක වුනේ නෑ. ඒකේ එච්චර දෙයක් නෑ. මම ලේකම්තුමා එක්ක එදා කතා කරා. මහ වියදමක් කරන්න දෙයක් නෑ. පොඩි ප්‍රින්ට් අවුට් එකක් ගැහැවම ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට එක මිල ගණනක් ඇවිත් තිබුණා ඒක රුපියල් 74,000/- ක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එහෙන් පිටින්ම අපරාධයක්. සායන ගොඩනැගිල්ලට ඒ තරම් මුදලක් වියදම් කරන්න අවශ්‍ය නෑ. ඒක ක්‍රීඩාපිටියට නම් කමක් නෑ. රුපියල් 74,000/- ක් කියන්නේ ලොකු මුදලක්. රු. 5000/- , රු. 10000/- සීමාවට ගියානම් ඇති. මිනිස්සුන්ට බලාගන්න පුළුවන් පහසුව තියෙන්නයි ඕන. ඒක ඉක්මනට කරලා දෙන්නකෝ. 3'x5' ප්‍රමාණයේ එකක් ඇති.

ඊළඟ කාරණාව සභාපතිතුමා සභාවේ තියෙනවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබුණ කම්පැක්ටර් රථය. ඒක ප්‍රයෝජනයට ගන්නවද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ හැම එකම එකතු කරන්න බෑ. තෝරල ගන්න වෙන්නේ. ප්‍රධාන මාර්ගවල ඒක ගමන් කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපිට වාඩි වෙන්න තැනක් ඔබතුමා හදලා දෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලැස්ති කරලා දෙන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තාම ලැබුනේ නෑ. අපිට වාඩිවෙන්න ඕන. දිගින් දිගටම කතා කරා. ඔබතුමා අනිවාර්යයෙන්ම ඒක කරලා දෙන්න. සොහොන් පිටියේ මැද පාරේ කම්බි ටික ගහලා දෙන්න සභාපතිතුමා. ඉක්මනට ඒක කරලා දෙන්න.

ඊළගට සුගුණ මාවතේ සිලින්ඩර් ටික මැන්නා තාක්ෂණ නිලධාරිතුමා. ඒ ලැයිස්තුව ලේකම්තුමාට දුන්නා කිවුවා. ලේකම් මහත්තයා කිවුවා මට දුන්නේ නෑ කියලා. ගෙනාපු සිලින්ඩර් දෙක විතරයි. ඒක ඉදිරියේදී අනිවාර්යයෙන්ම දානවා. සුගුණ මාවතේ වැඩේ තාම කෙරුනේ නෑ.

ඊළගට ඒ. පී. මහත්තයාලගේ ගෙවල් පාර බැලුවා. ඒ. පී. මහත්තයා එකඟ වුනා. ප්‍රීමික්ස් දාලා ඒ පාර හදන්න ඕන. කාණුව සුද්ද කරලා දාන්නත් ඕන. යෝජනාව දාලා තියෙනවා. ගිහිං බලලත් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අනතුරුදායක ගස් පිළිබඳව කතා කරා. අනවසර ඉදිකිරීම් සම්බන්ධව ගනිපු අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත් කරලා තියෙනවා. මම නම් මේක ගැන ඒ තරම් සෑහිමකට පත් වන්නේ නෑ. බොහොම පැහැදිලිව අපි ඉල්ලා හිටල තියෙනවා මේ ලොකු අය කරපු වැරදි පිළිබඳව හරි ක්‍රියාමාර්ගයක් අරගෙන නෑ. අද ඊයේ කරන ඒවාට උනත් කමක් නෑ නඩු දාන්න.

ඊළගට දාලා තියෙන නඩු පිළිබඳව මට තියෙන්නේ ලොකු අවිශ්වාසයක්. ඒක කියන්න ඕන. පොඩි නෙමෙයි ලොකු අවිශ්වාසයක්. දැන් මම උදාහරණයක් විදියට ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා. මම බොහොම පැහැදිලිව ලීඩ්ස් ඉන්ටර්නැෂනල් කියන ජාත්‍යන්තර පාසල පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා තියෙනවා ඒකට අනවසර ඉදිකිරීම් පිළිබඳව නඩු දාන්න කියලා. දැන් ඇහුවහම ඔව් නඩු දානවා කියනවා. නඩු දාලා තියෙන්නේ තාප්පයට. අනවසර ඉදිකිරීමට නඩු දාලා නෑ. මේක මහ අමු කුණුහරුප වැඩක් නේ. මේක බලලා හරකෙක් ගොනෙක් නම් සද්ද නැතුව ඉඳීවි. ඊළගට 2017 දී තමයි ඇක්සස් ඉඩමේ තට්ටු තුනක බිල්ඩින් එක හදන එක ගැන කරුණු දැනුම් දුන්නේ. 2017 අවුරුද්දේ අන්තිම. අද වෙනකන් බැරිවෙලා තියෙනවා ක්‍රියාමාර්ග ගන්න. ඔබතුමන්ලා යනකොට බලන්න. ඒකට මොකක් හරි කරන්න. තට්ටු තුනක බිල්ඩින් එකක් පාරේ කොලර් එකේ හදලා තියෙන්නේ. ඒ වෙන්දේසි ඉඩමේ අනවසරයෙන් ඉදිකරපු ගොඩනැගිලි 12 ක විස්තර මම ගෙනත් දෙනවා හෙට අනිද්දා වෙන කොට. මේකට මුකුත් ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්තේ ඇයි.

දැන් දහනායක හාඩ්වෙයාර් එකට මොකක්ද අරගනිපු ක්‍රියාමාර්ගය. දසනායක සර්විස් සෙන්ටර් එකට මොකක්ද අරගනිපු ක්‍රියාමාර්ගය. මේවා ගැන ගනිපු ක්‍රියාමාර්ගයක් නෑ.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔහොමම උත්තර ඕනද? ඉවර වුනාට පස්සේ ඕනද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉවර වුනාට පස්සේ දෙන්න. මවුන්ට් කැල්වරි පාසලේ පස් කපලා තියෙනවා. ඒවාට අවසර අරගෙන තියෙනවාද?. ඒ ගොඩනැගිලි හදන්න අවසර දීලද තියෙන්නේ.

මේ දීලා තියෙන වාර්තාවේ තියෙනවා පානදුර පිරිවෙන පාරේ වාසනා ජයතිස්ස මිය, ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසර තාප්පය ඉදිකිරීමේ ගැටළුව, නීතිඥ අරුමාහන්දි මිය විසින් නඩු පැවරීම සඳහා අවශ්‍ය අනවසර ඉදිකිරීම් වාර්තාව සමඟ ලිපිගොනු ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි කියලා. නීතිඥ මහත්මියට අපි ගෙනිහින් දීලා නෙමෙයි නීතිඥ මහත්මිය කියනවා ඔයාලා වාර්තාව දෙන්න නඩු දාන්නම් කියලා. ඔබතුමාගේ කාලෙත් මේක එහෙට මෙහෙට වෙලා යනවා. මට නම් තේරෙන්නේ නෑ මොකක්ද කියලා. හැබැයි එකක් සභාපතිතුමා මේ විදියට යන එක හොඳ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා මේ කරුණු කාරණා සම්බන්ධව තාක්ෂණ නිලධාරිතුමියට සහ ලේකම්තුමාට සභාව දැනුවත් කිරීමට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිණී අයි. ඩී. කමණි චන්ද්‍රලතා මහත්මිය පහත අදහස් දක්වා සිටින ලදී.

- ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසරයෙන් ඉදිකරන ලද තාප්පය සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අනවසර ඉදිකිරීම් වාර්තාව ලබා දී ඇති බව.
- ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසරයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලට අදාළව ඡායා පිටපත් අඩංගු ලිපිගොනු උපයෝගි කරගෙන අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පිළිබඳව නීතිඥ උපදෙස් ලබා ගනිමින් සිටින බව.
- අංක 45/1 ලිපිගොනුවට අදාළ අධි බල විදුලි රැහැන් පද්ධතිය යට ඉදිකරන ලද නිවසේ සැලසුම සභාව මඟින් අනුමත කර ඇත්තේ අනුමත කිරීම සඳහා අවශ්‍ය අවකාශය ඇති නිසා බව.
- දහනායක හාඩ්වෙයාර් වෙත අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් තුන්වන සිහි කැඳවීම යැවීමෙන් පසු අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව.
- ඇක්සස් වෙන්දේසි ඉඩමේ තට්ටු තුනේ නිවස සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට අවශ්‍ය නම් සංශෝධිත සැලැස්ම ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බවත්, ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සාමුහික ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු බවට සැලසුම් කමිටුව තීරණය කළ බව.

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසර ඉදිකිරීම් වලට අදාළ ලිපිගොනු අස්ථාන ගත වීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ට දන්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින්, අදාළ නිලධාරිනියගේ වැටුප් වර්ධක නවත්වා දඬුවම් ලබා දී ඇති බව.
- අංක 45/1 ලිපිගොනුව අස්ථාන ගත වී නැති බවත්, එම ඉදිකිරීමේ සැලැස්ම අනුමත කර ඇති බවට තාක්ෂණ නිලධාරි දැනුවත් කළ බව.
- අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යොමු කළ යුතු බව හා සිහිකැඳවීම් ලිපි යැවීමේ ක්‍රියාවලියේදී සිදු වී ඇති අඩුපාඩු.
- දහනායක හාඩ්වෙයාර් අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් සභාව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බවත්, අනවසර ගොඩකිරීමට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.
- අනතුරුදායක ගස් කැපීමේ ක්‍රියාවලිය හා එහි ඇති ප්‍රායෝගික ගැටළු.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 107 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයක් යවලා තියෙන අංක BP/PS/4/2/2018 හා 2018.06.03 දිනැති ලිපිය සම්බන්ධව මම කතා කරන්නේ. මේකේදී ඉදිරිපත් කරලා තියෙනවා. ගාල්ල, ලබුදූව, තුත්තිරිපිටියේ පදිංචි ජේ. කේ. කුමාර ප්‍රේමලාල් මහතා පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තියෙනවා අනතුරුදායක ගස් සම්බන්ධව, ඒ ගස් වලින් එතුමට හානියක් වෙනවා කියලා. මම හිතන්නේ ඒ පැමිණිල්ල ඔබතුමත් පරීක්ෂා කරා. කාංචනා මන්ත්‍රීතුමියත් පරීක්ෂා කරා. මම ලේකම්තුමාත් දැනුවත් කරා. ඊට පස්සේ ග්‍රාම සේවක මහත්මයා මාව දැනුවත් කරා පොඩ්ඩක් ගිහින් බලන්න මන්ත්‍රීතුමා කියලා. ඒ පාර මම ගියා. ගියාට පස්සේ ඩී. එල්. සෙනෙවිරත්න මහතා ප්‍රකාශ කර සිටියා සභාවෙන් ලියුමක් එවුවා කියලා 2018.06.03 දිනැතිව ලියාපදිංචි තැපෑලෙන්. ඉතිං ඒ කාරණාවට අදාළව එතුමා කියනවා හික්ගස සහ ඉඹුල් ගස එතුමාගේ නෙමෙයි කියලා. පාරට අයිතියි කියලා තමයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කොස් ගසක් වුනානම් ?

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- මම ඒකත් ඇහුවා. මේක වෙන ගසක් වුනානම් මොකද වෙන්නේ කියලා. මේකත් අනිත් ගස් එක්කම තියෙන්නේ කියලා මම කිවුවා. මුල් තියෙන්නේ ඔබතුමාගේ වත්තේ නේද කියලත් මම ඇහුවා. ලොකු ගැටළුවක් යන්න ගියා. මම බොහොම සුහදව විසඳ ගන්න බැලුවා ආරවුල. ඊට පස්සේ සෙනෙවිරත්න මහත්තයත් එක්ක මම කතා කරා. මම කිවුවා ඔබතුමාගේ වත්තට කිට්ටු නිසා ඔබතුමාට පුළුවන් කියලා මේක කපලා ඉවත් කරන්න ඔබතුමාගේ වියදමින්. අපි මේක සුහදව විසඳ ගන්න කතා කරේ. ආරවුලකට යන්න නෙමෙයි. මුලින්ම එයා ලොකු ආරවුලකට යන්න තමයි අර ඇද්දේ. ඊට පස්සේ එතුමා තේරුම් ගත්තා කතා කරද්දි මමත් මේකට දායක වෙන්න ඕන කියලා. ප්‍රේමලාල් මහත්තය එක්කත් කතා කරා. දෙන්නා ඉදිරියේ තියලා තමයි මම කතා කරේ. ඊට පස්සේ සෙනෙවිරත්න මහත්තයා කිවුවා මන්ත්‍රීතුමා මම මෙහෙම කරන්නම්, යන වියදමෙන් අඩක් දෙන්නම් කිවුවා. ඒකත් ලොකු දෙයක්. සහනයක් මේ වෙලාවේ. නැත්නම් සම්පූර්ණ වියදම සභාවෙන් දරන්න වෙනවා. ඒ ගස් දෙක හොඳටම අනතුරුදායකයි. ඔබතුමත් බැලුවා. කාංචනා මන්ත්‍රීතුමියත් බැලුවා. ප්‍රේමලාල් මහතාගේ නිවසට අද හෙට කඩන් වැටෙන මට්ටමේ තියෙන්නේ. එතුමා යන වියදමින් අඩක් දෙනවා නම් සභාවෙන් ඉතුරු මුදල යොදවලා මේ ගස් දෙක කපන්න. මේක ඉක්මන් කාර්යයක් සේ සලකා ක්‍රියාකරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඒකට ඔබතුමාට පොඩි උපදෙසක් දෙන්නම්. ඒ වැඩේ කරන ක්‍රමය තමයි ගස් කපන්න යන්නේ රු. 10,000/- නම් රු. 20,000/- ක් යනවා කියන්න. එතකොට වැය වෙන මුදල නිකන්ම ලැබෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- මෙහෙමයි. එයාට වැය වෙන මුදල ඊට කලින් දැනුම් දෙන්න කිවුවා සභාවෙන්. අපි හිතමු රු. 20,000/- ක් යනවා නම් එයා රු. 10,000/- ක් දෙන්න පොරොන්දු වුනා. ඒ නිසා යන මුදල එයාට කලින් දැනුම් දෙන්න කිවුවා. සභාවෙන් හදිසි කාර්යයක් සේ සලකා ඒක කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතුරු මුදල ප්‍රේමලාල් මහත්තයාගෙන් ගන්න කතා කරේ නැද්ද?.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- ඒකත් කතා කරා. ඒ ප්‍රශ්නය එවෙලේ විසඳ ගන්න කතා කරා. ප්‍රේමලාල් මහත්තයා කියන එකත් සාධාරණයි. ප්‍රේමලාල් මහත්තයා කියනවා එතුමාගේ ඉඩමක ගහක් නම් එතුමා කපා ඉවත් කරනවා කියලා. අනුන්ගේ ඉඩමක ගහක් එතුමට කපන්න බැහැ කිවුවා. ඒ මනුස්සයා කියන එකත් සාධාරණයි. අල්ලපු ඉඩමේ ගහ කපන්න ඕන ඒ ඉඩම අයිතිකාරයානේ. එයා කියනවා ගස් දෙක එයාගේ නෙමෙයිලු.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මේ කාරණා ටික සභාවෙන් දැන ගන්න අවශයයි. වක්වැල්ල මොල්ලිගොඩ ක්‍රසන්ට් ඉඩමේ 55/3 බිම් කොටසේ අයිතිය ඇත්තේ කාටද?. ඒ කිවුවේ ඒ ඉඩමේ අයිතිය ගැන සභාව දැනුවත්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉඩම් රෙජිස්ට්‍රාර් නම් කියන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒ බිම් කොටසේ තාප්පයක් බැඳලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රශ්න ටික අහන්න. ඊළඟ සභාවේදී උත්තර දෙන්නම්.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කමක් නෑ සභාපතිතුමා ඊළඟ සභාවේදී උත්තර ටික ලැබුණාට. ඒ තාප්පය බඳින්න සභාවෙන් අවසර ලබා දීලා තියෙනවාද?. ඒ ඉදිකිරීම නේවාසික ඉදිකිරීමක්ද? නැත්නම් ව්‍යාපාරික ඉදිකිරීමක්ද කියලා දැන ගන්න මම කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ප්‍රශ්න වලට උත්තර ඊළඟ සභාවේදී දෙන්න ලේස්ති කරන්නම්.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර ගස් ටික සම්බන්ධව මොකක්ද ගනිපු තීරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ලිපි ගොනුව බලලා කියන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මෙතන ප්‍රකාශයක් කරන අතරේ රියදුරු කෙනෙක් සම්බන්ධව ප්‍රකාශයක් ඉදිරිපත් වුනා මම ඒ රියදුරාගෙන් දැන් ඇහුවා එයා දැන් ස්ථිරව කියනවා එයා එක්ක වාහනේ යන වෙලාවේ නෙමෙයි, ඒ අය වෙනම බයිසිකල්වලින් ගිහින් ඒ දේ කරා කියලා. ගෙවල් වලින් ඇහුවම සභාව දැනුවත් කරා කිවුවා. මම කිවුවා සභාපතිතුමාත් එක්ක කතා කරලා ඒක නිවැරදි කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිව දැනුවත් කරලා නෑ. පිටින් දැනුවත් වෙච්ච කාරණා තමයි තියෙන්නේ. අපිට ඒ රියදුරු එක්ක ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තුන්දෙනාටම විනය පරීක්ෂණ කරනවා කිවුවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරනවා නම් තුන් දෙනාටම විනය පරීක්ෂණ කරන්න වෙනවා. කියන අයගෙන් සමහරු කියනවා ට්‍රැක්ටරේ ආපු වෙලාවෙත් සල්ලි ගත්තා කියලා. අපි පිළිගන්නවා රියදුරු ඒකට සම්බන්ධ නැහැයි කියන එක. හොඳට වැඩ කරන නිලධාරියෙක් එතුමා. දැනට ඒ රියදුරු එම ට්‍රැක්ටරයේම වැඩ කරනවා. අනිත් දෙන්නා අයින් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නමුත් තත්ත්වය නිවැරදි කරන්න ඕන. ඒගොල්ලෝ ගිහින් සල්ලි ලියාගෙන ඇවිත් තියෙනවා. ට්‍රැක්ටරේ යන වෙලාවේ ගෙවල් වලින් සල්ලි දෙන්න ඇති. ගෙවල් වලින් දැනුවත් වෙලා තමයි රියදුරු කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සෙල් එක්ස් ආයතනයටත් ගිහින් තියෙන්නේ ට්‍රැක්ටරේ යද්දි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඒ අයගෙන් ඇහුවම ට්‍රැක්ටරේ යන වෙලාවේ ගියේ නෑ කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සෙල් එක්ස් ආයතනයේ අයිතිකරු මට කෝල් කරලා කිවුවා කුණු එකතු කරන ගමන් ට්‍රැක්ටරේ අය සල්ලි ඉල්ලනවා කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඇහුවම රාජකාරි වෙලාවේ ගියේ නෑ කියලා කිවුවා. එතනින් එහා මම ඇහුවේ නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බටුවන්තුඩාව පාරේ අලුත්වත්ත, පරණ වත්ත, කුරුඳු වත්ත කියන ප්‍රදේශවල පවුල් 25 ක් පමණ පදිංචි වෙලා ඉන්නේ. පොඩි ඉඩම් තියෙන්නේ. කුරුඳු වත්ත මාර්ගයේ අවසානය දක්වා කසළ වාහනය යන්න අපහසුයි. ගිහිල්ලා හරව ගන්න බෑ. ඒක පිළිගන්නවා. ඒ මිනිස්සු ඉල්ලීමක් කරනවා වන්නිආරච්චි මහත්මයාලගේ ගෙදරට හැරෙන තැනට, බටුවන්තුඩාව ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 75 ක් විතර ඇතුළට ගියාම වාහනය හරවා ගන්න පුළුවන්. එම ස්ථානයට කසළ වාහනය ගෙනත් දෙන්න කියලා ඉල්ලීම් කරනවා. ඒ අදාල දිනයේදී මිනිස්සු එම ස්ථානයට කසළ ගෙනත් තියාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අලුතෙන් කසළ එකතු කරන්න තාම බෑ. ඉස්සෙල්ලත් කතා වුනා ඕක ගැන. අපි ක්‍රමවේදයකට යනකම් කසළ එකතු කිරීම අපහසුයි. ඒකට ඉක්මණින් ක්‍රමවේදයක් හදන්නම්. එතන එකතු කරොත් ආයි නොගෙන බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් සභාවට යන පාරේ කාණු දාලා තියෙනවා. පී.එච්.අයි. මහත්තයා ඇවිත් නඩු දාන්න කියලා තියෙනවා ඒ කාණුවල ඩෙංගු මදුරුවෝ ඉන්නවා කියලා. ඒකට හේතුව වෙලා තියෙන්නේ ඒ කාණුවල එකක් උසයි. එකක් පහතයි. වතුර බහින්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම බලන්නම්. ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.**

**1. පොදු ගෙවීම් :-** නැත

**2. කර්මාන්ත ගෙවීම් :-** නැත

**3. සේවක ණය ගෙවීම් :-** නැත

**III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :- 01.** ප්‍රධාන කාර්යාලයේ ලේඛනාගාරය සකස් කිරීම. රු. 260,000/-

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම්:-** නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :- 01.** එස්.ඕ.එස්. ළමා ගම්මාන පෙර පාසල බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට පවරාගෙන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව.

ඒක පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගන්න ඕන. එස්.ඕ.එස්. ළමා ගම්මානයෙන් එවලා තියෙනවා ලියුමක් මේ සම්බන්ධව ළමුන් වෙනුවෙන් වෙනත් වියදම් යටතේ වෙන් කරපු රුපියල් 50,000/- මුදල මදියි කියලා. ඒක තවදුරටත් සාකච්ඡා කරලා සංශෝධනය කර ගමු. මුදලක් අනුමත කරලා තිබුණට වැඩි වෙන්නේ නෑ. මේක යවලා අපි පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගමු.

එස්.ඕ.එස්. ළමා ගම්මානයේ පෙර පාසල බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාවට පවරා ගෙන අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා :-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.07.23 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.